1972 හා 1978 ව්‍යවස්ථා මඟින් ලංකාවේ විශාල ව්‍යසනයක් ඇති කළ බවටත්, රාජ්‍ය තන්ත්‍රය කඩාවැටීමකට ලක් වූ බවටත් පොදුවේ පිළිගත් මතයක් පවතී. එහෙත් ඒ ව්‍යසනය සිදු වීමට මේ ලේඛන හේතු වූයේ කෙසේ ද යන්න පිළිබඳ ව එතරම් පැහැදිලි කිරීමක් නැති බව පෙනී යයි. ඒ ව්‍යවස්ථා ඉවත ලා වෙනත් ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීමට උත්සාහ කරන මේ අවස්ථාවේ දී, 1972 හා 1978 ව්‍යවස්ථා මඟින් ලංකාවේ පාලන ක්‍රමය හා සමාජ ජීවිතය බරපතළ ව්‍යසනයකට පත් කිරීමට හේතු වූයේ ඒ ලේඛනවල අඩංගු කුමන කරුණු මඟින් ද යන්න ගැන මෙන් ම, ඒ ලේඛනවලින් බැහැර කරන ලද්දේ කුමන අත්‍යවශ්‍ය නෛතික ප්‍රතිපත්තීන් හා මූලධර්ම ද යන්න ගැන ද අවබෝධයක් ඇති කර ගැනීම මඟින්, නව ව්‍යවස්ථාව තුළ ඒ වැරදි පුනරුත්ථානය වීමට ඉඩ නොදීමට වග බලා ගත හැකි ය.

විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

ISBN 978-955-691-167-1

9 789556 911671

130/=

අලුත් ව්‍යවස්ථාවක් කුමටද?

නීතිඥ බැසිල් ප්‍රනාන්දු



අලුත් ව්‍යවස්ථාවක් කුමටද?

නීතිඥ බැසිල් ප්‍රනාන්දු

අලුත් ව්‍යවස්ථාවක් කුමටද?

අලුත් ව්‍යවස්ථාවක් කුමටද?

නීතිඥ බැසිල් ප්‍රනාන්දු

විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

අලුත් ව්‍යවස්ථාවක් කුමටද?

(c) නීතිඥ බැසිල් ප්‍රනාන්දු

ප්‍රථම මුද්‍රණය : 2016

ISBN - 978 - 955 - 691 - 167- 1

පිට වැස්ම : පුෂ්පානන්ද ඒකනායක

පරිගණක පිටු සැලසුම : පුෂ්පානන්ද ඒකනායක
'ද ෆොන්ට් මාස්ටර්'
45/96, නාවල පාර,
කොළඹ 05.
(12 ප්‍රමාණයේ අභය අකුරු මෝස්තරයෙනි.)

මුද්‍රණය : විජේසූරිය එන්ටර්ප්‍රයිසස්
නො. 350/2 හිඹුටාන පාර,
අංගොඩ

ප්‍රකාශනය : **විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය**
812, මරදාන පාර,
පුංචි බොරැල්ල,
දුරකථනය : 2696675

පටුන

හැඳින්වීම	07
1. අරාජකවාදය යනු කුමක් ද?	09
2. දැයක පවතින අරාජක තත්ත්වයේ සිට අරාජක තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා රාජ්‍ය සංස්ථාවල බලධාරීත්වය ඇති කිරීමෙන් ස්ථාවරත්වය කරා පැමිණීම	16
3. නව ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීමේ දී මතු වී ඇති ගැටලු	26
4. ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම ඔක්කොමගේම වැඩක්	44
5. ව්‍යවස්ථා නිර්මාණයේ දී වැළකිය යුතු ප්‍රවේශයන්	59
6. ව්‍යවස්ථාවක් මොකට ද?	67
7. අපරාධ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කර ගැනීමට බැරි නම් ව්‍යවස්ථා නීතියෙන් ඇත්තේ කුමන ඵලයක් ද?	73
8. 'යහ පාලනය දේශපාලන දහංගැටයක් ද?'	77
9. ආසියානු මානව හිමිකම් කොමිසමෙන් ප්‍රකාශයක්	87

හැඳින්වීම

මේ පොතෙහි අඩංගු ලිපි මාලාව සකස් කරන ලද්දේ දැනට ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීම සඳහා පවතින සාකච්ඡාවට දායක වීම සඳහා ය. ඒ සාකච්ඡාවට සහභාගි වන විවිධ සමාජ ක්ෂේත්‍රයන්හි නියැළෙන කණ්ඩායම් සමඟ මේ ලිපිවල එන බොහෝ කරුණු සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබිණි. ඉදිරියේ දී ව්‍යවස්ථාව පිළිබඳ ව සාකච්ඡාවේ යෙදෙන්නන්ට ද යම් මඟ පෙන්වීමක් වේ යැයි යන බලාපොරොත්තුවෙනි, මේ ලිපි පෙළ පළ කරන්නේ.

1972 හා 1978 ව්‍යවස්ථා මඟින් ලංකාවේ විශාල ව්‍යසනයක් ඇති කළ බවත්, රාජ්‍ය තන්ත්‍රය කඩාවැටීමකට ලක්වූ බවටත්, පොදුවේ පිළිගත් මතයක් පවතී. එහෙත් ඒ ව්‍යසනය සිදුවීමට මේ ලේඛන හේතු වූයේ කෙසේ ද යන්න පිළිබඳ ව එතරම් පැහැදිලි කිරීමක් නැති බව පෙනී යයි. ඒ ව්‍යවස්ථා ඉවත ලා වෙනත් ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීමට උත්සාහ කරන මේ අවස්ථාවේ දී, 1972 හා 1978 ව්‍යවස්ථා මඟින් ලංකාවේ පාලන ක්‍රමය හා සමාජ ජීවිතය බරපතළ ව්‍යසනයකට පත් කිරීමකට හේතු වූයේ ඒ ලේඛනවල අඩංගු කුමන කරුණු මඟින් ද යන්න ගැන මෙන් ම, ඒ ලේඛනවලින් බැහැර කරන ලද්දේ කුමන අත්‍යවශ්‍ය නෛතික ප්‍රතිපත්තීන් හා මූලධර්ම ද යන්න ගැන ද අවබෝධයක් ඇති කර ගැනීම මඟින්, නව ව්‍යවස්ථාව තුළ ඒ වැරදි පුනරුත්ථානය වීමට ඉඩ නොදීමට වගබලා ගත හැකි ය.

මේ පොතෙහි අඩංගු ලිපි මාලාවේ ප්‍රධාන අරමුණ නම් 1972 හා 78 ව්‍යවස්ථා මඟින් ලංකාවේ අරාජකවාදී තත්ත්වයක් නිර්මාණය කරන ලද බව පෙන්වා දීම ය. මෙයින් අදහස් කරන්නේ කුමක් ද යන්න පළමු වන පරිච්ඡේදය මඟින් විස්තර කොට ඇත. ඒ තත්ත්වය ඇතිවීමට තුඩුදුන් තත්ත්වය පිළිබඳ ව ද කෙටි සටහනක් ඒ ලිපියෙහි ම සඳහන් වේ.

දෙවන ලිපියේ අඩංගු වන්නේ අරාජකවාදී තත්ත්වයක සිට ස්ථාවර තත්ත්වයක් කරා ළඟා වීම සඳහා ව්‍යවස්ථා නීතිය තුළ කුමන වෙනසක් ඇති කළ යුතු ද යන මූලික කරුණ ය.

මෙහි තුන්වන පරිච්ඡේදයේ අඩංගු වන්නේ මාගේ මූලිකත්වයෙන් පැවති, සිවිල් සමාජයේ විවිධ සංවිධාන හා ක්‍රියාධරයන් සහභාගි වූ විවිධ වූ සාකච්ඡා වට දෙකක දී කතිකා කොට අලුත් ව්‍යවස්ථාවට අඩංගු විය යුතු ම ලෙස එකඟ වූ යෝජනා ය. මෙහි හතර වන ලිපියෙහි තේමාව වන්නේ ව්‍යවස්ථාකරණය ලංකාවේ සියලු දෙනාගේ සහභාගිත්වයෙන් පැවැත්විය යුතු වීම සහ, ඒ ව්‍යවස්ථාව නිර්මාණය කර ගැනීමේ දී වැළකිය යුතු සමහර ප්‍රවේශයන් ගැනත් ය. ඒ ලිපිය දැනටමත් 'රාවය' හා 'ඉරුදින' පුවත්පත්වල පළ වී ඇත. මෙහි එන මූලික අදහස් ජාතික රූපවාහිනී නාලිකාව මඟින් ප්‍රකාශයට පත් කරන ආයුබෝවන් වැඩසටහනේ හා වෙනත් ගුවන් විදුලි විකාශනයන්හි දී ද ප්‍රකාශයට පත් විය. 'ව්‍යවස්ථාවක් මොකටද' යන ලිපිය ද රාවය පුවත්පතේ පළ වූ ලිපියකි. 'යහ පාලනය දහංගැටයක් ද?' යන මැයින් මහාචාර්ය සරත් විජේසූරිය මහතා විසින් රචිත ලිපිය ද රාවය පුවත්පතේ පළ වූ තවත් ලිපියකි. ඒ ලිපිය මෙහි පළ කරන්නේ රාවය පුවත් පතට හා මහාචාර්ය සරත් විජේසූරිය මහතාට කෘතඥ පූර්වක ව ය.

මෙහි අවසාන ලිපිය වශයෙන් පළ වන්නේ වර්තමාන ආණ්ඩුවේ මුදල් ඇමැතිවරයා වන රවී කරුණානායක මහතා වෙත ලියන ලද ලිපියකි. ඒ ලිපිය මෙහි පළ කරන්නේ මේ ලිපි මාලාවෙහි එන ආයතන ශක්තිමත් කිරීම යන සංකල්පය කෙසේ කර ගත හැකි ද යන්න පිළිබඳ ව ප්‍රායෝගික උදාහරණයක් ඉදිරිපත් කිරීම සඳහා ය.

මා ඉහත සඳහන් කළ සාකච්ඡාවලට සහභාගි වූ සියලු දෙනාටත්, අදාළ ලිපි මීට ඉහත දී පළ කළ රාවය හා ඉරුදින පුවත්පත්වලටත් කෘතඥ වෙමි.

මේ ලිපිපෙළ සකස් කර ගැනීමට හැකි වූයේ රසික සංජීව වීරවික්‍රම නීතිඥ මහතාගෙන් ලැබුණු නොමඳ සහයෝගය නිසා ය. ඔහුට මගේ කෘතඥතාව පිරිනමමි.

නීතිඥ බැසිල් ප්‍රනාන්දු

1 පරිච්ඡේදය

අරාජකවාදය යනු කුමක් ද?

ලංකාවේ දැන් පවතින්නේ අරාජකවාදී තත්ත්වයකි. අරාජකවාදී තත්ත්වයක් යනුවෙන් හඳුන්වන්නේ, රටක විනය පවත්වා ගෙන යන මූලික සංස්ථාවන් බෙලහීන වීම මත ඒ කර්තව්‍යයන් කර ගෙන යෑමට බැරි වීම නිසා ඇති වන අපිළිවෙළ ය. ඒ අපිළිවෙළ මඟින් සියල්ල අවුල් කර දමයි. පිළිවෙළක් නැතුව ගිය සමාජ සම්බන්ධතාවන් නිසා කිසියම් ම කිසිම හෝ දෙයක් පිළිබඳ ව විශ්වාසයක් තබා ගැනීමට බැරි තත්ත්වයට ම මේ අවුල් දික්වී යයි. එක අවුල් සහගත තත්ත්වයක් තවත් අවුල් සහගත තත්ත්වයක් නිර්මාණය කිරීම ස්වභාවික තත්ත්වයකි. අරාජක සමාජය වනාහි, අවුලෙන් අවුලට යමින්, ඒවා විසඳා ගැනීමට ක්‍රමවේදයකින් තොර ව පවතින සමාජයකි.

අරාජකවාදී තත්ත්වය පැන නඟින්නේ අරාජකවාදී පාලන තන්ත්‍රයකිනි. ලංකාවේ පාලන තන්ත්‍රය ම මූලික වියවුලකින් තොර ව පැවතීමට බැරි තත්ත්වයක් ඇති වී ඇත්තේ, රටේ මූලික ස්ථාවරත්වය තබා ගැනීමට පදනම වන සංස්ථාවන් නිසි ලෙස නොපවත්වා ගැනීම නිසා, ඒවායින් ඉටු විය යුතු කාර්යයන් නොකෙරෙන නිසා ය. පාලන තන්ත්‍රයේ පිළිවෙළ පවත්වා ගෙන යන මූලික සංස්ථාවන් ඉතා බරපතළ ලෙස අකමර්ණ්‍ය වී හෝ වියවුල් වී පවතින්නේ නම්, ඒ පාලන ක්‍රමය ම අරාජකවාදී තත්ත්වයකට පත් වේ. අද පවතින්නේ ඒ අරාජක තත්ත්වයයි. ඒ අපිළිවෙළයි.

අරාජකවාදී පාලනයක් තුළින් අරාජකවාදී පරිපාලන ක්‍රමයක් නිර්මාණය කරයි. අරාජකවාදී පාලන ක්‍රමයකට අරාජකවාදී නොවන පරිපාලන ක්‍රමයක් ඇති කිරීමට බැරි ය. අද ලංකාවේ පරිපාලනය කිරීමට කැප වුණු සියලු ම සංස්ථාවල් තුළ ද ඇත්තේ ඒවායෙහි කටයුතු කර ගැනීමට බැරිතරම් වූ බෙලහීන භාවයකි. එසේ තමන්ගේ මූලික කටයුතු කර ගැනීමට බැරි වන්නා වූ බෙලහීන භාවය තුළින් ඒ සුවිශේෂ පරිපාලන සංස්ථාවන් තුළ ම

පවතින්නේ අපිළිවෙළකි. අපිළිවෙළ තුළින් ඒ සංස්ථාවල් තුළ ම වියවුල් භාවයක් ඇති කරන අතර ම, ඒ වියවුල් භාවය දිනපතා ම උග්‍ර වන්නේ ය. 'අවුලෙන් තවත් අවුල් ඇති වන බව' යන අත්දැකීම මේ සියලු ම සංස්ථාවල් තුළ ද පවතී.

පාලනයේ අරාජකවාදය තුළින් ඇති වූ පරිපාලනයේ අරාජකවාදය සමාජයේ සෑම අංශයක් පුරා ම දිව යයි. මේ නිසා ම සමාජයේ සෑම අංශයක් පුරා ම ද අරාජකවාදය පැතිරී පවතී. ඒ සමාජයේ නොයෙක් කටයුතු කිරීමට අදාළ වන්නා වූ සියලු ම සංස්ථාවන් බෙලහීන තත්ත්වයකින් පවතින හෙයින්, ඒ සමාජයේ කෙරෙන සියලු ම කටයුතුවලට ආධාරක වූ පාලන හා පරිපාලන සංස්ථාවන්ට ඒවායින් ඉටු කිරීමට ඇති යුතුකම කිරීමට බැරිව යයි. මෙසේ වියවුල් වූ සමාජය තුළ ඇති වුණු වියවුල් තුළින් ම තවත් වියවුල් භාවයන් ඇති වේ. අවුලෙන් අවුල තවත් අවුල් ඇති කරන බව මෙහි දී ද කැපී පෙනෙන්නට ඇත.

පාලන තන්ත්‍රයේත්, පරිපාලන තන්ත්‍රයේත්, සමාජයේත් පැතිර පවතින්නා වූ අරාජක භාවය ඒ සමාජයේ ජීවත් වන සියලු ම දෙනා කෙරෙහි කෙළින් ම බලපායි. කිසියම් හෝ පුද්ගලයෙකුට ඔහුට සමාජය තුළ දී කර ගත යුතු වන්නා වූ ක්‍රියාවන් කරවා ගැනීමට ඉදිරිපත් වන සෑම අවස්ථාවක දී ම රටේ මූලික ආයතනයන් තුළ පවතින අවුල් භාවයට මුහුණ දීමට සිදු වේ. ඒවා තුළින් ඒ පුද්ගලයා බලාපොරොත්තු වන සේවය ලබා ගැනීමට නොහැකි වේ. මේ ආකාරයෙන් පුද්ගලයන් තුළ ද මේ සමාජ ක්‍රමය නිසා ඇතිවන්නේ අරාජකවාදී පැවැත්මක් හා අරාජකවාදී මානසික තත්ත්වයකි. පුද්ගල ජීවිතය ම පිළිවෙළින් තොර එකක් බවට පත් වේ. එය අවුල් සහගත වේ. මේ අනුව අවුලෙන් අවුල තවත් දිග්ගැස්සෙන බව යන මූලික අත්දැකීම පුද්ගල ජීවිතය තුළට ද ඇතුළු වේ.

අපිළිවෙළ පාලන තන්ත්‍රය තුළත්, පරිපාලන තන්ත්‍රය තුළත්, පරිපාලන තන්ත්‍රයේ සියලු ම සංස්ථා තුළත්, ඒ මඟින් සමාජය තුළත්, ඒ මඟින් පුද්ගලයා තුළත්, පැතිරෙන්නට වූ පසු, සාමාන්‍ය බුද්ධිගෝචර ආකාරයකට ජීවත්වීමේ හැකියාව සියල්ලට ම අහිමි වේ. එවැනි තත්ත්වයක් ඇති වූ විට බොහෝ විට තමන්ට අවශ්‍ය දේවල් කර ගැනීම සඳහා සමහරුන් යොමුවන්නේ සමාජ විරෝධී ආකාරයන්ට ය. මේ සමාජ විරෝධී ආකාරයන්,

නීත්‍යනුකූල නොවන ආකාරයන් ලෙස ද සඳහන් කළ හැකි ය. නීති විරෝධී ව තමන්ගේ උවමනාවන් ඉෂ්ට කර ගැනීමේ පුරුද්දක් රටේ සියලු ම අංශයන් තුළ, පාලන ක්ෂේත්‍රය තුළ, සමාජය තුළ හා පෞද්ගලික ජීවිතය තුළ ද පැතිරෙන්නට පටන් ගනී. මෙයින් ඇති වන්නේ මූලික ව ම නීතිය නොතකන සමාජයකි. නීතිය තකා වැඩ කිරීමට බැරි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ පරිපාලන තන්ත්‍රයේ, සමාජයේ හා පෞද්ගලික ජීවිතයේ ද ඇති වී ඇති කඩාවැටීම නිසා ය.

මෙසේ නීති විරෝධී භාවය සාමාන්‍ය දෙයක් ලෙස සලකන්නට පටන් ගත්තාට පසු ඒ සමාජය තුළ ඕනෑ ම ආකාරයක අපරාධ සිදුවන්නට පුළුවන. මහා පරිමාණ මූල්‍ය අපරාධ ඇති වන්නේ ද මේ අරාජකවාදී වාතාවරණය තුළ ය. මහා පරිමාණ මූල්‍ය වංචා සිදු කිරීම සඳහා පාවිච්චි වන්නේ ද පාලන තන්ත්‍රය හා පරිපාලන තන්ත්‍රයයි. මේ අනුව රාජ්‍යය යන්න එනම්, රාජ්‍ය පාලනය හා පරිපාලනයම නීති විරෝධී වැඩකටයුතු කිරීම සඳහා යොදා ගන්නා වූ පාලන හා පරිපාලන ක්ෂේත්‍රයක් බවට පත් වේ. මෙසේ පත් වූ පසු මේ සියල්ල කෙරෙහි විශ්වාසය මිනිසුන් කෙරෙන් බිඳී යයි. එසේ බිඳී යෑම ද නැවත වරක් තුඩුදෙන්නේ, නීති විරෝධී භාවය වඩාත් පළල් කිරීමට හා වඩාත් ගැඹුරින් ම සෑම අංශයක් කරා ම පැතිර වීම ය. ලංකාව අද පත් ව ඇති තත්ත්වය මෙයයි. නීති විරෝධී භාවයට ඇති ඉඩකඩ වැඩි වන තරමට ඒ නීති විරෝධී කණ්ඩායම් ම ඔවුන්ගේ බලය වැඩි කර ගැනීම සඳහා සංවිධානය වීමට පටන් ගනී. මෙය සිදු වූ විට නීති විරෝධී ආකාරයෙන් කටයුතු කරන්නන්ගේ බලය වැඩි වීම නිසා පාලන තන්ත්‍රය හා පරිපාලන තන්ත්‍රය තවදුරටත් අරාජක භාවයට පත් වේ. නීත්‍යනුකූල රජයකට නීත්‍යනුකූල කාර්යයක් කර ගැනීමට බැරිවන තරමට නීති විරෝධී වූවන්ගේ ශක්තිය වර්ධනය වීම නිසා බලය පිළිබඳ ව ඉතා විශාල අර්බුදයක් ඒ රට තුළ ඇති වේ. මහජනයාට යහපත් වන්නා වූ යම් ක්‍රියාවක් කිරීමට යම් අවස්ථාවක දී පාලනයේ සිටින බලධාරීන් උත්සාහයක් කළහොත් ඒ උත්සාහය පරාජය කිරීම සඳහා ඇතිවන්නා නීති විරෝධී අයගේ බලය වැඩි කම නිසා එය කර ගැනීමට බැරි වේ. පාලන තන්ත්‍රයේ පවතින අඩුපාඩු ම පාවිච්චි කරමින් හා පරිපාලන අංශයේ ඇති අඩුපාඩු ම පාවිච්චි කරමින් හා සමාජ ක්ෂේත්‍රයේ

ඇති අඩුපාඩු මෙන් ම පුද්ගලයාගේ මානසික ක්ෂේත්‍රයේ ඇති අඩුපාඩු ම පාවිච්චි කරමින් නීති විරෝධී කණ්ඩායම් ඔවුන්ගේ බලය පතුරුවා ගනී. මේ තත්ත්වය ඇති වූ පසු ඇතිවන්නේ අරාජකවාදයේ ව්‍යාධිය සුව කළ නොහැකි තත්ත්වයකට පත් වීම ය. අද ලංකාව තුළ අප දකින්නේ එවැනි විශාල අර්බුදයකි.

ලංකාව තුළ අරාජකවාදය ඇති වූ ආකාරය ගැන කෙටි සටහනක්

1948 පෙබරවාරි මස 04 වන දින බිහි වූයේ ළදරු වියේ පසුවන රාජ්‍යයකි. ස්වාධීන රාජ්‍යයක් ලෙස ලංකාව උපත ලැබූයේ එදා ය. ඉන් පෙර රට පාලනය කළේ බ්‍රිතාන්‍ය පාලකයන් ය. ඔවුන්ගේ රටේ පාලනය පිළිබඳ ව පැවති පළපුරුදුවලට අනුව අග්‍රාණ්ඩුකාරවරයාගේ හා වෙනත් නිලධාරීන්ගේ ආරක්ෂාව සලසා ගැනීමට ඔවුහු දැන සිටියහ. එහෙත් ලංකාවේ ළදරු රාජ්‍යයේ පාලකයන් වූ ඇත්තෝ එවැනි පාලක අත්දැකීම් ඇත්තෝ නොවූහ. කවුරුන් වුවත් අත්දැකීම් ලබන්නේ යම් කාර්යයක් කිරීමට පටන් ගත්තාට පසු ව ය. රාජ්‍ය පාලන කාර්යය ලංකාවේ පටන් ගන්නේ ඒ පළ වන නිදහස් දා ය.

අලුතෙන් පත් වූ පාලකයන්ගේ අවදානය බොහෝ දුරට යොමු වූයේ ආර්ථික සංවර්ධනය හා යම් සහන මහජනතාවට ලබා දීම යන කරුණුවලට ය. සමහර අගමැතිවරු රටේ කෘෂිකර්මය දියුණු කළා නම් විශාල සමෘද්ධියක් ඇති කළ හැකිය යන අදහස යටතේ ඒ දිශාවට ගමන් කරන ලදි. තවත් සමහරු රටේ වාරිමාර්ගවල වෙනස්කම් ඇති කළහොත් දැනට වගාවට බාධා ඇති පළාත්වල පවා වගාව දියුණු කරමින් රටේ ආහාර හා වෙනත් සම්පත් ඇති කළ හැකි යයි සිතූහ. තවත් සමහරුන් රටේ වාණිජ්‍යය දියුණු කිරීම, රට රටවල් අතර ඇති සම්බන්ධය වැඩිදියුණු කිරීම කරා යොමු වූහ. තවත් සමහරු රටේ අපනයන දියුණු කර වැඩි විදේශ විනිමයක් ලබා ගැනීම ගැන යොමු වූහ. තවත් අය රටේ සුළු කර්මාන්ත දියුණු කළ යුතුය යන අදහසින් යම් පියවර ගන්නා ලදි. රට තුළ ඇති මූල්‍ය හා වෙනත් සම්පත් ආරක්ෂා කර ගැනීමත්, ඒ මඟින් රට තුළ ඇති ප්‍රාග්ධනය වැඩි දියුණු කර ගැනීමත් සඳහා ද, සමහර පාලකයන් උත්සාහ කරන

ලදි. රටේ වාණිජ ක්ෂේත්‍රය වර්ධනය කර ගැනීම, ඒ සඳහා ආයතන දියුණු කිරීම හා ඊට අදාළ ව නීති සම්පාදනය කර ගැනීම ආදියට ද සමහරු යොමු වූහ. මේ සියල්ල ම ඉතාමත් අනගි පරමාර්ථන් ය.

එහෙත් මේ සියල්ල කරගත හැකිවන්නේ රටේ රාජ්‍ය තන්ත්‍රයට අදාළ වන මූලික ආයතන ඉතා හොඳින් ක්‍රියාත්මක වන තරමට ය. එසේ නොවූ කල රට තුළ ඇති වන අරාජකතාව හා ප්‍රචණ්ඩත්වය, අන් සියල්ල අබිබවා පැන නැඟී රටේ සියලු ම අරමුණු පස්සට ඇද දමයි. මෙවැනි කාලපරිච්ඡේදයක් ඔස්සේ අපි අවුරුදු හතළිහකට වැඩි කාලයක් ගත කර ඇත්තෙමු. එහි රුදුරු භාවය, මා ඔබට විස්තර කළ යුතු වන්නේ නැත.

රාජ්‍ය තන්ත්‍රයට අදාළ ප්‍රධාන සංස්ථා වනාහි රාජ්‍යයකට ගමන් කළ හැකි වාහනය වේ. හොඳින් ගමන් කළ හැකි වාහනයකින් තොර ව කොපමණ හොඳ ගමනක් යෑම පිළිබඳ ව සිහින දැක්කත් ඒ සිහිනය සඵල කර ගත නොහැකි බව, අපේ රටේ අත්දැකීම් තුළින් අප දැක ඇත්තෙමු. වාහනයෙහි ඇන්ජිම විනාශ වී ඇත්නම්, එහි රෝද විනාශ වී ඇත්නම් සිදුවන්නේ එක තැන පල් වීම පමණකි. ගමන යෑමට නම් වාහනය අලුත්වැඩියා කොට අවශ්‍ය සියලු අංගයන් ඒ වාහනයට ලබා දී තමන්ගේ ගමන යා හැකි වාහනයක් තමන්ට ඇති බව පිළිබඳ විශ්වාසයක් තමන්ට ඇති කර ගත යුතු ය.

අපේ රාජ්‍ය තන්ත්‍රයේ අබලන් වී ඇති තැන් මොනවා ද? ඒවා එසේ අබලන් වූයේ කෙසේ ද? රජයේ නීතිය ක්‍රියාත්මක කිරීමේ මූලික හස්තය වන අපේ පොලිස් සේවය ඉතා ම අබලන් තත්ත්වයකට පත් ව ඇති බව දැන් දශක දෙකක පමණ කාලයක තුළ රට පුරා ම සාකච්ඡා වී ඇත. සාමාන්‍ය පොලිස් ස්ථාන තුළ රාජකාරි නිසි ලෙස ක්‍රියාකාරී කර ගැනීම සඳහා අවශ්‍ය දැනීම, පුහුණුව හා නිපුණතාව නොපවතින බව නිතර නිතර ම මාධ්‍යයෙන් වාර්තා වේ. මා මෙහි දී සිද්ධීන් ගැන සඳහන් නොකරන්නේ, එසේ කිරීමට පටන් ගතහොත් ඒ සිද්ධීන් වැල කොච්චර දිග ද යත් එය මෙවැනි සුළු කාලයක දී කරන කථාවක දී පමණක් නොව, ඊට දීර්ඝ කාලයක දී ද අවසන් කිරීමට බැරි වනු ඇත. මේ තත්ත්වය ගැන වගතුග විමසන විට නිලධාරීන් ප්‍රකාශ කර සිටින්නේ ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා

දීමටවත්, අවශ්‍ය මූලාශ්‍ර සපයා දීමටවත්, අවශ්‍ය තාක්‍ෂණය ලබා දීමටවත්, සැලකිය යුතු ආකාරයක වේතනයක් ලබා දීමට මුදල් වෙන් කිරීමටවත්, මේ දක්වා තිබූ රජයන් අසමත් වූ බව ය. මේ නිසා පැමිණිල්ලක් කිරීමට පොලිස් ස්ථානයකට යන ජනතාව ඒ නිසා ඇති වන විවිධ දුක් ගැහැට ගැන නිතර ම මැසිවිලි කියති. කටඋත්තරයක් ලියා ගැනීම සඳහා පමණක් නොව, ඒ කටඋත්තර නිසි ලෙස සටහන් කොට පොත පත නිසි ලෙස තබා ගැනීම ගැන පවා මහජන විශ්වාසය බිඳී ඇත. අපරාධ පරීක්‍ෂණ කෙරෙන්නේ ඉතාමත් පසුගාමී ආකාරයකින් වන අතර, වැඩි දක්‍ෂකමකින් මේවා කෙරෙන්නේ රහස් පොලීසිය වැනි ඉහළ මට්ටමේ පොලිස් සේවාවන් තුළින් පමණ ය. අහිංසක මිනිස්සුන්ට වදහිංසා කිරීම මහා පරිමාණව කෙරෙන බව වාර්තා වී ඇති අතර, එවැනි වාර්තාවලින් සමන්විත ලොකු පොත් පවා නිකුත් වී ඇත.

දෙවැනි අබලන් ආයතනය ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුවයි. ඒ දෙපාර්තමේන්තුවේ වැඩ කිරීමට අවශ්‍ය නීතිඥවරුන්ගේ ප්‍රමාණයෙන් 50% වත් ලැබී නැති බව දැන් ප්‍රසිද්ධියේ ම සාකච්ඡා වේ. රටේ පවතින නඩු ඇසීම පමා වීමේ එක් ප්‍රධාන හේතුවක් නම් නඩු මෙහෙයවීමේ කටයුතු කරන රජයේ නීතිඥයන්ගේ වැඩ ප්‍රමාණය, ඔවුන් විසින් මෙහෙයවිය යුතු නඩු ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වී තිබීම ය. අපරාධ නඩු මෙහෙයවීමේ කාර්යය වනාහි, රාජ්‍ය තන්ත්‍රය විසින් කරනු ලබන යුතුකම් අතර ඉතාමත් ප්‍රධාන එකකි. එහි අසාර්ථකත්වය සමාජය පුරා අධෛර්යයක් හා අවිශ්වාසයක් ජනනය කරයි.

රාජ්‍ය තන්ත්‍රයක ඉතා ප්‍රබල ම හස්තයක් වන්නේ අධිකරණයයි. ස්වාධීන අධිකරණය වනාහි ප්‍රජාවකගේ ආරක්‍ෂාව සඳහා පවතින ඉහළ ම ස්ථානයයි. එහෙත් ඒ ස්ථානය විශාල අඩුපාඩුවලින් පිරී තිබෙන බව අද මහජන සාකච්ඡාවේ කොටසක් බවට පත් වී ඇත. විනිශ්චකාරවරුන්ගේ නිපුණතාව, බලපෑම්වලින් තොර ව වැඩ කිරීමට ඔවුන්ට ඇති වාතාවරණයේ ඔවුන්ට ඇති ගැටලු, ආයතනයක් වශයෙන් පැවතීමට අවශ්‍ය ගොඩනැඟිලි කාර්යාල සේවකයන් ආදි පහසුකම්වල ඇති විශාල අඩුපාඩුකම්, තාක්‍ෂණ පහසුකම් අධිකරණවලට ලබා නොදීම මෙන් ම ඒ පහසුකම් පාවිච්චි කිරීමට තරම් වන පුහුණුවක්

බොහෝ විනිශ්චකාරවරුන්ට මෙන් ම කාර්යාල සේවකයන්ට ලබා නොදීම ආදිය නිසා යල් පැන ගිය ආයතනික පැවැත්මක් තිබීම සමහර විවේචනයන් ය. එහෙත් මේ සියල්ලට ම වඩා ප්‍රබල විවේචනය නම් රටපුරා නඩු ඇසීම ඉතා විශාල වශයෙන් පමා වීම ය. බරපතළ අපරාධ නඩු ඇසීමට පවා අවුරුදු 10-15 කාලයක් ගත වේ.

මෙය කාලය පමා වීම පිළිබඳ ප්‍රශ්නයක් පමණක් නොවේ. අධිකරණ ක්‍රියාමාර්ගය තුළින්, අපරාධකරුවන්ට දඬුවම් දීම තුළින් අපරාධ වැළැක්වීමට ඇති හැකියාව මේ විශාල පමාවීම් නිසා ඉතාමත් දුර්වල වී ඇත. බරපතළ අපරාධයක් කරන්නෙක් අවුරුදු 10-15 ක් නිදැල්ලේ හැසිරේ. ඒවා දකින රටවැසියා තුළ අපරාධයට ඉක්මනින් දඬුවම් කිරීමේ හැකියාව රජයට නොමැතිය යන අදහස පැතිරේ. මෙය භයානක ප්‍රතිඵල දිය හැකි මානසික තත්ත්වයකි.

සමාජයට අත්‍යවශ්‍ය තවත් ආයතනයක් නම් රටේ දූෂණ මර්දන ආයතනයයි. මේ සඳහා පවතින ආයතනය තුළින් යම් සේවයක් කෙරෙතත් ඔවුන් අත පැවරී ඇති මහා පරිමාණ කර්තව්‍යය ඉෂ්ට කිරීමට තරම් ආයතනික ශක්තියක් මේ සංස්ථාව තුළ නැති බව කවුරුත් දනිති. ඒ දැනීම නිසා ප්‍රජාව තුළ විශාල අධෛර්යමත් වීමක් හා අඳුරක් පවතී. ලෝකයේ සාර්ථක ව දූෂණය මර්දනය කරන රටවල් තුළ ප්‍රජාව තුළ, ඉතාමත් සාධනීය මානසික තත්ත්වයක් පවතින බව නොරහසකි. ඒ සාධනීය තත්ත්වය නිසා ම ආර්ථිකය මෙන් ම සමාජ ජීවිතය ද විශාල දියුණුවක් ලබයි.

ඉහත සඳහන් කරන ලද්දේ නීතිය රැකීම හා යුක්තිය ඉටු කිරීමට අදාළ ප්‍රධාන සංස්ථා හතරක් ගැන ය. වෙනත් සංස්ථා ගැන ද සඳහන් කළ හැකි නමුත්, මේ ලිපියෙහි මේ අවස්ථාවේ දී මේ සංස්ථා ගැන අවධානය යොමුකරන්නේ රට අද මුහුණ දෙන අරාජක තත්ත්වය ඇති වී තිබෙන්නේ මේ සංස්ථාවන්ට නිසි ලෙස ක්‍රියා කිරීමට නොහැකි වී තිබීම නිසාත්, අනාගතයේ යම් වෙනසක් වේ නම් ඒ වෙනස පටන් ගත යුතු වන්නේ මේ ආයතන තුළින් නිසාත් ය.

තාමත් ඉතා ළදරු තත්ත්වයක පසුවෙන ලාංකීය රාජ්‍යය වැඩි වියට පත් වනු ඇත්තේ මේ ප්‍රධාන සංස්ථා, ප්‍රජාව විසින් සාධනීයව පිළිගැනීමට හැකි තත්ත්වයකට පත් වූ දිනයක ය.

2 පරිච්ඡේදය

දූයක පවතින අරාජක තත්ත්වයේ සිට අරාජක තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා රාජ්‍ය සංස්ථාවල බලධාරීත්වය ඇති කිරීමෙන් ස්ථාවරත්වය කරා පැමිණීම

දූනට පවතින අරාජක තත්ත්වයෙන් මිදීමට හැකි තරමට රාජ්‍ය සංස්ථා ක්‍රියාත්මක වීම ශක්තිමත් කොට ස්ථාවර දූයක් ගොඩනැඟිය හැකි ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීම. 1971 කැරැල්ල හා එය මර්දනය කළ ස්වභාවයෙන් පටන් ගෙන අඛණ්ඩ ව පැවතීගෙන එන අවුරුදු හතළිහක කාලපරිච්ඡේදය තුළ ලංකාවේ සිදු වූ සමස්ත ක්‍රියාවලිය තුළින් රට පුරා නිර්මාණය කරන ලද්දේ අරාජක තත්ත්වයකි. ශබ්දකෝෂයන්හි ඇති නිර්වචනයට අනුව අරාජක භාවය යනුවෙන් අදහස් කරන්නේ බලධාරීත්වයක් හෝ වෙනත් පාලන ව්‍යුහයක් නැති කමින් හෝ නීතිය මත ක්‍රියා කරන සංස්ථාවහි බලධාරීත්වය නැති වී යෑම හා/හෝ ඒ බලධාරීත්වය නොතකා හැරීම නිසා ඇති වූ අපිළිවෙළකි. පසුගිය දශකයන්ගේ සිදුවීම් තුළින් ලංකාවේ සියලු ම රාජ්‍ය සංස්ථාවන්හි බලධාරීත්වය නැති වී හෝ විශාල වශයෙන් හීන වී ගොස් ඇත. ඇත්තෙන් ම ඒ සංස්ථාවන් නොසලකා හැරීම හා නොතකා හැරීම නිසා ඒවායෙහි බලධාරීත්වය නැති වී ගියේ ය. ඒ තුළින් ඇති වූ අපිළිවෙළ සමස්ත සමාජ ව්‍යුහය කෙරෙහි විසිරී පැතිරී පවතී. එසේ පැවතීම වනාහී අරාජක තත්ත්වයකි.

2015 ජනවාරි 08 වන දා හා අගෝස්තු 11 වන දා මැතිවරණවල දී ඇති වූ දේශපාලන වෙනස්කම තුළින් මේ අරාජකවාදය නැති කර ගැනීම සඳහා ඉඩකඩ විවෘත වී ඇත. එහෙත් රජයේ සංස්ථාවල තිබිය යුතු බලධාරීත්වය නැති වී යෑම තුළින් ඇති වුණු අපිළිවෙළ ඒ මැතිවරණ ජයග්‍රහණ තුළින් අහෝසි වූයේ නැත. එසේ වීමට ද බැරි ය. රජයේ සංස්ථාවල නැති වූ බලධාරීත්වය ඇති කළ හැක්කේ ඒ සඳහා හිතාමතා ගත

යුතු ක්‍රියාවලියක් තුළිනි. එවැනි ක්‍රියාවලියක් ඇති කිරීම පිළිබඳ ව යම් පමණක සාකච්ඡාවක් ඇති වී ඇති නමුත්, ඒ සාකච්ඡාව මේ දක්වා රාජ්‍ය සංස්ථාවන්හි අරාජක භාවය අහෝසි කිරීම සඳහා ගත යුතු ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගැනීම සඳහා හෝ එවැනි ක්‍රියාවලියක අත්‍යවශ්‍ය පියවර මොනවා දැයි හඳුනා ගැනීම තරම දක්වා වත් වර්ධනය වී නැත. එවැනි තත්ත්වයක් වර්ධනය කිරීමට ගන්නා උත්සාහයේ දී අනිවාර්යයෙන් ම සලකා බැලිය යුතු පියවර ගණනාවක් සාකච්ඡා කිරීම මේ ලිපියේ අරමුණ වන අතර, ඒ පියවර ඉක්මන් කර ගැනීම සඳහා දූනට 1978 ලංකාවේ ව්‍යවස්ථාව ඉවත් කොට නව ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීම සඳහා ඇති වෙමින් පවතින අවස්ථාව මහඟු ප්‍රතිඵල නෙළා ගත හැකි අවස්ථාවක් සේ සලකා රාජ්‍ය සංස්ථාවන්හි බලධාරීත්වය ඇති කිරීම සඳහා ගත යුතු පියවර ඉස්මත්තට ගෙන ඒම සඳහා ව්‍යවස්ථාව පිළිබඳ ව සාකච්ඡාව උපයෝගි කර ගන්නේ කෙසේ ද යන අරමුණ ඔස්සේ මේ ලිපියේ සංකල්පනා එතී ඇත.

දූයක රාජ්‍ය සංස්ථාවන්හි බලධාරීත්වය නැති කර දමන ව්‍යවස්ථාවක හා ඊට හාත්පසින් වෙනස්ව ඒ බලධාරීත්වය ඇති කිරීමට නෛතික පදනමක් සලසන ව්‍යවස්ථාවක ඇති වෙනස්කම්

රාජ්‍ය සංස්ථාවල බලධාරීත්වය නැති කළ ව්‍යවස්ථාවක උදාහරණයක් වශයෙන් 1978 ඇති කරන ලද ජනරජ ව්‍යවස්ථාව එක් අතකිනුත් අනෙක් අතින් ඒ බලධාරීත්වය පවත්වා ගෙන යෑමට නෛතික රටාව පැවති ව්‍යවස්ථාවක් සේ 1948 සෝල්බරි ව්‍යවස්ථාව උදාහරණයක් වශයෙනුත් ගෙන ඉහත නම් කරන ලද කරුණ සාක්ෂාත් කර ගැනීමට උත්සාහයක් කළ හැකි ය. (මෙයින් අදහස් කරන්නේ අනාගත ව්‍යවස්ථාවක පරමාදර්ශය ලෙස සෝල්බරි ව්‍යවස්ථාව සැලකීම නොවේ. ඒ නිසාවටම වඩා සාර්ථක ව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක සංස්ථා බලගැන්වුණු වෙනත් ව්‍යවස්ථාවන් වෙතද මෙහි දී විටින් විට අවධානය යොමු කරනු ඇත.)

1978 ජනරජ ව්‍යවස්ථාව හා 48 සෝල්බරි ව්‍යවස්ථාව අතර රාජ්‍ය තන්ත්‍රයේ ව්‍යුහය සම්බන්ධයෙන් ඇති මූලික වෙනස්කම්

- සෝල්බරි ව්‍යවස්ථාව හිටපු බ්‍රිතාන්‍ය පාලකයන් විසින් සකස් කරනු ලදුව ඉදිරිපත් කරන ලද්දකි. ඒ නිසා එය ලාංකීයයවම නිර්මාණය නොකරන ලද්දකැයි යන අදහස 1972 ව්‍යවස්ථාව නිර්මාණය කිරීමට හේතුව වශයෙන් දක්වන ලදි. ඒ අදහස ම 1978 ව්‍යවස්ථාව තුළට ද ගැබ් කරන ලදි. මේ අනුව 1972 හා 1978 ව්‍යවස්ථාවන් ජනරජ ව්‍යවස්ථාවන් වශයෙන් නම් කරන ලදි. එහෙත් ඇත්තෙන්ම මේ අංශයෙන් එනම් සමූහාණ්ඩුව හා ජනරජ සංකල්පය (republic) සෝල්බරි ව්‍යවස්ථාව හා 72 හා 78 ව්‍යවස්ථා අතර සැබෑ වෙනසක් නැත. සෝල්බරි ව්‍යවස්ථාව ද නිර්මාණය වී ඇත්තේ ප්‍රංශ විප්ලවයෙන් පටන් ගත් සමූහාණ්ඩු හා ජනරජ සංකල්පය මත ය. එනම් රාජාණ්ඩු සංකල්පය අංග සම්පූර්ණව බැහැර කිරීම මත ය. එහෙත් ජනරජ ව්‍යවස්ථාවක් වශයෙන් නම් කරන ලද 1978 ව්‍යවස්ථාව රාජාණ්ඩු බලතල විධායකයට ලබා ගැනීම සඳහා යොදා ගැනීමේ උත්සාහය 1978 සිට 2015 ජනවාරිය දක්වා කාලය තුළ අඛණ්ඩ ව ගෙන යන ලදි. විධායක ජනාධිපති ක්‍රමය මඟින් රාජාණ්ඩුව රජුට හිමි ව තිබූ බලතලවලට බොහෝ සේ සමාන වූ බලතල විධායක ජනාධිපතිවරයා වෙත පවරා ගන්නා ලදි. ඒ බලතල වඩාත් පළල් කර ගැනීමේ උත්සාහය අඛණ්ඩ ව 18 වන සංශෝධනය දක්වා ම ගෙන යන ලදි. මේ අනුව සෝල්බරි ව්‍යවස්ථාව සමූහාණ්ඩු හා ජනරජ සංකල්පයට වඩාත් සමීප අතර, 1978 ව්‍යවස්ථාව ජනරජ සංකල්පය යටපත් කිරීම අරබයා කරන ලද ප්‍රයත්නයක් විය. මේ අනුව සියලු ම ප්‍රජාතන්ත්‍රවාදී සංස්ථා තුළට මේ වෙනස බලපාන ලදි. මේ අනුව විශේෂයෙන් ම පාර්ලිමේන්තුව හා අධිකරණය අඩු බල ඇති සංස්ථා බවට පත් විය. විධායක ජනාධිපතිවරයාගේ අණසක අන් සියලු සංස්ථාවන්ට පැවරීම මඟින් ඒවායේ බලධාරීත්වයට අත්‍යවශ්‍ය වන්නා වූ ස්වාධීනත්වය නැති වී ඒවා දේශපාලනීයකරණය කිරීම සිදු කරන ලදි.

- සෝල්බරි ව්‍යවස්ථාව ප්‍රංශ, බ්‍රිතාන්‍ය, ඇමරිකානු ආදි ප්‍රජාතන්ත්‍රවාදී විප්ලව මඟින් ස්ථාවර කරනු ලද්දා වූ නිදහස (liberty), සමානාත්මතාව (equality) හා සහෝදරත්වය (fraternity) යන ප්‍රධාන සංකල්පයන් මත පිහිටා ඇත. ඒ ව්‍යවස්ථාව පැවති කාලය තුළ එය අර්ථකථනය කිරීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණය හා ප්‍රිවි කවුන්සලය යන ඉහළ ම අධිකරණයන් තුළ දී මේ සංකල්පයන් ගරු කිරීම සිදු විය. විශේෂයෙන් ම සෝල්බරි ව්‍යවස්ථාවේ 29 (1) යන වගන්තිය සුළු ජාතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ම සුවිශේෂයෙන් ම යෙදී තිබිණ. එහෙත් 1978 ව්‍යවස්ථාව තුළ නිදහස යන සංකල්පයත් සහෝදරත්වය යන සංකල්පයත් මුළුමනින් ම මෙන් නොතකා හැර තිබූ අතර, සමානාත්මතාව පිළිබඳ සංකල්පය සඳහන් ව තිබූ නමුත්, එහි දී සුළු ජාතිකයන්ට ඒ සමානාත්මතාව අංග සම්පූර්ණව හිමි වන සේ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සලසා නොතිබිණ. 1978 ව්‍යවස්ථාවෙන් පසු නිර්මාණය වූ කාලය සුළු ජාතීන්ට මහත් සේ හිරිහැර කිරීම සඳහා රාජ්‍ය බලය යොදා ගන්නා ලද කාලයක් සේ ඓතිහාසික ව සටහන් වී ඇත.

- සෝල්බරි ව්‍යවස්ථාව සංවරණ හා තුලනය ඇති කිරීම සඳහා බලය බෙදීමේ න්‍යාය එනම් ව්‍යවස්ථාදායක බලය, විධායක බලය හා අධිකරණ බලය වෙන් කොට හඳුනා ගැනීම ව්‍යවස්ථාගත කරන ලදි. මේ තත්ත්වය රජයේ සියලු ම සංස්ථාවන් තුළ බලධාරීත්වය ඇති කිරීම සඳහා අවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී පදනම සපයා දෙන ලදි. එහෙත් 1978 ජනරජ ව්‍යස්ථාව, විධායක බලය, ව්‍යස්ථාදායක හා අධිකරණ බලයට ඉහළින් ඔසවා තබා, බලය බෙදීමේ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතිපත්තිය යටපත් කරන ලදි. ඒ හේතුවෙන් රජයේ සියලු ම සංස්ථාවල බලධාරීත්වයට බරපතළ හානිකර තත්ත්වයක් උදා කරන

ලදි. මේ තත්ත්වය 1978 සිට 2015 අතර දීර්ඝ කාලය තුළ ක්‍රියාත්මක වීම මගින් බලය බෙදීමේ න්‍යායය නොතකාහරින තත්ත්වයක් උදා වූ අතර, ඒ හේතුවෙන් සංවරණ හා තුලනය පිළිබඳ මේ තුන් බලයන් අතර පැවතිය යුතු සම්බන්ධය එසේ ම යටපත් කර දමන ලදි.

▲ බලය බෙදීමේ න්‍යාය තහවුරු වීම සඳහා අධිකරණයේ ස්වාධීනත්වය සෝල්බරි ව්‍යවස්ථාව තුළ පැවති ව්‍යවස්ථාමය මූලෝපායක් වූ අතර, ඒ ස්වාධීනත්වය ප්‍රකාශයට පත් කිරීම සඳහා අධිකරණමය විමර්ශනය යන බලය අංග සම්පූර්ණව ව්‍යවස්ථාගත කොට පැවතිණ. එහෙත් අධිකරණමය විමර්ශනය යන සියලු ම ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවන්හි දී අඩංගු ප්‍රතිපත්තිය මුළුමනින් ම මෙන් නොතකා හරිමින් පනතක ව්‍යවස්ථාමය භාවය සලකා බැලීම පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවෙන් සම්මත වීමට පෙර සුළු කාලයක් ඇතුළත දී පමණක් කිරීමට ඉඩ සලසා ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායෙන් බරපතළ ව අයින් විය. අධිකරණමය විමර්ශනය පිළිබඳ බලය ඉතා සුළු කාලයකට සීමා කිරීම තුළින් අධිකරණයේ ස්වාධීනත්වය විශාල වශයෙන් අර්ථශූන්‍ය දෙයක් බවට පත් කරන ලදි. මෙහි ප්‍රතිඵලය වූයේ අධිකරණය, විධායකයට හා ව්‍යවස්ථාදායකයට සමාන බලසංස්ථාවක මට්ටමින් ඉවත් වී අඩු මට්ටමෙන් සැලකිල්ලට භාජනය වන සංස්ථාවක් බවට පත් කිරීම ය. මෙහි ප්‍රතිඵලය වූයේ සියලු ම රාජ්‍ය සංස්ථාවල් තුළ ඇති බලධාරීත්වය අතිශයින් හීන කර දැමීම ය.

▲ සෝල්බරි ව්‍යවස්ථාව, නීතිය මත පාලනය හා නීතියේ ආධිපත්‍යය ව්‍යවස්ථාවේ හරය තුළ ම පිහිටුවාලන ලදි. එහෙත් 1978 ව්‍යවස්ථාවේ ප්‍රතිඵලය වූයේ නීතිය මත පාලනය හා නීතියේ ආධිපත්‍යය යන මූලධර්ම විතැන් කොට දැමීම ය. ඇත්තෙන් ම ඒ තුළින් ඇති වූයේ නීතිය පිළිබඳ ව ම විශාල බාල්දු කිරීමක් ඇති කිරීම ය. නීතිය හෝ අවනීතිය නිර්ණය කිරීම විධායක

ජනාධිපතිවරයාගේ ම කාර්යයක් බවට පත් වූ අතර, විශේෂයෙන් ම හදිසි නීති හා ත්‍රස්තවාදී විරෝධී නීති ඇති කිරීම මගින් ජනාධිපතිවරයාට සාමාන්‍ය නීතිය යටතේ නීති විරෝධී වන ක්‍රියා, නීත්‍යනුකූල ක්‍රියා බවට හැරවීමේ හැකියාව ඇති කර ගන්නා ලදි. මෙහි ප්‍රතිඵලය වූයේ සියලු ම රාජ්‍ය සංස්ථා තුළ නීත්‍යනුකූල ව ක්‍රියා කිරීමට ඇති වගකීම ඉවත් කොට ඒ සංස්ථා විශාල ලෙස බෙලහීන කර දැමීම ම ය.

▲ සෝල්බරි ව්‍යවස්ථාව පදනම් වුණු තවත් ප්‍රබල ප්‍රතිපත්තියක් නම් පුද්ගලයා ආරක්ෂා කිරීමේ යුතුකම රජය මත පැවරෙන ප්‍රධාන ම යුතුකමක්ය යන්න ය. ඒ මගින් මානව හිමිකම් ආරක්ෂා කිරීම කෙළින් ම සෝල්බරි ව්‍යවස්ථාවේ සඳහන් නොවුණත්, පෞද්ගලික නිදහස ආරක්ෂා කිරීම යන පළල් සංකල්පය තුළ මානව හිමිකම් ආරක්ෂාව ගැබ් කොට ඇත. මේ මගින් සියලු ම රාජ්‍ය සංස්ථා තුළ පුද්ගලයාගේ නිදහස රැකීම තහවුරු කර තිබිණ. 1978 ව්‍යවස්ථාව තුළට ම හදිසි නීති ඇති කිරීම පිළිබඳ බලතල ගැබ් කිරීම තුළින් පෞද්ගලික නිදහස ආරක්ෂා කිරීම යන ප්‍රබල ප්‍රජාතන්ත්‍රවාදී යුතුකම යටපත් කර දමන ලදි. මේ නිසා 1978 ව්‍යවස්ථාව තුළ ෆැසිස්ට් වාදී දේශපාලන දර්ශනයක් ගැබ්ව ඇතැයි කිව හැක්කේ රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ ව නීතීන් වශයෙන් හදිසි නීති, ත්‍රස්තවාදී නීතිය ආදිය පැනවීමේ හැකියාව ව්‍යවස්ථාව තුළ ම ගැබ් කිරීම මගිනි. මේ මගින් සියලු ම මානව හිමිකම් සාපේක්ෂ වැදගත්කමකින් යුතු තත්ත්වයකට පමණක් පත් කරන ලදි. 1978 ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදය මගින් මූලික අයිතිවාසිකම් පිළිබඳ ඡේදයක් ප්‍රකාශයට පත් කොට ඇති නමුත්, ඒ සියල්ල රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ නීතියට යටත් කොට සාපේක්ෂ තත්ත්වයකට පත් කොට තිබිණි. මේ නිසා හදිසි නීතිය හා ත්‍රස්තවාදය පිළිබඳ නීතිය පවතින කාලයන්හි දී මානව හිමිකම් මුළුමනින් ම නොතකා හැරීමට රාජ්‍ය සංස්ථාවන්ට හැකි විය. මේ අනුව මානව හිමිකම් ආරක්ෂා කිරීමේ බලධාරීත්වය රාජ්‍ය

සංස්ථාවන් තුළින් බොහෝ සෙයින් ගිලිහී ගියේ ය. 1978 ව්‍යවස්ථාවේ 126 වන වගන්තිය මඟින් මානව හිමිකම් උල්ලංඝනයට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් පිළියම බොහෝ දුරට මවාපෑමක් පමණක් වූ අතර, ඒ 126 වන වගන්තිය නොතකා මිනිස් ඝාතන, බලයෙන් අතුරුදන් කිරීම්, හේතු විරහිත ව අත්අඩංගුවට ගැනීම් හා රඳවා තබා ගැනීම්, සාධාරණ විනිශ්චයක් සඳහා ඇති අයිතිය නොතකාහැරීම හෝ අහෝසි කර දැමීම ආදිය හා වෙනත් මානව හිමිකම් කඩකිරීම බරපතළ ව සිදු වූ කාලයක් සේ 1978 ව්‍යවස්ථාව සම්මත වීමෙන් පසුකාලය ඓතිහාසික වාර්තාවට එකතු වී ඇත.

- සෝල්බරි ව්‍යවස්ථාව තුළ සුබසාධන රාජ්‍යය යන සංකල්පය ගැබ් කොට තිබිණි. ඒ ව්‍යවස්ථාව පැවති කාලය පුරා ඉතා පළල්ව සුබසාධන ක්‍රියාමාර්ග ගැනීම රජයේ සංස්ථා තුළින් සිදු විය. සලාක ක්‍රමයකට අඩු මිලකට මූලික ආහාර ද්‍රව්‍ය සතිපතා නිකුත් කිරීම, මිල රහිත නිදහස් සෞඛ්‍ය ප්‍රතිපත්තිය, එසේ ම මිල රහිත ව මූලාරම්භයේ සිට විශ්ව විද්‍යාල දක්වා ම අධ්‍යාපනය ලබා දීමේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ආදි වෙනත් සුබසාධන කටයුතු රාජ්‍ය සංස්ථා තුළින් ඉටු කෙරිණ.

1978 ව්‍යවස්ථාව පැවති කාලය සුබසාධන රාජ්‍යය පිළිබඳ සංකල්පය විශාල ප්‍රමාණයෙන් හීන කරනු ලබන කාලයක් විය. සලාක ක්‍රමයට, අඩු මිලට මූලික ආහාර සැපයීම මුළුමනින් ම අහෝසි කරන ලදි. නිදහස් සෞඛ්‍ය හා නිදහස් අධ්‍යාපන ප්‍රතිපාදනයන් ද ඉතා සැලකිය යුතු අන්දමින් කප්පාදු විය. වෙළඳ පොළ මඟින් භාණ්ඩ මිල නියම වීමේ වාණිජ ප්‍රතිපත්තිය සීමා විරහිත ව ක්‍රියාත්මක කිරීම මඟින් සුබසාධන සංකල්පය ම මහත් සේ යටපත් විය. අවසානයේ සුබසාධනය සඳහා රාජ්‍ය සංස්ථාවල බලධාරීත්වය තුළින් කිරීමට ඉතුරු වූයේ අල්ප ක්‍රියාදාමයකි.

- රාජ්‍යයේ ඒකීය භාවය පිළිබඳ ප්‍රතිපත්තිය පමණක් සෝල්බරි ව්‍යවස්ථාවට හා 1978 ව්‍යවස්ථාව අතර සමානව පැවති එකම ප්‍රතිපත්තිය විය. මෙහි දී වුවත් සුළු ජාතීන් ව ආරක්ෂා කිරීමේ සුවිශේෂ විධිවිධාන සෝල්බරි ව්‍යවස්ථාව තුළ ගැබ්වුණු අතර, 1978 ව්‍යවස්ථාව තුළින් එවැනි ප්‍රතිපාදනයක් ඇති නොකරන ලදි. සෝල්බරි ව්‍යවස්ථාවේ ලෞකික (secular) දේශපාලන දර්ශනවාදය මුළුමනින් ම පිහිටා තිබූ අතර, 1978 ව්‍යවස්ථාවේ බුද්ධාගමට සුවිශේෂ තැනැක් සැපයීම වැනි සංකල්ප මඟින් ලෞකික ප්‍රතිපත්තිය තරමක් දුරට පළුදු කරන ලදි. අංග සම්පූර්ණව ලෞකික සංකල්පය නොපැවතීම රාජ්‍ය සංස්ථාවන්හි බලධාරීත්වයට රාජ්‍ය නොවන බලවේගවල යටතට පත්වීමේ අවදානම ඇති කරන ලදි.

ඉහත කී වෙනස්කම් වර්තමාන ව්‍යවස්ථා නීතිය පිළිබඳ සාකච්ඡාව තුළ දී ප්‍රකාශයට පත්වන්නේ ව්‍යවස්ථාවෙන් කියවෙන රජයේ මූලික ව්‍යුහය (basic structure) පිළිබඳ සාකච්ඡාවක් ලෙස ය. මේ ව්‍යවස්ථාමය දර්ශනවාදය පුළුල් සාකච්ඡාවකට භාජනය වූයේ ජර්මනියේ හිට්ලර්ගේ ඒකාධිපතිත්තවය ඇතිවීමට හා එයින් වූ විනාශය සම්බන්ධව කරන ලද පසුකාලීන විමර්ශන තුළිනි. හිට්ලර්ගේ මතුවීමට ඉඩකඩ ජර්මනියේ එකල පැවති වෛමාර් ව්‍යවස්ථාව තුළ පැවති බව සලකා අනාගතයේ දී එයට ඉඩකඩ නොතැබීම සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සාකච්ඡා කිරීමේ දී ව්‍යවස්ථාව තුළ වෙනස් කළ නොහැකි සේ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ගැබ් කර ගත් මූලික ව්‍යුහයක් ගැබ් කළ යුතු බව පිළිබඳ ව එකඟතාවක් ජර්මනිය තුළ ඇති වූ අතර, ඒ මඟින් ජර්මනියේ ව්‍යවස්ථා නීතිය තුළ හා සංස්ථා තුළ විශාල වෙනසක් ඇති කරන ලදි.

ජර්මනියේ ඇති වූ ඒ ව්‍යවස්ථාමය දර්ශනවාදය දැන් ඉන්දියාවෙහි නීතිය බවට ඉතා බලවත් ව ප්‍රකාශයට පත් වී ඇත. එසේ වී ඇත්තේ ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් මූලික ව්‍යුහය පිළිබඳ න්‍යාය නඩු තීන්දු ගණනාවක් මඟින් ප්‍රකාශයට පත් කොට ඉන්දියාවේ නීතියක් බවට පත් කිරීම මඟිනි. මේ

නඩු අතර පළමු වැන්න වූයේ කේසවානන්ද භාරතී හා කේරළ ප්‍රාන්ත රාජ්‍ය නමැති දැනට අවුරුදු 40 පමණ පෙර ප්‍රකාශයට පත් වූ නඩුව මඟිනි. ඉන්පසු තවත් නඩු තීන්දු ගණනාවකින් මූලික ව්‍යුහය පිළිබඳ ප්‍රතිපත්තිය නැවත නැවතත් ප්‍රකාශයට පත් වූ අතර, 2015 ඔක්තෝබර් මාසයේ දී ප්‍රකාශයට පත් ඇඩ්වකාත්වරුන්ගේ සංගමය එදිරිව ඉන්දියානු මධ්‍යම ආණ්ඩුව යන නඩුව තුළින් ද ඉතා දීර්ඝ ව විස්තර කොට සනාථ කොට ඇත. විනිශ්චකාරවරුන්ගේ නඩු නමින් හැඳින්වෙන මේ නඩුවල දී ඉන්දියානු ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහයේ අන්තර්ගත කරුණු ඉතා පැහැදිලි ව ප්‍රකාශයට පත් කොට ඇති අතර, එය වෙනස් කිරීමේ බලයක් ව්‍යවස්ථාදායකයට නොමැති බව ද තීරණය කොට ඇත.

කේසවානන්ද භාරතී හා කේරළ ප්‍රාන්ත රාජ්‍යය යන නඩුවේ දී ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය ව්‍යවස්ථාදායකයේ බලය පනත් සම්මත කිරීමේ බලයක් පමණක් බවත්, නව ව්‍යවස්ථාවක් ගෙන ඒමේ හෝ ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහය වෙනස් කිරීමේ හෝ බලයක් ව්‍යවස්ථාදායකයට නොමැති බව ප්‍රකාශ කොට ව්‍යවස්ථාදායකය මේ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර නීති විරෝධී බව ප්‍රකාශයට පත් කොට අවලංගු කොට නිෂ්ප්‍රභා කරන ලදි.

ලංකාවේ දැනට සාකච්ඡා වන ව්‍යවස්ථා නිර්මාණයේ දී මේ මූලික ව්‍යුහය පිළිබඳ සංකල්පයට කේන්ද්‍රීය තැනැක් දිය යුතු වන්නේ 1972 හා 1978 ව්‍යවස්ථාවන් මඟින් ඇති කරන ලද ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයට නස්පැත්තියක් ගෙන දුන් ක්‍රියාවලිය අහෝසි කිරීම සඳහා මේ මූලික ව්‍යුහය පිළිබඳ ව නෛතික ප්‍රතිපත්තිය ව්‍යවස්ථාගත කිරීම අවශ්‍ය ම වී ඇත.

ව්‍යවස්ථාවක අරමුණ කුමක්ද?

ව්‍යවස්ථාවක අරමුණ නම් දැයක වෙසෙන සියලු ම ජනතාව අතර සියලු ම කරුණු සම්බන්ධයෙන් සහයෝගීතා පදනමක් හැදීම මඟින් ඔවුනොවුන් අතර පවතින සම්බන්ධය නොබිඳිය හැකි ශක්තියකින් යුතු එකක් බවට පත් කිරීම ය. මෙය ආර්ථික වර්ධනයටත්, සමාජ සංවර්ධනයටත්, සංස්කෘතික සංවර්ධනයටත්

අත්‍යවශ්‍යයෙන් ම අවශ්‍ය පදනම වේ. සහයෝගීතාවේ බැඳීම නැති තැන බෙදුණු බිඳුණු සමාජයක් ඇති වේ. දැන් බොහෝ දුරට ලංකාව තුළ ඒ බෙදීම් හා බිඳීම් ප්‍රදර්ශනය වී ඇත. එයට ව්‍යවස්ථාමය පදනම 1972 හා 1978 ව්‍යවස්ථා මඟින් සලසා දෙන ලදි. මේ තත්ත්වය අහෝසි කොට දැයක් තුළ වසන සියලු දෙනාගේ ම සහයෝගීතාව සමාජ පැවැත්මේ සියලු ම අංගයන් තුළට ඇතුළත් කොට ප්‍රබල වූ සංවර්ධනයක් ඇති කළ යුතු ව ඇත. බෙදුණු හා බිඳුණු සමාජය ඒ තුළ ඇති රාජ්‍ය සංස්ථා බෙලහීන කොට ඇති කරන අපිළිවෙළ තුළින් අරාජකත්වයක් ඇති කරයි. සහයෝගීතාවයේ නෛතික පදනම මඟින් සහයෝගිතාවයේ සදාචාරය හා සංස්කෘතිය ඇති කරනු ලබයි. එසේ කර ගැනීම ව්‍යවස්ථා නිර්මාණයේ නොසැලෙන එල්ලය සේ පැවතිය යුතු ය.

3 පරිච්ඡේදය

නව ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීමේ දී මතු වී ඇති ගැටලු

මේ ලේඛනය ඉදිරිපත් කරනු ලබන්නේ මෙහි අග දී සඳහන් වන ශ්‍රී ලාංකීය රටවැසියන් හා සංවිධාන මඟිනි

ව්‍යවස්ථා සංශෝධන කමිටුව ඉදිරියේ පැවරී ඇත්තේ බැරෑරුම් වගකීමකි. ඒ වගකීම ඉටු කිරීම සඳහා උපරිම සහය දීම සියලු ම රටවැසියන්ගේත් රටේ පවතින සියලු ම සංවිධානවලත් වැදගත් යුතුකමක් සේ පැවතේ. ඒ යුතුකම ඉටු කිරීමෙහිලා අප විසින් අදාළ කරුණු ඉතා දීර්ඝ ව සලකා බලා ඒ කමිටුව වෙත මේ ලේඛනය ඉදිරිපත් කරනු ලබයි.

මේ ලේඛනයෙහි සඳහන් කරුණු ව්‍යවස්ථාවට අත්‍යවශ්‍ය ම කරුණු බවත්, ඒ කරුණු පිළිබඳ අදහස් හා අදාළ යෝජනා ඉදිරිපත් කර ඇත්තේ ලංකාව දැන් දශක 04 කට වැඩි කාලයක් තුළ මුහුණ දී සිටින අතිශයින් භයානක වූ දේශපාලන හා සමාජමය ව්‍යාධියකින් රට බේරා ගැනීමට පදනම් විය හැකි ව්‍යවස්ථාවක් අනිවාර්යෙන් ම නිෂ්පාදනය විය යුතු බවත් පිළිබඳ ව ය.

අප සියලු දෙනාත් එමෙන් ම අප දන්නා හැටියට රටේ බහුතර ජනතාවකුත් මේ මතයට එළඹ ගත්තේ දැනට බොහෝ කාලයකට පෙර සිට ය. එහෙත් තීරණාත්මක වෙනසක් ඇති කර ගැනීම සඳහා අවස්ථාවක් නිර්මාණය වී නොතිබුණි. 2015 ජනවාරි 08 හා අගෝස්තු 17 යන දිනවල පැවති ජනාධිපති හා රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් කර ගැනීම සඳහා වූ මැතිවරණ තුළ දී, ලැබුණු ප්‍රතිඵලය අනුව අප බොහෝ කාලයක් බලාපොරොත්තුව සිටි අවස්ථාවක් නිර්මාණය විය.

මේ අවස්ථාවෙන් නිසි ඵල ලබා ගැනීමට තරම් හැකියාවක් ලංකාවේ රටවැසියන් වන අපට තිබේ ද, නැද්ද, යන්න දැනට නව ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමට එළඹ ඇති අවස්ථාවෙහි අවසාන ප්‍රතිඵලය විසින් විදහා පානු ඇත.

මේ අවස්ථාව පැහැර හැරීම වනාහි රටවැසියන් වන අපි අප වෙත ම ළඟා කර ගනු ලබන විශාල විපත්තියක් වනු ඇත. අතීතයේ තිබූ ඉතා කරදරකාරී හා හිංසාකාරී තත්ත්වය පමණක් නොව අනාගතයේ දී අනිවාර්යෙන් ම ඇති විය හැකි ඊටත් වඩා විශාල විනාශයක් වළක්වා ගැනීම මේ ව්‍යවස්ථා නිර්මාණය කෙරෙහි අවධානය යොමු කරන කාගේත් අරමුණ විය හැකි ය. එවැනි බරපතළ අභියෝගයක් අප ඉදිරියේ ඇති බව හොඳින් වටහා ගෙන ඒ ගැන දින තුනක් පමණ රැස්වී සාකච්ඡා කොට මේ ලේඛනයේ අඩංගු අදහස් හා යෝජනා ඉදිරිපත් කරනු ලබන බව මෙහි දී සටහන් කළ යුතු ව ඇත.

ව්‍යවස්ථාවක පරම අරමුණ වන්නේ රටක පුරවැසියන් සියලු දෙනා අතර ම සහයෝගීතා පැවැත්මක් ඇති කිරීම සඳහා වාතාවරණයක් ගොඩනැඟීමට අවශ්‍ය වන නෛතික මූලධර්ම ව්‍යවස්ථාව තුළින් ප්‍රකාශයට පත් කිරීම ය.

රට තුළ ඇති විවිධ වෙනස්කම් නොතකා සියලු දෙනා තුළ ම සහයෝගීතාව වර්ධනය කිරීමේ සදාචාරය වර්ධනය කිරීමට හැකි සේ ඒ නෛතික ප්‍රතිපාදනයන් සකස් විය යුතු ය. රට තුළ ප්‍රචණ්ඩත්වය නැති කළ හැක්කේ සහයෝගීතා සංස්කෘතිය ගොඩනඟා ගැනීමට අවශ්‍ය නෛතික පදනම තර කිරීම තුළින් පමණ ය.

බොහෝ කාලයක් තුළ රටේ බොහෝ විනාශයන් ඇති කළ, බොහෝ ලේ හැළීම්වලට පදනම් වූ ගැටීම්වලින් කියවෙන්නේ එවැනි සංස්කෘතික පදනමක් රට තුළ ගොඩනැඟීමට රට තුළ පැවති ව්‍යවස්ථා අසමත් වූ බව ය. යෝජිත ව්‍යවස්ථාව තුළ සහයෝගීතා නෛතික පදනම ප්‍රකාශ කිරීම එහි නිර්මාණකරුවන් විසින් පොහොසත් වූ දර්ශනවාදී මූලධර්මයන් හා සංස්කෘතික හා සදාචාරාත්මක මූලධර්මයන් මත සකස් විය යුතු ය.

01. ඓතිහාසික අවස්ථාවක්

රටේ නීතියත්, සාමයත්, සදාචාරාත්මක පැවැත්මත් බිඳ දැමීම තුළින් අසංවර භාවයට, අපිළිවෙළට හා කෲරත්වයට බොහෝ ඉඩකඩ සැලැස්වූ දශකයන් ගණනාවකට පසු මේ දැන් ශ්‍රී ලාංකික ජනතාවට ලැබී ඇත්තේ, ඒ තත්වයන් වර්තමානයෙන් අතුගා දැමීමටත්, අනාගතයේ දී එය නැවත ඇති වීම වළක්වා ගැනීමටත් හැකි වන ක්‍රියාමාර්ගයන් ගැනීමට අවකාශයක් ඇති දේශපාලන හා සමාජීය වාතාවරණයක් ය.

ඒ අවකාශයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ගත යුතු පියවර අතර ඉතාමත් වැදගත් හා ප්‍රබල ම පියවර වන්නේ අතීතයේ ඇති වූ තත්ත්වයනට එසේ ඇති වීමට මඟ පෑදූ ඒ අඳුරු කාලය තුළ බලපැවැත්වූ ව්‍යවස්ථාදායක මූලධර්මයන් ඉවත් කොට ඊට හාත්පසින්ම වෙනස් වූ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන් මත මේ ව්‍යවස්ථාව ගොඩනැඟීම මඟින් වර්තමාන කාලයට හා අනාගතයට යහපත් හා ස්ථාවර පදනමක් දමා ගැනීමට නම්, ඒ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත පදනම් වූ ව්‍යවස්ථාවක් ගොඩනඟා ගැනීම ය. 1972 හා 1978 ව්‍යවස්ථාවන් මඟින් කඩා දමන ලද්දේ ලංකාවේ නීති රටාව හා සමාජ රටාව ප්‍රජාතන්ත්‍රවාදයෙන් ඈත් කොට දැමීමයි. ඉහත කී ව්‍යවස්ථා මඟින් අපට අහිමි වූයේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන හා නෛතික පදනමය යන්න ගැන ගැඹුරු අවබෝධයක් රට තුළ නොපැවතීම අභාග්‍යයට කරුණකි. ව්‍යවස්ථාව ගොඩනඟා ගැනීම සඳහා දැන් පැවැත්වෙන සාකච්ඡාව ඒ අවබෝධය රට තුළ වගා කිරීමට අවස්ථාවක් කර ගතහොත්, අප වැටී සිටිනා වළෙන් ගොඩවී ප්‍රජාතන්ත්‍රවාදය කරා ගමනක් ඇරඹීමට සාධනීය පසුබිමක් ඇති කරනු ඇත. ඒ නිසා රටේ ජනතාවත්, ව්‍යවස්ථාව නිර්මාණය කිරීමේ යෙදෙන කවුරුත් අප වැටී සිටින අවුලේ ගැඹුර අවබෝධ කර ගත හොත් ඒ තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා පදනම සාදා ගැනීමට, නිර්මාණය කර ගැනීමට බලාපොරොත්තු වන ව්‍යවස්ථාව සැබවින් ම ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත ගොඩනැගුණු, නීතිමය අත්තිවාරමක් බවට පත් කර ගැනීමට හැකි වනු ඇත. අප මේ ලේඛනයෙන් බලාපොරොත්තු වන්නේ එවැනි බැරෑරුම් ප්‍රශ්න සමහරක් ව්‍යවස්ථා සංශෝධන කමිටුව ඉදිරියේ හා ජනතාව ඉදිරියේ තැබීමට ය.

02. නීතියේ ආධිපත්‍යය හා නීතිය මත පාලනය

"If there is one principle which runs through the enter fabric of the entire constitution, it is the principle of Rule of Law and under the constitution, it is the Judiciary which is entrusted with the task of keeping every organ of the State within the limits of the Law and makes the Rule of Law meaningful and effective. "Judgment delivered by justice PN Bhagawati in the "First Judges case ", quoted in the judgment of the Supreme court of India in the case; Advocates on Record Association Vs Union of India, 2015."

ව්‍යවස්ථා නීතිය යටතේ මේ සංකල්පයන් ව්‍යවස්ථා ගත කොට රටේ නීතිය බවට නැවත පත් කර ගැනීමට නම්, මේ සංකල්පයන් 1978 ව්‍යවස්ථාව මඟින් මුළුමනින් ම බැහැර කරන ලද අදහස් බව පිළිගැනීම මූලාරම්භක ස්ථාවරයක් විය යුතු ව ඇත. මෙරටේ දැන් දශක 2 කට වැඩි කාලයක් තුළ නීතියේ ආධිපත්‍යයට හා නීතිය මත පාලනයට 1978 ව්‍යවස්ථාව මඟින් හා එය ප්‍රායෝගිකව ක්‍රියාවට නැඟීම මඟින් ඉතා බරපතළ හානි කර ඇතිවා පමණක් නොව, ඒ සංකල්ප මුළුමනින් ම බැහැර කොට ඇති බව පිළිබඳ විවාදයක් රට පුරා ම පැවත ඇත. මේ නිසා ඒ සංකල්ප බැහැර කිරීම පිළිබඳ අදහස තවදුරටත් විවාදාත්මක ප්‍රශ්නයක් මතු නොකරයි.

ගැටලුව පවතින්නේ ඒ අදහස් නැවත රටේ මූලික නීතිය ව්‍යවස්ථාව තුළට ඇතුළු කළ හැක්කේ කෙසේ ද යන්නයි. මෙයට අප විසින් කරන යෝජනාව නම්, නීතියේ ආධිපත්‍යය හා නීතිය මත පාලනය රටේ නීතියේ අත්තිවාරම බව ප්‍රකාශයට පත් වන සේ ව්‍යවස්ථාවේ මූලික ව්‍යූහය සකස් විය යුතු ව ඇති බව ය. සියලු ම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්හි මේ ස්ථාවරය ඉතා දැඩි ව නීති ගත කොට ඇති අතර, නීතියේ වලංගු භාවය යෙදී ඇත්තේ ඒ සංකල්ප මත ය. මේ සංකල්ප ස්ථාවර කිරීමට පටන් ගෙන දැන් ශතවර්ෂ 3 කට වැඩි කාලයක් ගත වී ඇත. නීතියේ ආධිපත්‍යය හා නීතිය මත පාලනය යන්න වැඩවසම් යුගය තුළ පැවති

රාජ්‍ය දර්ශනවාදයන් අවසානයකට පත් කරමින් නව යුගයක් ඇති කිරීමට පදනම සැලසූ නෛතික සංකල්පයන් වේ. අපට නුදුරු රාජ්‍යය වන ඉන්දියාවේ මේ සංකල්පයන් ඉතා බැරෑරුම් ව පිළිගෙන පැවති බව ඒ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු ගණනාවක් මඟින් ම ඉතා ප්‍රබල ව ප්‍රකාශයට පත් කොට ඇත. කේසවානන්ද භාරතී හා කේරළ ප්‍රාන්ත රාජ්‍යය යන නමින් හැඳින්වෙන ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව මඟින් දැනට අවුරුදු 40 කට පමණ පෙර කාලයක දී ප්‍රකාශයට පත් කරන ලද මේ මූලික ව්‍යූහය පිළිබඳ ව්‍යවස්ථාමය න්‍යාය 2015 අග භාගයේ දී තවත් ප්‍රබල නඩු තීන්දුවක් මඟින් නැවත වරක් සනාථ කර ඇත. ලංකාවේ ව්‍යවස්ථාව නිර්මාණය කිරීමේ යෙදී සිටීමට සිටින සියල්ලන්ගේ ම අවධානය නඩුකාරයන්ගේ නඩු යනුවෙන්, දැන් ප්‍රචලිත ව පවතින මේ ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු මාලාව වෙත යොමු විය යුතු ව ම ඇත.

ඒ නඩු තීන්දු මාලාවේ අඩංගු ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහය යන සංකල්පය ප්‍රජාතන්ත්‍රවාදය පවතින ඕනෑ ම රටකට නොතකා හැරිය නොහැකි සංකල්පයක් යැයි පැහැදිලි ව ප්‍රකාශ කළ හැකි ය.

ඒ නඩු තීන්දුවල හරය ලංකාවේ ව්‍යවස්ථාවට ඇතුළු කිරීම වනාහි, දැන් ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට මෙන් ම අනාගතයේ දී බිහි වන සියලු ම ශ්‍රී ලාංකිකයන් හට ද දෙනු ලබන මහඟු දායාදය වනු ඇත. ඔබ කමිටුවේත්, ව්‍යවස්ථාව නිර්මාණයෙහි යෙදෙන පාර්ලිමේන්තු සභාවත් පිළිබඳ ව ඉමහත් විශ්වාසයකින් යුතු ව මේ ගැන අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමු.

03. පහළට ඇද දමා ඇති අධිකරණය නැවත බලගැන්වීම

> "Independence of Judiciary does not mean Judges can act arbitrarily. It means judges are free in discharging judicial functions." - Supreme Court of India in "Advocates on Record Association Vs Union of India, 2015".

විධායක ජනාධිපති ක්‍රමය නැති කරනවාය යනුවෙන් දැන් සියලු ම දේශපාලන පක්ෂ මඟින් දී ඇති තීන්දුව සැබෑවක් කර ගැනීම සඳහා අදාළ වන සමහර කරුණු ද මෙහි අඩංගු කිරීමට කැමැත්තෙමු. විධායක ජනාධිපති ක්‍රමය විසින් විධායකයේ බලතල ඉහළට දමා ගැනීම මඟින් බලය බෙදීම පිළිබඳ මූලික ව්‍යවස්ථාමය සංකල්පය බිඳ දැම්මේ ය. විධායකය ඉහළට පැමිණියාය යන්නෙන් අදහස් වන්නේ රජයේ අනෙක් කොටස් එනම් පාර්ලිමේන්තුව හා අධිකරණය පහළට ඇද දැම්මාය යන කරුණ ය. මේ නිසා බලය බෙදීම පිළිබඳ සංකල්පය නැවත ස්ථාපිත කළ හැක්කේ එසේ පහළට දැමූ සංස්ථාවන්ගේ බලධාරීත්වය නැවතත් ඔසවා තැබීම මඟින් ඒ සංස්ථාවන්ට රටේ බලය පාවිච්චි කරන ආකාරය තුළ නිසි ලෙස කටයුතු කිරීමේ අවස්ථාව හා හැකියාව සලස්වා දීමෙන් ය.

මෙහි දී කාගේත් අවධානය වැඩි වශයෙන් ම යොමු වී ඇත්තේ අධිකරණයේ තත්ත්වය පහළ මට්ටමකට ඇද දැමීම මඟින්, මුළු රටේ සමස්ත බල ව්‍යුහයේ තුලනය මුළුමනින් ම බිඳ වැටුණු ආකාරය ය. දැන් පවතින අධිකරණයට සංවරණය හා තුලනය (Checks and Balances) යන මූලික ව්‍යවස්ථාමය හැකියාව අහිමි වී ඇත.

අධිකරණමය විමර්ශන (Judicial Review) බලය දැන් ලංකාවේ ඉහළ අධිකරණ තුළින් ඉවත් කොට ඇති අතර, ඒ වෙනුවට සෑහීමකට පත් විය නොහැකි විකල්පයක් වශයෙන් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු එය සම්මත කිරීමට පෙර ඉතාමත් සුළු කාලයක් ඇතුළත දී යෝජිත නීතිය ව්‍යවස්ථාවට අනුකූල ද යන්න පිළිබඳ ව නිගමනයක් දීමට පමණක් අධිකරණයට ඉඩ සලස්වා ඇත. අධිකරණමය විමර්ශනය නැති කර දැමීම තුළින් ඇත්තෙන් ම යටපත් කර ඇත්තේ සංවරණ හා තුලනය (Checks and Balances) යන බලයයි. මෙහි ප්‍රතිඵලය නම්, සියලු ම සාධාරණ නීති සම්ප්‍රදායට විරුද්ධ පනත් පමණක් නොව ව්‍යවස්ථා සංශෝධන පවා නීති ගත කර ගැනීමට ව්‍යවස්ථාදායකයට හැකි වීමත්, ඕනෑ ම හිතුවක්කාර හා නීති විරෝධී ක්‍රියාවක් කිරීමට වුවත් විධායකයට හැකි වීමත් ය. පසුගිය දශකයන් පුරා සාමාන්‍යයෙන් ශිෂ්ට සම්පන්න සමාජයක අවනීතික යැයි සලකන පනත් හා ව්‍යවස්ථා

සංශෝධන ලංකාවේ නීතියට එකතු විය. එමෙන් ම විධායකය සාමාන්‍යයෙන් අවනීතික යැයි සැලකිය හැකි ක්‍රියාවල බොහෝ සේ නියැළුණේ ය. අද පවතින අසංවර භාවය හා අපිළිවෙළ ඒ අවනීතික පනත් සම්මත කර ගැනීම හා අවනීතික වූ ක්‍රියාවන් විධායකය විසින් කිරීම නිසා ඇති වූවකි.

ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයකු ව සිටි කේ.එම්.බී.බී. කුලතුංග මහතා ඔහුගේ ජීවිතයේ අවසාන කාලයේ දී ලියූ පොතක කියා සිටියේ ලංකාවේ දැන් පවතින්නේ අපිළිවෙළක් බව ය (Disorder). මේ අපිළිවෙළ (Disorder) නැති කිරීමට තරම් හැකියාවක් ඇති නෛතික පදනමක් ඇති කිරීමට යෝජිත ව්‍යවස්ථාවට නොහැකි වුවොත්, මේ ව්‍යවස්ථාව හැදුවේ මොකට ද යන ප්‍රශ්නය ජනතාව විසින් ද, කල්පනා ශක්තියක් ඇති ඕනෑ ම කෙනෙක් විසින් ද මතු කරනු නොඅනුමාන ය.

අපිළිවෙළ නසා සාධාරණ නීති පද්ධතියක් තුළ සමාජීය පිළිවෙළ (Social Order Towards) ගොඩනැඟීම නව ව්‍යවස්ථාවේ අරමුණ විය යුතු ය. මේ සඳහා සංවරණය හා තුලනය (Checks and Balances) පවත්වා ගෙන යා හැකි සේ අධිකරණයේ බලධාරිත්වය ඉහළට ඔසවා තැබීම අත්‍යවශ්‍ය වන අතර, ඒ සඳහා අවශ්‍ය ම පියවරක් වන්නේ අධිකරණමය විමර්ශනය (Judicial Review) සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදී රටක පවතින සේ, උදාහරණයක් වශයෙන් ඉන්දියාව වැනි රටක පවතින ආකාරයට ලංකාවේ ද නැවත ස්ථාවර කිරීමයි.

අධිකරණමය විමර්ශනය (Judicial Review) අධිකරණය සතු කිරීමට නම් අධිකරණයේ ස්වාධීන භාවය ආරක්ෂා කළ යුතු ව ම ඇත. අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීමට නම් විනිසුරුවරුන් පත් කර ගැනීම හා ඔවුන් ඉවත් කිරීම යන ක්‍රියාදාමයන් ප්‍රජාතන්ත්‍රවාදය පවතින රටක අනිවාර්යෙන් ම තිබිය යුතු සම්ප්‍රදායන් මත සිදු විය යුතු ය. ඒ සම්ප්‍රදායන් අතර ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු ඉහළ අධිකරණවල විනිසුරුවරුන් තෝරා ගැනීමේ කාර්යය අනිවාර්යෙන් ම සිදු විය යුත්තේ අගවිනිසුරුතුමා හා ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිසුරුවරුන් සමඟ සාකච්ඡා කිරීමෙන් වන අතර, ඒ සාකච්ඡාවල දී නව පත්වීම් සම්බන්ධයෙන් අවසාන නිගමනය ඒ විනිසුරුවරුන් පමණක් ම සතු විය යුතු ය. බලය බෙදීම යන ව්‍යවස්ථාමය

නියාමය පවත්වා ගත හැකි වන්නේ මේ ආකාරයෙන් ඉහළ අධිකරණවල විනිසුරුවරුන් පත් කර ගැනීම තුළිනි. මේ පිළිබඳ ව ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුගමනය කරනු ලබන නෛතික පිළිවෙත මේ ලේඛනයේ 02 වන ඡේදය මඟින් ඉහත දී ඉදිරිපත් කොට ඇත.

04. අධිකරණය ක්‍රියාකාරී කරවීමට සම්පත් සැපයීම

අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රශ්නය සලකා බැලීමේ දී ලංකාවට සුවිශේෂව පවතින යම් කරුණු විසඳා ගැනීම සඳහා ව්‍යවස්ථාදායක මූලධර්මයන් සලකා බැලීම ද අත්‍යවශ්‍ය ය. දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රටවල් තුළ අධිකරණයට අවශ්‍ය මූල්‍ය හා වෙනත් සම්පත් ලබා දීම දැන් සම්ප්‍රදායානුකූලව ම කෙරේ.

ඒ රටවල ව්‍යවස්ථාදායකය, විධායකය, එසේ අධිකරණයේ පැවැත්මට අවශ්‍ය සම්පත් ලබා දීම පිළිබඳ වගකීම මුළුමනින් ම බාර ගෙන ඇත. එහෙත් ලංකාවේ පවතින්නේ ඒ තත්ත්වය නොවේ. අවශ්‍ය ප්‍රමාණයට විනිසුරුවන් නැති වීම, අවශ්‍ය ගොඩනැඟිලි නැති වීම, අවශ්‍ය තාක්ෂණික සංවිධානය නැති වීම හා වෙනත් පහසුකම් නැති වීම නිසා බරපතළ නඩු පමාවක් පවතී. ඒ සම්පත් අධිකරණයට පමණක් නොව, නඩු විමර්ශනයේ යෙදෙන පොලීසියට ද, නඩු ගොනු කිරීමේ හා පවත්වාගෙන යෑමේ කාර්යය කරන නීතිපති දෙපාර්තමේන්තුවට ද එසේ අහිමි කොට ඇත. ව්‍යවස්ථාදායක හා විධායකය මේ ආකාරයෙන් විශාල වගකීම් පැහැර හැරීමක යෙදී සිටී. ඒ මඟින් අධිකරණ ක්‍රියාදාමය ම ජනතාවගේ අවඥාවකට ලක්වී ඇති අතර, අධිකරණයක් මඟින් රටක් තුළ කළ යුතු සේවය නිසි සේ කිරීමට හැකි අධිකරණ පද්ධතියක් නොපවතින තත්ත්වයක් උදා වී ඇත. අවසානයේ දී ව්‍යවස්ථාවක් පවා ක්‍රියාවට නැඟෙන්නේ අධිකරණ පද්ධතිය ඔස්සේ ය. අවශ්‍ය ආකාරයේ අධිකරණ පද්ධතියක් නැති තැන ව්‍යවස්ථාවකින් කුමන ඵලයක් අත්කර ගත හැකි ද යන ප්‍රශ්නය ව්‍යවස්ථාව නිර්මාණය කරන්නන් විසින් ඉතාමත් ම බැරෑරුම් ව සලකා බැලිය යුතු ය. මේ නිර්මාණකරුවන් කරන්නේ අවසානයේ දී ඵලයක් නෙළා ගත හැකි ව්‍යායාමයක් ද, නැතහොත් හුදෙක් ම යම් ලේඛනයක්

සකස් කිරීම පමණක් ද, යන කරුණ ඒ නිර්මාණකරුවන්ගේ මෙන් ම රටේ ජනතාවගේ ද අවධානයට යොමු විය යුතු ව ඇත. එසේ නොවීමට නම් යෝජිත ව්‍යවස්ථාව මඟින් ව්‍යවස්ථාදායකයට, විධායකයට හා අධිකරණයේ පැවැත්මට අවශ්‍ය සියලු ම සම්පත් ලබා දීමේ යුතුකම පැවරෙන සේ ව්‍යවස්ථා නිර්දේශයන් සකස් කළ යුතු ව ඇත.

ඒ කරුණ සලකා බැලීමේ දී නඩු පමාව නිසා ඇති වී තිබෙන විශාල අගතිගාමී ප්‍රතිඵල සලකා බැලීම වටී. ඒ අගතිගාමී ප්‍රතිඵල නම්,

- ▲ බොරුව මත පදනම් වූ නඩු කීමේ සම්ප්‍රදායක් ඇති වීම.
- ▲ එකම නඩුව විනිශ්චකාරයන් ගණනාවක් විසින් ඇසීම.
- ▲ විශාල දේශපාලන හා සමාජීය වියවුල් ඇති වීම.
- ▲ ආර්ථිකය පරිහානියට ලක් වීම.
- ▲ දෙපාර්ශ්වයට ම වැඩි වියදමකුත් වැඩි කාලයකුත් වැය කිරීමට සිදු වීම.
- ▲ සාක්ෂි විනාශ කිරීමට හෝ සාක්ෂිකරුවන් මරා දැමීමට හෝ හැකි වීම.
- ▲ අධිකරණය හා නීතිය ගැන ජනතාවගේ විශ්වාසය කඩවීම.
- ▲ විශේෂයෙන් ම කාන්තාවන්ට බලපෑම් ඇති වීම.
- ▲ සැකකරුවන් නිදැල්ලේ සිටීම.
- ▲ සාක්ෂිකරුවන් ක්‍රමයෙන් අධෛර්යමත් වීම හා පැමිණීම අඩු වීම.
- ▲ අධික ලෙස නඩු ගොඩගැසීම නිසා පමාව තව දුරටත් ඇති වීම.
- ▲ සාධාරණ බලාපොරොත්තු ඇති කර ගැනීමට නොහැකි වීම.
- ▲ නීතිඥ වෘත්තිය දූෂිත වීම.
- ▲ උසාවිවල කාර්යක්ෂමතාව දූෂිත වීම.
- ▲ සමස්ත අධිකරණ සම්ප්‍රදාය ජනතාවගේ අවඥාවට පත් වීම.
- ▲ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම කඩා වැටීම.
- ▲ සාක්ෂිකරුවන් ලෙස පැමිණෙන රාජ්‍ය සේවකයන්ගේ සහ විශේෂඥ සාක්ෂි දෙන අයගේ කාලය සහ වියදම අධික වීම.

- ▲ නඩු පමාව නිසා ආරවුල් දිග්ගැස්සීම හේතුවෙන් බරපතළ අපරාධ සිදු විය හැකි වීම.
- ▲ නඩු පමාවෙන් සාධාරණය ඉටු නොවීම මත යහපාලනය යටපත් වීම.
- ▲ දඬුවම් දීම පමා වීම නිසා අපරාධ වැළැක්වීමට පමා වීම.
- ▲ අපරාධයක දී දඬුවම නිසි වේලාවට නොදීම නිසා අපරාධ වැඩි වීම.
- ▲ නඩු ඇසීමේ කාලය තුළ දී සාක්ෂිකරුවන් මිය යෑම නිසා සාධාරණ තීන්දුවකට පැමිණීමට නොහැකි වීම.
- ▲ නඩු පමාව තුළින් පවුල් සංස්ථාව බිඳ වැටීම.

මේ තත්ත්වය අහෝසි නොකළහොත් ඇති වන්නේ ස්වාධීන අධිකරණයක් නොව, රට වැසියාගේ විශ්වාසය දිනා ගැනීමට නොහැකි හා කාගේත් අවඥාවට ලක් වුණු අධිකරණයක් ය. යෝජිත ව්‍යවස්ථාව මඟින් එවැනි තත්ත්වයක් තව දුරටත් පවත්වා ගෙන යෑමට ඉඩ නොහැරීමට ව්‍යවස්ථා නිර්මාපකයන් හා පොදුවේ ජනතාව වගබලා ගත යුතු ව ඇත.

05. ආයතනික සදාචාරාත්මක පාරිශුද්ධ භාවය (Institutional Integrity)

රාජ්‍යයක පිළිවෙළ රැකෙන්නේත් අරාජකත්වය නැති වන්නේත් ආයතනික සදාචාරාත්මක පාරිශුද්ධ භාවය තුළ ය. රජයේ ඉහළ ම තනතුර දරන ජනාධිපතිතුමාගේ සිට සියලු ම රාජ්‍ය නිලධාරීන් තුළ ආයතනික සදාචාරාත්මක පාරිශුද්ධ භාවය තිබිය යුතු ය. රාජ්‍ය ආයතන තුළ විනය ගරුක භාවය ඇති වන්නේ ඒ ආකාරයෙනි. විනය විනාශ කරන්නා වූ නරක ම ව්‍යාධිය වන්නේ දූෂණයයි. දූෂණය මර්දනය කිරීමට රජය බැඳී සිටී. එය රජයේ පරම යුතුකමයි. මෙතෙක් මේ රටේ පැවතී ඇති අල්ලස් හා දූෂණ කොමිෂන් සභා රාජ්‍ය සංස්ථා තුළ දූෂණ වැළැක්වීමට අසමත් වූ සංස්ථාවෝ වූහ. එම නිසා ලංකාවේ අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව දැන් පවතින සංකල්පමය හා සංවිධානාත්මක රටාවෙන් ඉවත් කොට වඩා සාර්ථක

ව ආයතනික සදාචාරාත්මය පාරිශුද්ධ භාවය ඇති කළ හැකි සංකල්පමය හා සංවිධාන රටාවක් තුළට ගෙන ආ යුතු ය. මෙය කිරීමට නම් සාර්ථක අල්ලස් හා දූෂණ ආයතනයක් පිහිටුවීම පිළිබඳ ප්‍රතිපත්තිය ලංකාවේ ව්‍යවස්ථාව තුළට ඇතුළු විය යුතු ය. ඒ සංකල්පය මත සාර්ථක ප්‍රතිඵල ගෙන දිය හැකි දූෂණ මර්දන ආයතනයක් නිර්මාණය කළ යුතු ය. එසේ කිරීමට නම් එවැනි ආයතනයක් පවත්වා ගෙන යෑමට අවශ්‍ය වන්නා වූ මූල්‍ය සම්පත් හා අන් සියලු ම සම්පත් අඩුපාඩුවකින් තොර ව ලබා දීමේ වගකීම සනාථ වන සේ ව්‍යවස්ථාව මඟින් මේ සංකල්පය ප්‍රකාශයට පත් විය යුතු ය. දූෂණ මර්දන ආයතනයට අවශ්‍ය සම්පත් නොසැපයීම අරපරිස්සමක් නොවේ. දූෂණය මඟින් විශාල රාජ්‍ය සම්පත් විනාශයක් ඇති කරයි. එය වැළැක්වීම මඟින් රටේ සම්පත් ආරක්ෂා වනවා මෙන් ම ඒ සම්පත් වඩාත් පළල් වීම සඳහා අවශ්‍ය වාතාවරණය සැලසේ. ඒ නිසා දූෂණ මර්දන ආයතනයක් ගොඩනැඟීම තුළින් ආයතනික සදාචාරාත්මක පාරිශුද්ධ භාවය ඇති කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථා ප්‍රතිපත්තිය මේ ව්‍යවස්ථාවට ඇතුළු විය යුතු ය.

06. මානව හිමිකම් සම්බන්ධයෙන් ඇති විය යුතු වෙනස්කම්

"Human freedoms are lost gradually and lost gradually and imperceptibly and their destruction is generally followed by authoritarian rule. That is what history has taught us. Struggle between liberty and power is eternal. Vigilance is the price that we, like every other democratic society, have to pay, to safeguard the democratic values enshrined in the constitution. Even the best of governments are not averse to have more and more powers to carry out their plans and programmes which they may sincerely believe to be in public interest. But a freedom once lost is hardly ever regained except by revolution. Every encroachment on freedom sets a pattern for further encroachment." Supreme Court of India in Keshvananda Bharathi Vs Govt of kerala, 1973

මෙහි දී සලකා බැලිය යුතු කරුණ නම් 1978 ව්‍යවස්ථාව මඟින් මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් රැගත් පියවර ඒ ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ සඳහන් ය. එහෙත් ඒ ව්‍යවස්ථාව පැවති කාලය පුරා ම මානව හිමිකම් කඩවීම් මහා පරිමාණයෙන් වැඩි වූවා මිස අඩු වූයේ නැත. එසේ නම් 1978 ව්‍යවස්ථාව මානව හිමිකම් කඩවීම් වැළැක්වීම අතින් අසාර්ථක වූ ව්‍යවස්ථාවක් ලෙස සැලකිය යුතු ය. ඒ අනුව ඒ ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදය ද එලෙස ම අසාර්ථක ප්‍රතිඵල ඇති කළා වූ නීති ප්‍රතිපාදකයන්ගෙන් සමන්විත බව පිළිගත යුතු ව ඇත. ඒ නිසා ඒ 3 වන පරිච්ඡේදය මුළුමනින් ම ඉක්මවා ගොස්, වඩා සාධනීය ප්‍රතිඵල ගෙන දිය හැකි මූලික අයිතිවාසිකම් අඩංගු කොටසක් යෝජිත ව්‍යවස්ථාව තුළට ඇතුළත් කළ යුතු ව ඇත. මේ සඳහා අපගේ යෝජනා මෙසේ ය.

- ජීවිතය පිළිබඳ අයිතිය මේ අයිතිවාසිකම් තුළට ඇතුළත් කළ යුතු ම ය. මෙහි දී විශේෂයෙන් ම සලකා බැලිය යුතු වන්නේ 1971 කැරැල්ල මැඩපැවැත්වූ කාලයේ සිට මේ දක්වා ලංකාව ප්‍රසිද්ධියට පත් වී ඇත්තේ මහා පරිමාණව අධිකරණ නියෝගවලින් තොර ඝාතන සිදු කළ රටක් හැටියට බව ය. ඒ ඝාතන අතර වඩාත් තදින් කැපී පෙනෙන්නේ අත්අඩංගුවට ගැනීමෙන් පසු මරා දමන ලද පුද්ගලයන්ගේ සංඛ්‍යාවයි. ඒ මරණ සංඛ්‍යාව ගණන් කළ යුතු ව ඇත්තේ දස දහස් ගණන්වලිනි. මෙවැනි තත්ත්වයක් නෛතිකව අභියෝගයට ලක් කිරීමට අවශ්‍ය පදනම 1972 හෝ 1978 ව්‍යවස්ථා තුළ නොතිබුණි. ඒ නිසා මේ තත්ත්වය වළක්වා ගැනීමට හැකි වන සේ ජීවිතය පිළිබඳ අයිතිය නිර්වචනය කොට ඉදිරිපත් කළ යුතු ව ඇත. මෙහි දී සැක කටයුතු ඝාතන සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරුන්ගේ පශ්චාත් පරීක්ෂණ මොනම තත්ත්වයක් යටතේ වත් අවලංගු කිරීමට නොහැකි වන සේ නීති ප්‍රකාශයට පත් විය යුතු ය. එමෙන් ම සැක කටයුතු මරණ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරුන්ගේ ක්‍රියාකලාපය ද පසුගිය කාලයේ දී දැඩි ලෙස විවේචනය වී ඇත. බොහෝ විට රජයේ

නිලධාරීන්, විශේෂයෙන් ම පොලිස් නිලධාරීන් ඉදිරිපත් කරනු ලබන කතාව මත රැඳී තව දුරටත් පරීක්ෂණ අනවශ්‍ය වන සේ තීන්දු දීම නිසා බොහෝ සැක කටයුතු මරණ සංඛ්‍යාවක් පිළිබඳ ව පරීක්ෂණ පැවැත්වීම පවා අත්හිටුවිණි. ඒ තත්ත්වය නැවත ඇති නොවන සේ ජීවිතය පිළිබඳ අයිතිය නිර්වචනය කිරීම හා ඊට අදාළ නීති සම්පාදන ප්‍රකාශනයට පත් කිරීම මේ ව්‍යවස්ථාව තුළින් අනිවාර්යෙන් ම සිදු විය යුතු ය.

✦ සැකකරුවන්ට මෙන් ම අපරාධවල වින්දිතයන්ට ද සාධාරණ විනිශ්චයක් සඳහා ඇති අයිතිය ව්‍යවස්ථාව තුළ අඩංගු කළ යුතු අතර, එසේ කළ යුත්තේ ජාත්‍යන්තර නීතිය ප්‍රකාරව ය. ඒ අනුව සාධාරණ විනිශ්චයක් අනිසි පමාවකින් තොර ව සිදු විය යුතු ය. අනිසි පමාවකින් තොර ව සාධාරණ විනිශ්චයක් ලබා ගැනීමට ඇති අයිතිය ප්‍රකාශයට පත් කිරීම මඟින් මේ ලේඛනයේ මීට පෙර සඳහන් කළ, 'නඩු පමාව නැති කර ගැනීම' පිළිබඳ ප්‍රශ්නයත්, ජනතාවගේ විශ්වාසයෙන් බැහැර වුණු හා ජනතා අවඥාවට ලක් වුණු අධිකරණමය ක්‍රියාදාමය පිළිබඳ ප්‍රශ්නයත් නිරාකරණය කර ගැනීමට හැකි වනු ඇත.

✦ ව්‍යවස්ථාව තුළින් වින්දිතයන්ගේ අයිතිවාසිකම්, මානව හිමිකම් අයිතිවාසිකම් ඔස්සේ ප්‍රකාශයට පත් කළ යුතු ය. අද ජාත්‍යන්තරව පිළිගැනෙන වින්දිත අයිතිවාසිකම් නම්,

▲ වින්දිතයාට පොලිසිය හා අධිකරණය ඇතුළු රාජ්‍ය සංස්ථා තුළින් යහපත් සැලකිල්ලක් ලැබිය යුතු ය.
▲ කරදරයට හා හිරිහැරයට භාජනය නොකළ යුතු ය.
▲ ඔවුන්ගේ පැමිණිලි කඩිනමින් වාර්තා විය යුතු ය.
▲ එසේ වාර්තා කළ යුතු වන්නේ නිපුණතාවක් හා පුහුණුවක් ඇති නිලධාරීන් මඟිනි.
▲ ඔවුන්ගේ පැමිණිලි මත කඩිනම් හා අංගසම්පූර්ණ අපරාධ පරීක්ෂණ පැවැත්විය යුතු ය.
▲ එසේ පරීක්ෂණ පැවැත්විය යුත්තේ ද මේ සඳහා නිපුණතාව පුහුණුව ඇති නිලධාරීන් මඟින් විය යුතු ය.

▲ ඒ නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් රජය විසින් ලබා දිය යුතු ය.
▲ නීතිපති දෙපාර්තමේන්තුව මඟින් නඩු පැවරීම පමාවෙන් තොර ව හා දෝෂ විරහිත ව සිදු විය යුතු ය.
▲ අධිකරණ මඟින් අදාළ නඩු අනිසි පමාවකින් තොර ව සිදු කළ යුතු ය.
▲ එසේ නොකිරීමෙන් වින්දිතයනට ඇති වන ආර්ථික මෙන් ම මානසික හානිය වැළැක්විය යුතු ය.
▲ නඩු විභාගයේ දී හා අපරාධයට වරදකරුවන් වූවන්ට දඬුවම් පැමිණ වීමේ දී අධිකරණය වින්දිතයන්ට ද කතා කිරීමේ අවස්ථාව සලසා දිය යුතු ය.
▲ වින්දිතයනට පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය නියෝග අධිකරණ මඟින් කළ යුතු අතර, ඒ සඳහා පහසුකම් රජය විසින් සලසා දිය යුතු ය.
▲ වින්දිතයනට වුණු හානිය වෙනුවෙන් වන්දි ලබා ගැනීමට අවස්ථාව පැවතිය යුතු ය.

ඉහත සඳහන් වින්දිත අයිතිවාසිකම් කඩකිරීම් මූලික මානව හිමිකම් කඩකිරීමක් සේ සැලකිය යුතු අතර, ඒවා සඳහා 1978 ව්‍යවස්ථාවේ 126 වන වගන්තියට හෝ ඊට සමානව යෝජිත ව්‍යවස්ථාවේ ඉදිරිපත් වන ප්‍රතිපාදන යටතේ සහන ලබා ගැනීමට අවස්ථාව සැලසිය යුතු ය.

✦ දැනටමත් 1978 ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ වධහිංසාවට හා කෲර අමානුෂික සැලකිල්ලට විරුද්ධ ව ඇති අයිතිය ප්‍රකාශයට පත් ව තිබෙන නමුත්, ලංකාවේ වධහිංසාව අඩුවක් නැති බව ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවලින් පවා ප්‍රකාශයට පත් කොට ඇත. දැඩි වධහිංසා පිළිබඳ කතා නිරන්තරයෙන් ම අසන්නට ලැබේ. මේ පිළිබඳ ව නොබෝදා අසන්නට ලැබූ සිද්ධිය නම් ඇඹිලිපිටියේ දී සිදු කරනු ලැබූ ඝාතනය හා පහර දීම් පිළිබඳ සිද්ධිය වන අතර, එය සමස්ත ඇඹිලිපිටිය ප්‍රදේශයේ ජනතාව පමණක් නොව මුළු රට ම කම්පාවට පත් කළේ ය. මෙවැනි තත්ත්වයක් පවතින නමුත් මේ ක්‍රියාවලිය නතර කිරීමට පොලිසියේ ඉහළ නිලධාරීන් මඟින්

සාර්ථක පියවර ගෙන නැති බව මේ සිදුවීම් නැවත නැවත වාර්තා වීම මඟින් ම හෙළිදරව් වේ. පොලිසිය තුළ විනය ක්‍රියා මාර්ගය මුළුමනින් ම කඩා වැටී ඇත. එමෙන් ම පොලිස් සංස්ථාව පවත්වා ගෙන යෑමට අවශ්‍ය මූල්‍ය හා වෙනත් සම්පත් ව්‍යවස්ථාදායකය හා විධායකය මඟින් ලබා නොදීම නිසා, ඒ සංස්ථාව පවත්වා ගෙන යෑමට අවශ්‍ය පුහුණුවක් හා දක්ෂතාවක් ඇති නිලධාරීන්ගේ අඩුවක් ද, විකල්ප පරීක්ෂණ ක්‍රම ව්‍යවහාරික විද්‍යාවන් මත ඇති කර ගැනීමට බැරි තත්ත්වයක් ද, අවශ්‍ය තාක්ෂණ පහසුකම් නැති වීම ද ආදි බොහෝ අඩුපාඩුවලින් පොලිස් සංස්ථාව පෙළෙමින් පවතී. එසේ පවතින තාක් දුරට පොලිස් වධහිංසාව හා කෲර සැලකීම නැති නොවනු ඇත. ඒ නිසා වධහිංසාව වැළැක්වීම නමැති අතිශයින් වැදගත් වූ මානව හිමිකම් ලංකාව තුළ ස්ථාපිත කර ගැනීමට නම් මේ පිළිබඳ ව ව්‍යවස්ථාව තුළ ඇති නෛතික පදනම දැන් පවතිනවාට වඩා පොහොසත් එකක් කළ යුතු ය.

✦ ව්‍යවස්ථාමය ප්‍රතිකර්මයක් වශයෙන් ඉදිරිපත් කොට ඇති 1978 ව්‍යවස්ථාවේ 126 වන වගන්තිය ඵල රහිත බව පෙනී යන්නේ, ඒ නීතිය ඇති කිරීමෙන් පසු මානව හිමිකම් කඩවීම් වැඩි වූවා මිස, අඩුවීමක් නොමැති බැවිනි. 126 වන වගන්තිය යටතේ මානව හිමිකම් කැඩුවාය යනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කරනු ලබන ප්‍රකාශනය මඟින් ඇති කරනු ලබන කිසියම් හෝ සාධනීය බලපෑමක් නැත. එසේ මානව හිමිකම් කඩ කළා යැයි ප්‍රකාශයට පත් කරනු ලැබූ නිලධාරීහු, තවදුරටත් ඒ නිලවල ම රැඳී සිටින අතර, ඔවුන්ට ඉහළ තනතුරුවලට යෑමට පවා ඒ ප්‍රකාශනය බාධාවක් නොවේ. එමෙන් ම මානව හිමිකම් කඩවීම සම්බන්ධයෙන් සංකේතාත්මකව පමණක් වන්දි නියම කිරීම මඟින් බොහෝ විට මානව හිමිකමක් කඩවීම යන සංකල්පය ම පවා අවඥාවට ලක්වේ. මේ නිසා මේ නීතිමය ප්‍රතිකර්මය වඩාත් අර්ථ සහිත සේ හා ප්‍රතිඵල ගෙන දිය හැකි සේ නිර්වචනය

විය යුතු ව ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රකාශනයක් නිකුත් කිරීම මඟින් ඇති විය යුතු ප්‍රතිඵල පැහැදිලි ව සඳහන් විය යුතු ය. එමෙන් ම අධිකරණ තීන්දුව දී, කෙටි කාලයක් තුළ නැවතත් ඒ නඩුව අධිකරණය ඉදිරියේ පමුණුවා නඩුවේ තීන්දුව ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ ව අදාළ රාජ්‍ය සංස්ථාව තුළින් වාර්තා කොට ගෙන එය සෑහීමකට පත් විය හැකි ද යන්න අධිකරණය නැවත සලකා බැලිය යුතු ව ඇත.

✦ මානව හිමිකම් කඩවීම් නඩු, මාසයක් ඇතුළත දී පැනවිය යුතුය යන්න අවඥා සහගතය, සාවද්‍ය ය. මෙය වෙනස් කොට මේ නඩු පැවරීම සාධාරණ කාලයක් තුළ සිදු විය යුතුය යන්න ප්‍රකාශයට පත් කළ යුතු ව ඇත.

✦ ආරක්ෂක නිලධාරීන් අතින් සිදු වන ඝාතන හා වධහිංසා පිළිබඳ චෝදනා අධිකරණය ඉදිරියේ සලකා බැලීමේ දී ඒ පිළිබඳ ව ඉදිරිපත් කොට ඇති පෙත්සම තව දුරටත් විභාගයට භාජනය කළ යුතු යැයි අධිකරණය නිගමනය කරන අවස්ථාවේ දී ඒ සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ ඒකකයක් මඟින් පරීක්ෂණයක් පවත්වා ඒ පරීක්ෂණයේ වාර්තාව අධිකරණය වෙත සාධාරණ කාලයක් තුළ ගොනු කළ යුතුය යන්න සම්බන්ධයෙන් ද අධිකරණය විසින් නියෝගයක් නිකුත් කළ යුතු ව ඇත. මේ මඟින් සිද්ධිය පිළිබඳ ව සාධාරණ අවබෝධයක් කෙටි කාලයක් තුළ දී අධිකරණයට ලබා ගත හැකි වනු ඇත. මෙහි දී ද නඩු පමාව පිළිබඳ ප්‍රශ්නය අධිකරණය විසින් සලකා එය වළක්වා ගැනීම සඳහා ප්‍රතිසංස්කරණයන් ද මේ ව්‍යවස්ථාව තුළට ගොනු කළ යුතු ව ඇත.

මෙයට අත්සන් තැබූ අයගේ නම් සහ සංවිධානය

1	ගරු නන්දන මනතුංග පියතුමා	මහනුවර මානව හිමිකම් කාර්යාලය
2	ගරු මේබල් පැවදි සොයුරිය	මහනුවර මානව හිමිකම් කාර්යාලය
3	නීතීඥ පද්මදක්ෂන් මහතා	මහනුවර මානව හිමිකම් කාර්යාලය
4	පිලිප් දිසානායක	රයිට් ටු ලයිෆ් මානව හිමිකම් ආයතනය
5	සංජය ප්‍රනාන්දු	රයිට් ටු ලයිෆ් මානව හිමිකම් ආයතනය
6	තරංග පටබැඳි	රයිට් ටු ලයිෆ් මානව හිමිකම් ආයතනය
7	වසන්ත රනිල්	රයිට් ටු ලයිෆ් මානව හිමිකම් ආයතනය
8	ප්‍රසංග ප්‍රනාන්දු	රයිට් ටු ලයිෆ් මානව හිමිකම් ආයතනය
9	යූ.එල්.ඒ. ජෝසප්	ගම්පහ දිස්ත්‍රික් පුරවැසි කමිටුව
10	දූෂන්ත නිරංජන්	ගම්පහ දිස්ත්‍රික් පුරවැසි කමිටුව
11	කිංස්ලි කරුණාරත්න	කොළඹ රූල් ඔෆ් ලෝ සංවිධානය
12	ඉනෝමා කරුණාතිලක	කොළඹ රූල් ඔෆ් ලෝ සංවිධානය
13	චිත්‍රාල් පෙරේරා	ජනසංසදය
14	අමිතා ප්‍රියන්ති	ජනසංසදය
15	නිලූකා ප්‍රියදර්ශනී	ජනසංසදය
16	සරත් සිල්වා	මහනුවර මානව හිමිකම් කාර්යාලය
17	ඇන්ටන් පෙරේරා	මහනුවර මානව හිමිකම් කාර්යාලය
18	අනෝමා සිල්වා	මහනුවර මානව හිමිකම් කාර්යාලය
19	සෙනරත් සිසිර කුමාර	මහනුවර මානව හිමිකම් කාර්යාලය
20	ශිරෝමි ලෝවි	මහනුවර මානව හිමිකම් කාර්යාලය
21	ලූසිල් අබේකෝන්	මහනුවර මානව හිමිකම් කාර්යාලය
22	ශෂිකලා කුරේ	මහනුවර මානව හිමිකම් කාර්යාලය
23	අමරසිංහ කලල්දොර	මහනුවර සෙටික් ආයතනය
24	ඒ.කේ.ලතා	ගාල්ල කාන්තා ශක්ති සංවර්ධන පදනම
25	ටී.එච්. මාලනී	ගාල්ල කාන්තා ශක්ති සංවර්ධන පදනම
26	සෝමා හෙට්ටිගේ	ගාල්ල කාන්තා ශක්ති සංවර්ධන පදනම
27	එච්. එච්.පී. මංගලරත්න	මාතලේ සිවිල් සංවිධානය
28	චමින්ද සමරසිංහ	මහනුවර ටෘ පදනම
29	ගාමිණී රත්න ගුණසේන	මහනුවර ටෘ පදනම
30	ඒ.එච්. ස්ටීවන්	මහනුවර පුරවැසි හවුල
31	රංජනී ජයලත්ගේ	දෙනියාය ආයුර්වේද වෛද්‍ය
32	ශ්‍රීමා බෝපිටිය	බලංගොඩ සාරතී කාන්තා සංවිධානය

33	ශ්‍යාමා සුබසිංහ	ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය
34	පී.ජී. පොඩිනෝනා	ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය
35	ශාන්ති සමරවීර	ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය
36	සමන්ති මංජුලා	මහනුවර සොබා රිද්ම සංවිධානය
37	ඩබ්.එම්. වීරසේකර	මහනුවර පුරවැසි හවුල
38	බැසිල් ප්‍රනාන්දු මහතා	ආසියානු මානව හිමිකම් කොමිසම

4 පරිච්ඡේදය

ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම ඔක්කොමගේම වැඩක්

නව ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීම සඳහා සාකච්ඡාව ආරම්භ වී ඇත. රටේ විවිධ ප්‍රදේශවල ජීවත් වන ජනතාව සමඟ මේ සාකච්ඡාව ගෙන යෑම සඳහා ව්‍යවස්ථා සංශෝධන කමිටුවක් පත් කරන ලදි. ඒ කමිටුව දැනටමත් කොළඹ මෙන් ම තවත් ප්‍රදේශ ගණනාවකත් ජනතා හමුවීම් පවත්වා ඇත. ඒ හමුවීම්වල දී බොහෝ දෙනෙක් කමිටුව ඉදිරියට පැමිණ විවිධ කරුණු ඉදිරිපත් කොට ඇත.

මේ හැර කමිටුවට ලිඛිත ව කරුණු ඉදිරිපත් කිරීම සඳහා ද අවස්ථාව සලසා ඇති අතර, ඉතා සැලකිය යුතු ප්‍රමාණයකින් ලිඛිත කරුණු දැක්වීම් ද ගලා එමින් පවතින බව කොමිටිය විසින් නිවේදනය කොට ඇත.

මේ හැර රටේ මාධ්‍ය තුළින් ද ව්‍යවස්ථාව පිළිබඳ ව ලිපි හා සම්මුඛ සාකච්ඡා ප්‍රකාශයට පත් කරමින් පවතී. ලිඛිත හා විද්‍යුත් මාධ්‍යයන් තුළ ව්‍යවස්ථාකරණය පිළිබඳ ව උනන්දු සහගත සාකච්ඡාවක් පටන් ගනිමින් පවතින බව පෙනෙන්නට තිබේ.

ව්‍යවස්ථාකරණය පිළිබඳ ව සාකච්ඡාව ඉස්මතු වෙත්ම මේ සාකච්ඡාව ඉදිරියට ගෙන යෑම සඳහා ඉමහත් ගැටලු ද පවතින බව පෙනෙන්නට පටන් ගෙන ඇත. ඒ ගැටලු සමහරක් මෙසේ ය.

ව්‍යවස්ථාවක් යනු කුමක් ද? යන්න පිළිබඳ ව අවබෝධය පසුගිය කාලයේ රට තුළ අහෝසි වී යෑම;

ලංකාවේ නීතිවේදීන් හා බුද්ධිමතුන් අතර පවා ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීම සඳහා මතුවෙන දාර්ශනික, නෛතික හා දේශපාලන සංකල්පමය කරුණු පිළිබඳ ව ඉතා කැපී පෙනෙන ශූන්‍යතාවක් පැවතීම.

1972 හා 78 ව්‍යවස්ථා මඟින් ලංකාවේ ව්‍යවස්ථා නීතිය පිළිබඳ ව ඇති කර තිබෙන ඉතා බරපතළ ප්‍රශ්න පිළිබඳ ව අවබෝධය ඉතා පහළ මට්ටමක පැවතීම;

දේශපාලන සාකච්ඡාවේ දී ව්‍යවස්ථාව පිළිබඳ ගැටලුව පිළිබඳ ව ඉතා සරල මට්ටමක අවබෝධයක් නිර්මාණය වීම හා ඒ සරල අවබෝධය ප්‍රචාරක මාධ්‍ය තුළින් සමාජගත වීම;

නව ව්‍යවස්ථාව පිළිබඳ ව මූලිකත්වය ගන්නා දැනට පවතින ආණ්ඩුව තුළ ම තමන් ව්‍යවස්ථාව සම්බන්ධයෙන් අත්පත් කර ගැනීමට උත්සාහ කරන්නේ කුමන අරමුණක් ද යන්න ගැන පැහැදිලි අවබෝධයකින් තොර වීම;

1978 ව්‍යවස්ථාව තුළින් දූෂණයට හා බලයට අයුතු ලෙස යොදා ගැනීමට ඇති ඉඩකඩවලින් විශාල ලෙස ලාභ ලැබූ කණ්ඩායම් තුළ මේ තත්ත්වය වෙනස්වීමට විරුද්ධ ව ඉතා බරපතළ විරෝධයක් පැවතීම මේ ගැටලු අතර ප්‍රධාන තැනක් ගනී.

ව්‍යවස්ථාවක් යනු කුමක් ද? යන්න පිළිබඳ ව අවබෝධය පසුගිය කාලයේ රට තුළ අහෝසි වී යෑම;

ලංකාව යටත්විජිතයක් ව පැවති කාලයේ අග භාගයේදීත් ඉන් පසු නිදහස ලැබීමෙන් පසු මුල් කාලයේදීත් ව්‍යවස්ථාවක් යනු කුමක් ද යන්න පිළිබඳ ව සැලකිය යුතු අවබෝධයක් ලංකාව තුළ පැතිර පැවතිණ. අධිකරණය තුළත්, විශේෂයෙන් ම ඉහළ අධිකරණවල විනිශ්චකාරුවන් තුළත්, රටේ නීතිඥයින් අතරත්, දේශපාලනඥයන් හා රජයේ නිලධාරීන් අතරත්, පොදුවේ වැඩි අධ්‍යාපනයක් තිබූ සියලු දෙනා අතරත් ව්‍යවස්ථාවකින් කුමක් බලාපොරොත්තු වේ ද යන්න පිළිබඳ ව සැලකිය යුතු අවබෝධයක් පැවතිණ. ඒ අවබෝධය වර්ධනය වීම කරා බලපෑ විවිධ හේතූන් ද පැවතුණේ ය. නිතර ම ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ව්‍යවස්ථානුකූල භාවය පිළිබඳ ව කරුණු මතු කරමින් පෙත්සම් ඉදිරිපත් කිරීමේ පුරුද්ද එකල පැවතියේ ය. යම් පනතක ව්‍යවස්ථානුකූල භාවය පිළිබඳ ව මතුකරන ලද ප්‍රශ්න ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ දී තර්කයට භාජනය විය. එකල රටේ සිටි දක්ෂම නීතිඥයන් විවිධ පාර්ශ්වයන් නියෝජනය කරමින් මේ

පිළිබඳ ව කරන ලද දේශනා හා තර්ක පුවත්පත් මඟින් ජනතාව අතරට පත් විණි. මේ පුවත් පත් වාර්තා ජනතා අධ්‍යාපනය කෙරෙහි බොහෝ සේ බලපෑවේ ය. ඒ වාර්තාවල කියවුණු කරුණු මත පදනම් වී ගම්වල ගැමියන් අතර පවා මේ ප්‍රශ්න සාකච්ඡාවට භාජන විය. ජන සාකච්ඡා තුළින් ජන විඥානය දියුණු විය.

එසේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ගෙන යන ලද පෙත්සම්වලට අදාළ ව නඩු තීන්දු විටින් විට ප්‍රකාශයට පත් විය. බොහෝ විට රජයේ ස්ථාවරය ප්‍රතික්ෂේප කරමින් පෙත්සම්කරුවන්ට පක්ෂ ව තීන්දු කරන ලද නඩු බොහෝ ය. එවැනි නඩු තීන්දු පිළිබඳ ව වැඩි උනන්දුවක් නීති කර්තව්‍යයන්ට සමීප ව කටයුතු කරන්නන් අතර මෙන් ම රට පුරා ම ද ප්‍රකාශයට පත් විය. මේ ආකාරයෙන් වක්‍රාකාරයකින් වුව ද ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉතා විශාල අධ්‍යාපනයක් පතුරුවාලීමේ කටයුත්තක් ඉටු කෙරිණි. වඩා සරල ව කිවුවොත් ශ්‍රේෂ්ඨාධිකරණය නීතිය පිළිබඳවත් විශේෂයෙන් ම රටේ මුල් ම නීතිය වන ව්‍යවස්ථාව පිළිබඳවත් මුළු රටට ම කියා දීමේ ගුරුවරයෙකුගේ කාර්යය ද ඉටු කළේ ය.

එවැනි තවත් ගුරුවරයෙකු වූයේ ලංකාවේ පාර්ලිමේන්තුව මෙන් ම සෙනේට් සභාවත් ය. මේ සභා ඉදිරියේ එදා කෙරුණේ ව්‍යක්ත සාකච්ඡාවකි. දේශපාලන න්‍යායේත් නෛතික න්‍යායන්හීත් පදනම වූ ආණ්ඩු පක්ෂයේ මෙන් ම විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඔවුන්ගේ කථා මඟින් නීතිය පිළිබඳ ව විවිධ පැති සමස්ත ජනතාව ඉදිරියට පැමුණුවෝ ය. මේ අතින් ලෝකයේ දියුණු රටවල පාර්ලිමේන්තු ගර්භයන්හි දී පවත්වන ආකාරයේ කතිකාවතක් ලංකාවේ ද පවත්වා ගෙන යනු දැක ගැනීමට එදා රට වැසියාට හැකි විය. රටේ බලය පිළිබඳ ව ප්‍රධාන කේන්ද්‍රයක් වන පාර්ලිමේන්තුව තුළ ඇති වූ කථාබහ ජන ප්‍රවාදයන් බවට පත් වීම පුදුමයට කරුණක් නොවේ. එය ලෝකයේ සැම දියුණු ව්‍යවස්ථාදායකයකින් ම සිදු වන රටකට ඉතා ම අවශ්‍ය වූ කතිකාවන් සිදු වන කර්තව්‍යයකි. පාර්ලිමේන්තුවේ ඇති වන කතිකාව මාධ්‍යයන් තුළ ද තවත් කතිකාවන්ට මඟපාදන ලදි. එමෙන් ම ආණ්ඩු පක්ෂයේ මෙන් ම විරුද්ධ

පක්ෂයේ මන්ත්‍රීවරුන් ද ඔවුන් රට පුරා පැවැත්වූ දේශපාලන රැස්වීම්වලට පාර්ලිමේන්තුවේ දී ඔවුන් ඉදිරිපත් කරන මත ගෙන යන ලදි. මේ ආකාරයෙන් දේශපාලන රැස්වීම්, පසුකාලයේ දී සිදු වූවා මෙන් වල් පල් දොඩන තැන් නොව ජන විඥානය දියුණු කරන අවස්ථාවන් විය.

ජන විඥානයේ ස්වභාවය නම් එක් සාකච්ඡාවක් මඟින් තව සාකච්ඡාවල් බොහෝමයක් නිර්මාණය කිරීම ය. මෙසේ ඇති වන සාකච්ඡාවල් රටේ ජනයා අධ්‍යාපනය ලබන ජන පාසල් සේ සඳහන් කළ හැකි ය.

මේ හැර රටේ විශ්ව විද්‍යාල තුළ විශේෂයෙන් ම ඒ විශ්ව විද්‍යාලවල නීති පීඨ හා දේශපාලන විද්‍යා පීඨ තුළ ව්‍යවස්ථා නීතිය පිළිබඳ ව අධ්‍යාපනය ලබා දීමක් සිදු විය. රටේ පාසල් තුළ ප්‍රජාචාරය වැනි විෂයන් මඟින් රටේ දේශපාලන ව්‍යුහය පිළිබඳ ව අවබෝධයක් ඇති කරන ලදි.

විශේෂයෙන් ම රටේ සිවිල් සේවය තුළ නීතිය පිළිබඳ ව ඉතා තියුණු අවබෝධයක් පැවතිණ. සිවිල් සේවා ආයතන තුළ එදිනෙදා තීන්දු ගැනීමේ දී රටේ නීතියේ ප්‍රතිපත්ති තුළ පිහිටා ඒ තීන්දු ගත යුතුය යන අදහස ගැඹුරින් ම පැලපදියම් වී පැවතිණ. ඒ නිසා සිවිල් සේවයේ ආයතන තුළ උඩ සිට යටට නීතිය මත පදනම් වූ සංවිධාන ගැටලු හා ප්‍රශ්න විසඳීමේ ක්‍රම විසිරී පැතිරිණ.

රටේ පොලිස් සේවය තුළ රටේ ව්‍යවස්ථාවත් රටේ නීතියත් පිළිබඳ ව අවබෝධය වර්ධනය කිරීම නිරන්තරයෙන් සිදු විය. අපරාධ පරීක්ෂණ කිරීමේ දී මෙන් ම ඒවා අධිකරණයට වාර්තා කිරීමේ දී, ඉන් පසු අධිකරණය ඉදිරියේ නඩු පවත්වා ගෙන යෑමේ දී සියලු ම කටයුතු කර ගෙන යන ලද්දේ ව්‍යවස්ථාවෙන් ඉදිරිපත් කරන ලද ව්‍යුහය හා ඒ ව්‍යුහය පදනම් වූ දාර්ශනික හා නෛතික සංකල්පයන් මඟිනි.

මේ ආකාරයෙන් දළ වශයෙන් ඉදිරිපත් කළේ ලංකාව තුළ ව්‍යවස්ථාමය නීතිය හා එය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ ව ජනතාව තුළ අවබෝධයක් නිර්මාණය කළ ආකාරයන් ය.

අභාග්‍යයට මෙන් 1972 ව්‍යවස්ථාවෙන් පසු හා විශේෂයෙන් ම 1978 ව්‍යවස්ථාවෙන් පසු ඉහත සඳහන් සැම මූලාශ්‍රයක් ම වියළී යෑම දැකිය හැකි ය. මෙයට හේතුව වූයේ මේ ව්‍යවස්ථා

දෙක මඟින් ම එතෙක් පැවති ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථා ව්‍යුහය හා සංකල්පයන් අස්ථානගත කිරීම හා ක්‍රමයෙන් අතහැර දැමීම ය. මේ ආකාරයෙන් ලංකාව තුළ සිදු වූ මහා පරිමාණ පසුබෑසීම නිසා රටේ ජන විඥානයේ ඇති වූ විශාල අඳුර විස්තර කිරීමට බැරි තරම් ඉමහත් ය. ඇත්තෙන් ම නෛතික කටයුතු පිළිබඳ ව හා දේශපාලන ව්‍යුහය පිළිබඳ ව ජන විඥානය අතින් ලංකාව කාන්තාරයක් බවට පත්වීමට පටන් ගත්තේ ය. අද ලංකාව වනාහි නෛතික බුද්ධිය සම්බන්ධයෙන් කාන්තාරයකි. ඒ කාන්තාරයේ ජීවත් වන මිනිසුන්ට තෝතැන්නක දැකිය හැකි ජීවන නිර්මාණය දැක ගත නොහැකි ය.

එවැනි පසුබිමක් තුළ අවුරුදු 40 ක් පමණ කාලයක් අඛණ්ඩ ව ජීවත් වී ඇති ලාංකීය ජනතාව තුළින් ව්‍යවස්ථාව පිළිබඳ ව අවබෝධය තුරන්ව තිබීම පුදුමයක් නොවේ. වඩාත් අවාසනාවන්ත කණ්ඩායම නම් 1972 න් පසු කාලයේ දී උපත ලැබූවන් ය. ඔවුන්ගේ ජීවිතය ඔවුන් ගෙවා ඇත්තේ බුද්ධිමය වශයෙන් හා නෛතික වශයෙන් කාන්තාරයක් වශයෙන් සැලකිය යුතු තැනක ය.

ව්‍යවස්ථා ක්ෂේත්‍රය තුළ පාවිච්චි වන වචන මාලාවන් උදාහරණයක් වශයෙන් බලය බැඳ තැබිය යුතුය යන ආකල්පය, බල බෙදීම පිළිබඳ ව ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය, බල සංවර්ධනය හා තුලනය පිළිබඳ සංකල්පය, නීතියේ ආධිපත්‍යය හා නීතිය මත පාලනය යන සංකල්පය, අධිකරණයේ අධිකාරීත්වය හා අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ සංකල්පය, අධිකරණමය විමර්ශනය පිළිබඳ සංකල්පය ප්‍රජාතන්ත්‍රවාදී වශයෙන් බලවත් වූ රාජ්‍ය සංස්ථා තුළින් රටේ පිළිවෙළ අවුල් වීමට නොදී යෑම පිළිබඳ සංකල්පය පුද්ගලයා ආරක්ෂා කිරීමට රජයකට පැවරී ඇති පරම යුතුකම වටා ගෙතුණු නෛතික සංකල්පයන් මානව හිමිකම් රැකීම පිළිබඳ ව පවතින ව්‍යවස්ථාමය වගකීම් ආදි තවත් දීර්ඝ ව විස්තර කළ හැකි සංකල්පයන් ගණනාවක් පිළිබඳ ව ම ඔවුන් තුළ අබමල් රේණුවක තරමවත් අවබෝධයක් පවතින්නේ නැත.

දකින දෙයින් ඉගෙන ගැනීම මනුෂ්‍යයන් අධ්‍යාපනය ලබා ගන්නා ආකාරයයි. තමන්ට දකින්නට නොමැති දෙයක් සිතින් මවා ගැනීමේ හැකියාවක් ඇත්තේ නැත. බොහෝ විට එසේ මවා ගැනීමට උත්සාහ කළහොත් අප දකින්නේ විලම්බීත පමණකි.

අද ලංකාවේ ජීවත් වන්නේ ව්‍යවස්ථාමය හා නීතිමය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විලම්බීතයට පත් වූ මිනිසුන් හා ගැහැනුන් ය.

එවැනි විලම්බීත මානසික තත්ත්වයකින් පසුවන මිනිසුන්ට තමන්ගේ ම ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීමේ හැකියාව පවතී ද? මෙය ඉතා ලෙහෙසියට පිළිතුරු දිය හැකි ප්‍රශ්නයක් නොවේ. කෙසේ වුවත් අඩුම වශයෙන් කිව හැක්කේ ඒ විලම්බීත භාවය දුරස්ථ කොට යම් අවබෝධයක් ඇති කිරීමේ ප්‍රයත්නයකින් තොර ව රටට උචිත වූත් ජනතාවගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික ජීවිතයට පදනම සලසන්නා වූත් ව්‍යවස්ථාවක් ගොඩනැඟීම විශ්ව කර්මයාටවත් කළ නොහැකි කර්තව්‍යයකි.

මේ නිසා මේ අවස්ථාවේ දී ගත යුතු මූලික ම පියවර වන්නේ ව්‍යවස්ථා නීති සම්ප්‍රදායන් පිළිබඳවත්, අඩුම වශයෙන් නිදහස ලැබූ මුල් කාලයේ පැවති අවබෝධය පිළිබඳ ව දැනුවත් කිරීමක් ඇති කිරීම සඳහා රජය විසින් බලවත් පියවරක් ගත යුතු බව ය. මේ අතර සිවිල් සමාජය විසින් එවැනි ම බලවත් පියවරක් ගත යුතු ව ඇත.

මතක තබා ගත යුතු ඉතා ප්‍රධාන සත්‍යයක් වන්නේ බොරුවෙන් බොරුව පමණක් ම නිර්මාණය වන බවත්, හා විලම්බීතයකින් විලම්බීතයක් පමණක් නිර්මාණය වන බවත් ය. ව්‍යවස්ථාවක් ගොඩනඟා ගැනීම සඳහා දැන් සිදු වන කාර්යය එවැන්නක් නොවේවාය යන්න රටවැසියාගේ අනාගතය පිළිබඳ ව ළබැඳියාවක් ඇති කාගේත් ප්‍රාර්ථනයයි.

නීතිවේදීන් හා බුද්ධිමතුන් අතර පවා ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීම සඳහා මතුවෙන දාර්ශනික, නෛතික හා දේශපාලන සංකල්පමය කරුණු පිළිබඳ ව ඉතා කැපී පෙනෙන ශූන්‍යතාවක් පැවතීම.

1971 කැරැල්ල හා එය මර්දනය කිරීමේ දී අනුගමනය කරන ලද සීමා විරහිත මර්දනයෙන් පටන් ගෙන මේ දක්වා පවතින කාලය ලංකාවේ බුද්ධිමය ක්ෂේත්‍රයේ අතිමහත් ව්‍යාකූලත්වයක් හා අධෛර්මත් කිරීමක් පැවති කාලයකි. මේ කාලය තුළ එතෙක් ලාංකීය සමාජය තුළ පිළිගැනී තිබූ සැම මූලික ශිෂ්ට සම්ප්‍රදායක් ම අතහැර දැමීම සිදු විය. ඒ තුළින් මතු වූ පණිවිඩය වූයේ

බුද්ධියට හා ප්‍රඥාගෝචර භාවයට මේ සමාජය තුළ ඉඩක් නැති බව ය. විශේෂයෙන් ම දේශපාලනික, සමාජීය හා නෛතික කටයුතු සම්බන්ධයෙන් බුද්ධිමය ගවේෂණයෙහි හා ක්‍රියාවේ නියැළීම නිෂ්ඵල වූ ක්‍රියාවක් සේ පෙනෙන්නට විය. නිෂ්ඵල වූ ක්‍රියාවන්හි යෙදීමට සාමාන්‍යයෙන් කවුරුත් අකමැති වීම ස්වභාවික ය. එහෙත් එසේ රටක බුද්ධිමය ජීවිතය කඩා වැටීම ඉතාමත් අගතිගාමී ප්‍රතිඵල ගෙන දෙයි. මේ අනුව ඉහත සඳහන් කාලය එක්තරා අතකින් බුද්ධිමය ජීවිතයේ පසුබෑමකුත්, අනෙක් අතින් බුද්ධිමය ජීවිතයෙන් ශක්තිය නොලබන සමාජය තුළ පසුගාමීත්වය ඉතා විශාල ව රෝපණය වූත් කාලයක් විය.

මේ තත්ත්වය වඩාත් උග්‍ර කළේ ඒ කාලයෙන් වැඩි කොටසක් පුරා රට තුළ වර්ධනය වූ ප්‍රචණ්ඩ තත්ත්වයයි. 1987 පැවති පාර්ලිමේන්තු මැතිවරණය ඉතා විශාල ජයග්‍රහණයක් එක්සත් ජාතික පක්ෂයට ලබා දුන් අතර, ඒ ජයග්‍රහණයේ ප්‍රසාදය ඒ පක්ෂය විසින් ප්‍රකාශයට පත් කළේ පොලිසියට 'සති තුනක නිවාඩුවක්' ලබා දීම මඟින් රට පුරා අතිමහත් ප්‍රචණ්ඩත්වයක් ජනනය කිරීමෙනි. සියයකට අසූවකට වඩා වැඩි ඡන්ද බලයක් පාර්ලිමේන්තුව තුළ එක්සත් ජාතික පක්ෂය විසින් ලබා ගැනීම ද එතෙක් රටවැසියා පුරුදුව සිටි විරුද්ධ පක්ෂ දේශපාලනයේ අතිවිශාල පසුබැස්මක් ඇති කළේ ය. සියලු ම වර්ගයේ විවේචන හා විරෝධතා ක්‍රියාවන් නිෂ්ඵල ප්‍රයත්නයක් සේ පෙනෙන්නට වූයේ, එතරම් විශාල බලයක් පාර්ලිමේන්තුව තුළ තිබූ ඒ ආණ්ඩුව මහා යෝධයෙකු සේ පෙනෙන්නට වූ නිසා ය. ඒ ආකාරයෙන් විරුද්ධ පක්ෂයේ දේශපාලනය රට තුළ යටපත් වීම ද, බුද්ධිමය ක්ෂේත්‍රය තුළ දී බියසුලු බවක් පැතිරීමටත්, ඒ නිසා ම බොහෝ දෙනෙකු නිහඬ කිරීමටත් හේතුවක් විය. දේශපාලන ක්ෂේත්‍රය තුළ සියලු ම සුපුරුදු රටාවන් යටපත් වී ගියේ ය.

මෙය අධිකරණ ක්ෂේත්‍රය තුළට ද බලපෑවේ ය. ආණ්ඩුවට විරුද්ධව තීන්දු දීම නිෂ්ඵල ක්‍රියාවක් සේ පෙනෙන්නට විය. මන්ද යත් එවැනි තීරණ මේ බලවත් ආණ්ඩුව විසින් නොතකා හැරියහොත් ඒ ගැන අධිකරණයට කළ හැකි දෙයක් නැති විය. මේ ආකාරයෙන් යුක්තිය සෙවීම සඳහා වූ ඉඩකඩ වැසී ගියේ ය. එක්තරා අසරණ කමක් සියලු ම විරෝධතා ව්‍යාපාර තුළ හා විරෝධතාකරුවන් අතර පැතිර ගියේ ය.

ආණ්ඩුව විසින් කරන නීති විරෝධී විය හැකි ක්‍රියා පිළිබඳ ව අධිකරණය ඉදිරියේ දී නඩු පවරා ඒවා අභියෝගයට පත් කරන තත්ත්වය මුළුමනින් ම මෙන් නැති ව ගියේ මෙවැනි බලගතු ආණ්ඩුවකට විරුද්ධ ව කරනු ලබන විවේචන හා විරෝධතාවලින් කිසිදු සාර්ථකත්වයක් අත්පත් කොට ගත නොහැකිය යන අදහස සමාජය පුරාත්, නීතිඥ වෘත්තිය තුළත් බොහෝ දුරට අධිකරණය තුළටමත් ගමන් කිරීම නිසා ය.

සියලු ම ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන් හා ප්‍රතිපත්ති යටපත් කළා වූ 1978 ව්‍යවස්ථාව සැලකිය යුතු නීතිමය අභියෝගයකට යටත් නොකරන ලදි. අගවිනිසුරු නෙවිල් සමරකෝන් පවා මේ ව්‍යවස්ථාව වරදක් නොමැති ව්‍යවස්ථාවක් සේ පිළිගත්තේ ය. එය පුදුම සහගත ක්‍රියාවකි. නෙවිල් සමරකෝන් විනිශ්චයකාර තුමා රාජ නීතිඥයෙකු වූවා පමණක් නොව සිවිල් නීතිය පිළිබඳ ක්ෂේත්‍රයේ දී ඔහු ලංකාව තුළ සිටි ප්‍රබල ම පෙළේ නීතිඥයෙක් ද විය. මේ 1978 ව්‍යවස්ථාව අංග සම්පූර්ණව ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කරන බවත්, නීතියේ ආධිපත්‍යය හා නීතිය මත පාලනය යන ප්‍රබල නෛතික ප්‍රතිපත්තීන්ගෙන් වෙන්ව හුදු හිතුවක්කාර පාලනයක් ඇති කළ හැකි නෛතික සම්ප්‍රදායක් ඇති කරන බවත් නෙවිල් සමරකෝන් වැන්නෙකුට පවා නොපෙනුණේ ඇයි?

පාර්ලිමේන්තුවේ තිබූ බලයත්, අලුතෙන් ඇති කර ගන්නා ලද ව්‍යවස්ථාවෙන් අත්පත් කර ගත් අසීමිත බලයත් දැතින් ගත් විධායක ජනාධිපතිවරයා ඔහුගේ ප්‍රධාන ප්‍රහාරය එල්ල කළේ ලංකාවේ කම්කරු ජනතාවට ය. 1980 දී ඇති වූ මහා වැඩ වර්ජනය නවත්වාලූයේ වර්ජනයේ යෙදුණු සියලු ම කම්කරුවන් රැකියාවලින් ඉවත් කර දැමීම තුළිනි. එසේ රැකියා විරහිත වූ සංඛ්‍යාව හතළිස් දහසකට වැඩි ය. මේ අතර විරුද්ධ පක්ෂයේ රැස්වීම්වලට පහර දීම් ද නොකඩවා කෙරිණ. ප්‍රබල බුද්ධිමතෙකු හා නාට්‍ය ශිල්පියෙකු වූ සරච්චන්ද්‍ර මහතා වැනි අයට ද පහර දෙන ලදි.

මේ අතර ජනාධිපතිවරයාට මැතිවරණයක දී අභියෝගයක් ඉදිරිපත් කිරීමට හැකි ව සිටි එකම දේශපාලනඥයා වූ සිරිමාවෝ බණ්ඩාරනායකගේ සිවිල් අයිතිවාසිකම් අහෝසි කර දමන ලදි. මෙය ද ලංකාවේ දේශපාලන ව්‍යුහය තුළ විශාල පසුබැස්මක් ඇති කිරීමට සමත් විය.

මේ සියල්ල වටා ගොඩනැගෙන්නට වූයේ දැඩි ප්‍රචණ්ඩත්වයකි. 1983 කළු ජූලිය, එදා පැවති නීති රහිත තත්ත්වයත් අරාජික තත්ත්වයත් ඉතා ඉහළින් ම පිළිබිඹු කළේ ය. ඉන් පසු කාලය තුළ උතුරේ හා නැගෙනහිර වර්ධනය වූයේ සිවිල් යුද්ධ තත්ත්වයකි. ඒ සිවිල් යුද්ධ තත්ත්වය තුළ හමුදාව තරකර ගැනීම කාගේත් උවමනාවක් බවට පත් විය. මානව අයිතිවාසිකම් ඉල්ලා සිටීම දේශද්‍රෝහි ක්‍රියාවක් සේ හන්වඩු ගැසිණ. යුද්ධයේ සීනුව වඩ වඩාත් පැතිරෙත්ම බුද්ධියට තිබූ ඉඩකඩ එපමණකටම නැති වී ගියේ ය.

මේ ඉතා භයානක කාලය තුළ නීතියේ තැන හදිසි නීතිය හා ත්‍රස්තවාදී විරෝධී නීතිය මඟින් ආදේශ විය. මෙහි අදහස වූයේ ඇත්තෙන් ම අපරාධකාරී ක්‍රියාවන් වූ දේ සාධාරණ ආත්මාරක්‍ෂාව සඳහා කරන ප්‍රයත්නයන් සේ ඉදිරිපත් කිරීම ය.

මේ ආකාර අර්බුදයක් තුළ නීතියටත් අධිකරණයටත් ඇති තැනක් නැත. ඒ නිසා මේ කාලය පුරා ම නීතිය පිළිබඳ ව කථා කිරීමට, වාද විවාද කිරීමට, පොතපත ලිවීමට හා වෙනත් ආකාරවලින් නීතිමය විෂය ක්‍ෂේත්‍රය පළල් කිරීමට යම් පියවරක් ගත හැකි බුද්ධිමය ක්‍ෂේත්‍රය මුළුමනින් ම නැති වී ගියේ ය.

ව්‍යවස්ථා නීතිය හා ව්‍යවස්ථා සම්ප්‍රදාය කාගේවත් සැලකිල්ලට නුසුදුසු කිසිදු ප්‍රායෝගික ශක්තියක් නැති ක්‍රියාවන් සේ දැකීමට රටේ වැඩි කොටසක් නැඹුරු වීම ම නීතිය පිළිබඳ අවබෝධය හා දැනීම රට තුළින් බැහැර කරලීමට හේතු විය.

1972 හා 78 ව්‍යවස්ථා මඟින් ලංකාවේ ව්‍යවස්ථා නීතිය පිළිබඳ ව ඇති කර තිබෙන ඉතා බරපතළ ප්‍රශ්න පිළිබඳ ව අවබෝධය ඉතා පහළ මට්ටමක පැවතීම:

72 ව්‍යවස්ථාවෙන් හා 78 ව්‍යවස්ථාවෙන් යම් වැරැද්දක් වූ බව පිළිබඳ ව පිළිගැනීමක් යම් අධ්‍යාපනයක් ඇති අය අතර පවතී. එහෙත් ඒ වැරැද්ද හෝ වැරැදි මොනවා ද? යන්න ගැන පැහැදිලි අවබෝධයක් නොපවතී. ඒ නිසා ම 1978 ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු ද? මුළුමනින් ම ඉවත් කළ යුතු ද? යන ප්‍රශ්නයට පවා පැහැදිලි පිළිතුරක් දීමට ප්‍රධාන පෙළේ දේශපාලනඥයන් මෙන් ම නීතිවේදීන් ද අසමත් වී ඇත. ව්‍යවස්ථා නිර්මාණයේ යෙදෙන

සමහර නීතිවේදීන් පවා දරන මතය වන්නේ යම් වෙනස්කම් ඇති කොට 1978 ව්‍යවස්ථාවම පවත්වා ගෙන යා යුතු බව ය. මෙයින් පෙනෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක අත්‍යවශ්‍ය අංග මොනවා ද? යන්න පවා පිළිබඳ ව අවබෝධය ඉතා පහළ මට්ටමක පවතින බව ය.

1972 කේ ව්‍යවස්ථාවෙන් කරන ලද්දේ රටේ පවතින යම් නීතියක් නීත්‍යනුකූල ද? නැද්ද? යන ප්‍රශ්නය ඕනෑ ම වේලාවක ඉහළ අධිකරණයක් ඉදිරියේ දී ප්‍රශ්න කිරීමට තිබූ පළල් ඉඩකඩ නැති කර දැමීම ය. ව්‍යවස්ථා නීතිය තුළ මෙසේ පනත් නීත්‍යනුකූල ද? නැත්ද? යන්න ඕනෑ ම වේලාවක සලකා බැලීමට අධිකරණයකට ඇති අයිතිය නම් කර ඇත්තේ අධිකරණමය විමර්ශනය (Judicial Review) යන වචනවලිනි. මෙය සියලු ම ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයන් තුළ අධිකරණයට ඇති බලයකි. අධිකරණයක් ඇත්තෙන් ම ස්වාධීන වන්නේ මේ බලය පවතින තාක් පමණ ය.

1972 ව්‍යවස්ථාවෙන් කළේ මේ අධිකරණමය විමර්ශන බලය ඉතා කෙටි කාලයකට සීමා කිරීම ය. එනම් යම් පනතක් කෙටුම්පතක් ආකාරයෙන් පවතින අවධියේ දී ඉතා සුළු කාලයක් තුළ අධිකරණය විසින් ඒ නව යෝජිත පනත ව්‍යවස්ථානුකූල ද? නැත්ද? යන්න තීන්දු කළ යුතු ය. මෙවැනි සුළු කාලයක් තුළ දී අධිකරණයක් ඉදිරියට අවුත් පනත් නීත්‍යනුකූල ද? නැත්ද? යන්න ගැන කරුණු දක්වීමට මහජනතාවට ඇති ඉඩ ඉතාමත් සීමිත ය. සාමාන්‍ය ජනතාව අලුත් පනත් කෙටුම්පත් කියවීමේ යෙදෙන්නේ නැත. ඔවුන්ට යම් නීතියක් ව්‍යවස්ථානුකූල ද? නැත්ද? යන ප්‍රශ්නය පැන නඟින්නේ ඔවුන් ඒ ප්‍රශ්නයට මුහුණ දුන් අවස්ථාවේ දී ය. එය නීත්‍යනුකූල නොවන්නේ යැයි ඔවුන් සිතනවා නම්, එවිට අධිකරණය වෙතට ගොස් ඒ ගැන කරුණු දක්වීමට ඔවුන්ට ඉඩකඩ තිබේ. එහෙත් 1972 ව්‍යවස්ථාව තුළින් ඇති කළ සීමාව නිසා එසේ නීති විරෝධී පනතක් ප්‍රශ්නයට භාජනය කොට එය ඇත්තෙන් ම නීති විරෝධී නම් එය අවලංගු කරවා ගැනීමට රටවැසියාට තිබූ අයිතිය අහිමි විය. මෙයින් ඇඟවෙන්නේ යම් නීතියක් ව්‍යවස්ථාවට පටහැණි වුවත් එයට රටේ නීතියක් හැටියට පැවතිය හැකි බව ය. යමෙක් මේ පිළිබඳ ව අධිකරණයකට ගිය හොත් ඔහුට ලැබෙන පිළිතුර වන්නේ,

ඔබට මේ සඳහා ඉදිරිපත් වීමට තිබූ කාලය අවසාන වී ඇත යන්නයි. දැන් ඔය නීතිය ව්‍යවස්ථාවට විරුද්ධ වුවත්, එය හොඳ නීතියක් සේ පිළිගෙන ඒ අනුව කටයුතු කිරීමට ඔබ බැඳී සිටී. මෙය ඇත්තෙන් ම අතිශයින් විකාර වූ තත්ත්වයකි.

නීතියම විමර්ශනය යන බලය ඉහළ අධිකරණවලට දී ඇත්තේ ජනතාවගේ ආරක්ෂාව සඳහා ය. ජනතා ආරක්ෂාව සැලසීම රජයක පරම යුතුකම ය. ඒ කාර්යය සාමාන්‍යයෙන් කෙරෙන්නේ අධිකරණය තුළිනි. අධිකරණයට ඒ බලය නැති වුවහොත්, එයට රට වැසියා ආරක්ෂා කර දීමේ යුතුකම ඉටු කර දීමට බැරි ය. 1972 න් සිදු වූයේ ඉහළ අධිකරණවල බලය කප්පාදු කිරීමකි. එසේ කප්පාදු කරන ලද අධිකරණයක් විසින් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් තුළ ඉටු කළ යුතු යුතුකම් ඉටු කරන්නේ කෙසේ ද? එසේ ඉටු කළ නොහැකි ය.

නීතිමය විමර්ශනය නැති කිරීම අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරක් විය. අධිකරණය ස්වාධීන නොවේ නම් එය විධායකයෙන් හා ව්‍යවස්ථාදායකයෙන් පුරවැසියෙකුට විය හැකි වැරදි වළක්වාලීමට නිර්භීත ව සහභාගි වන්නේ කෙසේ ද? ඇත්තෙන් ම එවැනි මැදිහත් කමක් කිරීමට තිබූ නෛතික බලය ඉවත් කොට දමා ඇත.

1972 ව්‍යවස්ථාවෙන් පැන නැඟුණු මේ තත්ත්වය 1978 ව්‍යවස්ථාව මඟින් තවත් උග්‍ර කරන ලදි. පනතක් හෝ ව්‍යවස්ථාමය සංශෝධනයක් ගෙන එන අවස්ථාවක දී පවා ඊට විරුද්ධ ව පියවරක් ගැනීමට අධිකරණය කරා යෑමේ අයිතිය වඩාත් පටු කරන ලදි. ව්‍යවස්ථා සංශෝධනයක දී පවා එහි හදිසි එකක් යැයි ජනාධිපතිවරයාට සිතුණහොත් දින තුනක සුළු කාලයක දී එය ව්‍යවස්ථානුකූල ද? නැත්ද? යන්න තමාට දන්වන ලෙස ඉල්ලා සිටීමට ජනාධිපතිවරයාට බලය අත්පත් කර ගන්නා ලදි.

මේ අනුව ඉතා පැහැදිලි ව පෙනෙන්නේ 1978 ව්‍යවස්ථාව අධිකරණයේ ස්වාධීනත්වයට බාධා කිරීමට ඇති කරන ලද ව්‍යවස්ථාවක් බව ය. අධිකරණයේ ස්වාධීනත්වය නැති කරන ව්‍යවස්ථාවක් තවදුරටත් පවත්වා ගෙන යෑම වනාහි 2015 ජනවාරි 08 හා අගෝස්තු 17 වන දිනවල දී පැවැත්වූ ජනාධිපති හා පාර්ලිමේන්තු මැතිවරණවල ප්‍රතිඵලය ඵල විරහිත එකක් බවට පත් කිරීම ය. විධායක ජනාධිපති ක්‍රමය නැති කරන බවට දුන් මහා

පොරොන්දුව එයින් කඩවී යයි. දැන් පවතින රජය පොරොන්දු වූයේ ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපනය කිරීම ය. එසේ කිරීමට නම් අධිකරණයේ ස්වාධීනත්වය නැවත ප්‍රතිනිර්මාණය කළ යුතු ය. ඒ සඳහා අධිකරණමය විමර්ශනය පිළිබඳ ව ප්‍රතිපාදනයන් සහිත ව්‍යවස්ථාවක් නිර්මාණය කළ යුතු ය. ඉහත සඳහන් කළා සේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ව කරන ලද කප්පාදුව මඟින් පැහැදිලි ව පෙන්නුම් කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය නැවත ඇති කිරීමට නම් ඇති කළ යුත්තේ නව ව්‍යවස්ථාවක් බව ය.

ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක කොඳුනාරටිය නම් නීතිය මත පාලනය හා නීතියේ ආධිපත්‍යයයි. මේ දෙකම 1978 ව්‍යවස්ථාව විසින් මුළුමනින් ම ඉවත් කර දමන ලදි. නීතියේ ආධිපත්‍යය වෙනුවට විධායක ජනාධිපතිවරයාගේ ආධිපත්‍යය ආදේශ කරන ලදි. නීතියේ අධිපතිත්වය හා නීතිය මත පාලනය නැවත ඇති කිරීමට බැරි නම් නව ව්‍යවස්ථාවකින් ඇති ඵලය කුමක් ද? 1978 ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහය පවතිනතාක් දුරට අවනීතිය රජවනු ඇත. නීතිය මත පාලනය වනාහි රටේ නියම රජු නීතිය ම පමණක් බව පිළිගැනීම ය.

මේ නිසා විධායක ජනාධිපතිවරයාගේ බලතල අඩු කිරීම යන්න රෝගියෙකුගේ උණ අඩු කර ගැනීම හෝ, දියවැඩියා රෝගියෙකුගේ ලේවලින් සීනි අඩු කර ගැනීම වැනි හෝ තේ කෝප්පයකින් සීනි අඩුක් කර ගැනීම වැනි වැඩක් නොවේ. එය වනාහි ව්‍යවස්ථාවේ ව්‍යුහය එනම් මුළු හරය ම වෙනස් කිරීම පිළිබඳ ප්‍රශ්නයකි. බොහෝ විට විධායක බලතල අඩුකරනවාය යන කථාව පොඩි ළමයින්ගේ සෙල්ලමක තරමට මත් ගණන් ගත හැකි කථාවක් නොවේ.

1978 ව්‍යවස්ථාවේ ප්‍රතිඵලය වූයේ ලංකාවේ සමස්ත දේශපාලන හා නෛතික ව්‍යුහය මුළුමනින් ම විනාශ කර දැමීම ය. එය ඉවත් කර ගැනීම සඳහා අරගලය දශකයන් ගණනාවක් තුළ කරන ලද්දකි. රාජපක්ෂ ආණ්ඩුව ඉවත් කිරීම තුළින් පෙන්නුම් කළේ මේ 1978 ව්‍යවස්ථාව මුළුමනින් ම කුණු කූඩයට දැමීමට අවස්ථාව එළඹ ඇති බව ය. එහෙත් එසේ කිරීම සඳහා තීරණාත්මක පියවරක් ගැනීම පිළිබඳ ව දේශපාලන අධිෂ්ඨානයක් තව ම නම් ප්‍රදර්ශනය වී නැත.

විය යුතු වෙනස කර ගැනීමට නම් ලංකාවේ සකල ජනතාවත් විශේෂයෙන් ම දේශපාලන හා නෛතික ප්‍රශ්න පිළිබඳ ව අවබෝධය ඇති සියලු දෙනා ම තමන්ගේ අවබෝධය වඩාත් දියුණු කර ගෙන දැන් රට මුහුණ දෙන අභියෝගය රජයත් ජනතාවත් ඉදිරියේ තැබිය යුතු ය. එසේ නොකිරීම වනාහි හතළිස් වසරකට වැඩි කාලයක් තුළ අඛණ්ඩ ව පැවති ව්‍යසනය තවදුරටත් පවත්වා ගෙන යෑම ම වනු ඇත.

නිසි ව්‍යවස්ථාවක් ගොඩනඟා ගත හැකි වන්නේ ඒ සඳහා විශාල අධ්‍යාපන කටයුත්තකට උර දීම මඟිනි. ශූන්‍ය වූ ව්‍යවස්ථාමය දැනීම ඉතා කෙටි කාලයක් තුළ නැවත ගොඩනැඟිය යුතු ය. දාගිය ගොඩනැඟිල්ලක නටබුන් තුළ ඇති අළු හෝ දූවිලි තුළින් නව නිර්මාණයක් බිහි කළ යුතු ව ඇත. යාන්තම් හෝ ඉතුරුව ඇති ගින්දර නැවත අවුළුවා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති හා මූලධර්මයන් ජන මනස තුළ නැවතත් රෝපණය කළ යුතු ය.

නව ව්‍යවස්ථාවක් පිළිබඳ විවාදයට මුහුණ දිය යුතු වන්නේ ප්‍රශ්නයේ ඇති ගැඹුර හා කරන්නට යන කාර්යයයේ ඇති බාරධූරය භාවය පිළිබඳ පරිණත අවබෝධයකින් යුතු ව ය.

දේශපාලන සාකච්ඡාවේ දී ව්‍යවස්ථාව පිළිබඳ ගැටලුව පිළිබඳ ව ඉතා සරල මට්ටමක අවබෝධයක් නිර්මාණය වීම හා ඒ සරල අවබෝධය ප්‍රචාරක මාධ්‍ය තුළින් සමාජගත වීමː

ව්‍යවස්ථාව පිළිබඳ ව දැනට ඇති සාකච්ඡාව බොහෝ දුරට යම් නව වසංගතයක් පැතිරී ගෙන යද්දී තවමත් ලෙඩය හරිහැටි තේරුම් නොගත් මිනිසුන් අතර ඇති වන සාකච්ඡාවකට සමාන ය.

78 ව්‍යවස්ථාවෙන් ඇති කරන ලද්දේ දේශපාලන ව්‍යුහය, ආර්ථික ව්‍යුහය, සමාජ ව්‍යුහය, සංස්කෘතික ව්‍යුහය හා රටේ මිනිසුන්ගේ අධ්‍යාත්මය තුළට ම කිඳා බැස ගිය මහා විෂ බීජයක් සමාජගත වීම බව බොහෝ දෙනෙක් ඉවෙන් මෙන් දනිති. එහෙත් ලෙඩය කුමක් දැයි තෝරා බේරා දෙන්නට තරම් අවබෝධයක් ඇති වෙදුන් තව ම පහළව ඇති බවක් පෙනෙන්නට නැත.

මේ නිසා විසඳිය යුතු ප්‍රශ්නය නම් වසංගතයක් ඇති බව කිය කියා සිටීම නොව, එහි සුල මුල සොයමින් කුමන වෙදකමකින්

මේ වසංගතය නැති කළ හැකි දැයි යන්න සොයා බැලීම ය. එසේ නොවන තාක් දුරට අපි කවුරුත් මේ වසංගතයේ ම ගොදුරු බවට පත් වනු වැළැක්විය නොහැකි ය.

නව ව්‍යවස්ථාව පිළිබඳ ව මූලිකත්වය ගන්නා, දැනට පවතින ආණ්ඩුව තුළ ම තමන් ව්‍යවස්ථාව සම්බන්ධයෙන් අත්පත් කර ගැනීමට උත්සාහ කරන්නේ කුමන අරමුණක් ද යන්න ගැන පැහැදිලි අවබෝධයකින් තොර වීමː

ජනාධිපතිතුමා පවා පවසා ඇත්තේ ව්‍යවස්ථාව සංශෝධනයක් වේවි ද? නැත්නම් නව ව්‍යවස්ථාවක් වේවි ද යන්න පිළිබඳ ව තමන්ට නිශ්චිත අදහසක් නොමැති බව ය. ආණ්ඩුවෙන් ද මේ ඉතාමත් බරපතළ ව්‍යායාමය පිළිබඳ ව ප්‍රතිපත්ති ප්‍රකාශයක් නිකුත් වී නැත.

කෙසේ වුවත් ව්‍යවස්ථා සංශෝධන කොමිටිය පත් කිරීමත් සමඟ මේ ක්‍රියාදාමය පිළිබඳ ව කිසියම් බැරෑරුම් මතවාදයන් ජනතාව තුළින් ම නිර්මාණය වීමට පටන් ගෙන ඇත. මෙය සමහර විට ඉතිහාසයේ බොහෝ විට සිදුවන්නාක් මෙන් යටින් පටන් ගෙන උඩට දුවන නිර්මාණශීලීත්වයක් වන්නට පුළුවන.

2015 ජනවාරි 08 හා අගෝස්තු 17 යන ජනපති තේරීම හා පාර්ලිමේන්තුව තේරීම පිළිබඳ ක්‍රියාදාමය ද ඇත්තෙන් ම සිදු වූයේ යට සිට උඩට ගලන ප්‍රවාහයක් ලෙසිනි. ප්‍රවාහය ඉස්මතු වෙනු දුටු සමහර නායකයන් තමන් ගත යුතු පියවර තීන්දු කරමින් මේ රැල්ලට එකතු විණි. මෙය බොහෝ විට දේශපාලන ක්ෂේත්‍රයේ දී සිදුවන්නකි. මේ ව්‍යවස්ථාව පිළිබඳ කර්තව්‍යය ද එවැනි එකක් වන්නට පුළුවන.

1978 ව්‍යවස්ථාව තුළින් දූෂණය හා බලය අයුතු ලෙස යොදා ගැනීමට ඇති ඉඩකඩවලින් විශාල ලෙස ලාභ ලැබූ කණ්ඩායම් තුළ මේ තත්ත්වය වෙනස්වීමට විරුද්ධ ව ඉතා බරපතළ විරෝධයක් පැවතීම මේ ගැටලු අතර ප්‍රධාන තැනැක් ගනී.

1978 ව්‍යවස්ථාව රට තුළ පවතින යම් බලවේගයන්ගේ ම ප්‍රතිඵලයකි. ඔවුහු ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කරන ලදි. පසුකාලීනව දූෂණය සඳහා ඇති වූ විශාල ඉඩකඩ

නිසා මෙතෙක් ඉතිහාසයේ නොවූ තරම් මහා ලාභ ලබා ගැනීම් සිදු වී ඇති බව දූනට මූල්‍ය විමර්ශන අංශය විසින් සිදු කරනු ලබන පරීක්‍ෂණ තුළින් හෙළිදරව් වී ඇත.

මේ බලවේග ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය නැවත නිර්මාණයට වීමට එරෙහි ව බරපතළ ප්‍රයත්නයක යෙදෙනවාට සැකයක් නැත. ව්‍යවස්ථාව ප්‍රජාතන්ත්‍රවාදී පදනමක පිහිටා සකස් වුවහොත් එය ඔවුනට මරු පහරක් වනු ඇත.

මේ නිසා නව ව්‍යවස්ථාවක් ප්‍රජාතන්ත්‍රවාදී පදනමක පිහිටා සිදු වීම වළක්වාලීමේ විශාල ප්‍රයත්නයක් පවතින බව ආණ්ඩුවේත් ජනතාවගේත් අවධානයට යොමු විය යුතු ය. පවතින තත්ත්වයේ බැරෑරුම්කම නොතකා සැහැල්ලු මානසික තත්ත්වයකින් යුතු ව මේ තත්ත්වයට උරදීමට උත්සාහ කළහොත් විවිධ කුමන්ත්‍රණ හා ප්‍රචණ්ඩ ව්‍යාපාරයන්ගෙන් ඇති වන තර්ජනය ඉදිරියේ පසුබාන්නට සිදු වනු ඇත.

මේ අභියෝගයන් පිළිබඳ පරිණත අවබෝධයක් රට තුළ ජනිත කිරීමෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවකට ඉඩකඩ නැවතත් පහළ වනු ඇත.

5 පරිච්ඡේදය

ව්‍යවස්ථා නිර්මාණයේ දී වැළකිය යුතු ප්‍රවේශයන්

රටක ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමේ දී මූලික ව ම වැළකිය යුතු ප්‍රවේශය වන්නේ රටේ කිසියම් කොටසක් ඒ ප්‍රයත්නයෙන් බැහැර කිරීම හෝ ව්‍යවස්ථාවට අදාළ සමහර කරුණු වැඩි දෙනෙකුගේ දූනුවත්කමින් බැහැර කිරීම ය. ව්‍යවස්ථාවක් යනු ඔක්කොම දෙනාගේ වැඩකි. එය එසේ නොවුවහොත් එය සැබෑ ව්‍යවස්ථාවක් නොවනු ඇත. එය හුදෙක් නිෂ්ඵල ප්‍රයත්නයක් පමණක් නොව රටේ සියලු දෙනාට ම විනාශකාරී ප්‍රතිඵල ගෙන දෙන්නක් ද විය හැකි ය. 1972 හා 1978 ව්‍යවස්ථාවන් දෙක ම ඔපමණ විනාශකාරී ප්‍රතිඵල ගෙන දුන්නේ, එය ඔක්කොගේම වැඩක් නොව ටික දෙනෙකු විසින් රහසිගත ව ඉටු කොට සියල්ලන් මත ම පටවන ලද අවනීතියක් වූ නිසා ය.

ව්‍යවස්ථා නිර්මාණය පිළිබඳ ව විශ්ව අත්දැකීමක් වන්නේ සාර්ථක ව්‍යවස්ථාවක් ලියවෙන්නේ යම් රටක ජනතාවකගේ හදවතෙහිය යන මතය ය. හදවතින් ලියවෙන ව්‍යවස්ථාවක් කල්පවතින්නේ නැත. ප්‍රංශ විප්ලවයෙන් බිහි වූ ජනරජ ව්‍යවස්ථා සංකල්පය එදා මෙන් අදත් ප්‍රංශ ජනතාවගේ හදවතෙහි පවතී. රාජාණ්ඩු ක්‍රමයට විරුද්ධ ව එංගලන්තයෙහි බිහි වූ ව්‍යවස්ථා සංදර්භය ලිඛිත ලේඛනයක් බවට නොහැර වුණත් එය එදා මෙන් අදත් ඒ රටේ ජනතාවගේ හදවත් තුළ පවතී. ඇමරිකාව යටත් විජිතවාදයෙන් මිදී තමන්ගේ ම ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගත් අතර, එහි මූලික ව්‍යුහය එදා මෙන් අදත් බලවත් ව පවතී. ජර්මන් ජාතිකයන්ට හිට්ලර්ගේ පැන නැඟීම හා ඔහුගෙන් සිදු වූ විශාල හානිය බරපතළ ගැටලුවක් බවට පත්

විය. එය එසේ වූයේ කෙසේ ද? යැයි ඔවුහු පසුතැවිලි වෙමින් කල්පනා කළහ. ඔවුන් එළිඹගත් මතය වූයේ හිට්ලර් බලයට එන කාලයේ දී පැවති වෛමාර් ව්‍යවස්ථාව තුළ තිබූ අඩුපාඩු හේතු කොට ගෙන හිට්ලර්ගේ ඉස්මතු වීම සිදු වූ බවයි. ඒ නිසා එවැනි තත්ත්වයක් වළක්වා ගැනීම පිළිබඳ ව ඉතාමත් ගැඹුරු හා දීර්ඝ කාලීන සාකච්ඡාවක් ඇති විය. ඒ සාකච්ඡාව තුළින් ඇති වූ ප්‍රබල මතයන් හා අනාගත විපත්තියක් වළක්වා ගැනීම අභිලාෂ කොට ගෙන බිහි වුණු අදහස් ඔවුහු නව ව්‍යවස්ථාවකට නැංවූ අතර, ඒ අදහස්වලට සරිලන සේ ඔවුන්ගේ ප්‍රසිද්ධ ආයතනයන් වෙනස් කර ගත්තේ ය. එය යුද්ධයේ අළු අතර යටපත්ව සිටි රට වැසියනට නැවතත් ආත්ම ගෞරවයෙන් යුතු ව නැඟී සිට ගන්නට අවස්ථාව සැලසූවා පමණක් නොව, ලෝකයේ පවතින ඉතාමත් සෞභාග්‍යමත් ආර්ථිකයක් ගොඩනඟා ගැනීමටත් ඒ ජනතාවට මඟ පෑදුවේ ය. බ්‍රිතාන්‍ය යටත් විජිතවාදයෙන් අත්මිදුණු ඉන්දියාව අවුරුදු දෙකකට වැඩි කාලයක් ගත කළේ ඔවුන්ගේ අනාගතයට සුදුසු වන්නේ කුමන සමාජීය මූලධර්මයන් ද, කුමන ආයතනික රටාවක් ද යන්න ගැන සාකච්ඡා කිරීම ය. මේ පිළිබඳ ව ලියවී ඇති පොත්වල සඳහන් වන්නේ අතිශයින් අව්‍යාජ වූත් නිහතමානී වූත් සාකච්ඡාවක් ඔස්සේ ඉන්දියාවේ නව පාලකයන් මේ ව්‍යවස්ථාව තනා ගත් බව ය. එය අදත් ප්‍රබල ව පවතින අතර, එය ඉන්දියාවේ ප්‍රජාතන්ත්‍රවාදයෙහි ප්‍රධාන ආරක්ෂකයා බවට ද පත් ව ඇත. ඉහතින් සඳහන් වන්නේ ජනතාවකගේ හදවතෙහි නිර්මාණය වූ ව්‍යවස්ථාවන් අතරෙන් සමහරක් පිළිබඳ ව සටහනකි. ඒ නිසා ව්‍යාජ භාවය වළක්වා ගැනීමත්, පටු පරමාර්ථ සහිත විජ්ජා හා සෙල්ලම්වල යෙදීමත් ව්‍යවස්ථා නිර්මාණයේ දී මුළුමනින් ම වැළකිය යුතු ප්‍රවේශයන් ය. අව්‍යාජ භාවය, නිහතමානීත්වය හා එකිනෙකා පිළිබඳ ව ඇති ළබැඳියාව පමණක් ම කල්පවතින ව්‍යවස්ථාවක පදනම සේ පවතී.

මෙවැනි ව්‍යවස්ථාවක් ගොඩනඟන අවස්ථාවක දී තමන් දෙස හා තම අතීතය දෙස පම්පෝරියෙන් බැලීමට වඩා, සැබෑ විවේචනශීලී භාවයෙන් යුතු ව තමන්ගේ ම අතීතය දෙස බැලීමට නිර්භය වෙන තරමට රට තුළ අව්‍යාජ දර්ශන රටාවකුත්, කල්පනා ධාරාවකුත් බිහි වනු ඇති අතර, එමඟින් නිර්මාණය වන සංස්ථාව

සියලු දෙනාගේ ම හදෙහි කොටන ලද එකඟතාවක් වනු ඇත. ගලෙහි කෙටුණු ලේඛනයකට වඩා හදෙහි කෙටුණු දර්ශනයක් අගනේ ය.

ව්‍යවස්ථා නිර්මාණයේ දී විනාශකාරී ප්‍රතිඵල ගෙන දිය හැකි සමහර ප්‍රවේශයන්

ව්‍යවස්ථාවට අදාළ නෛතික සංකල්පයන් හා නීතිය ක්‍රියාත්මක කරවන ආයතන අතර ඇති සම්බන්ධය නොතකා හැරීම.

ලෝකයේ පවතින ඉතාමත් ම ලස්සණ වචන මාලාවන් ගැබ් කොට ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම එතරම් අමාරු කාර්යයක් නොවේ. විශේෂයෙන් ම අන්තර්ජාලය මඟින් සපයා ඇති විශාල පහසුකම් ඔස්සේ ලෝකයේ ඕනෑ ම ලේඛනයක් ලෙහෙසියෙන් ලබා ගත හැකි කාලයක මේ ලේඛන තුළින් උකහාගන්නා සමහර වචන මාලාවන් ඇතුළු කිරීම එතරම් වෙහෙස දැරිය යුතු ප්‍රයත්නයක් නොවේ. අමාරු කාර්යය වන්නේ වැදගත් ප්‍රජාතන්ත්‍රවාදී අදහස් හා සංකල්පයන් ඒවා ක්‍රියාවට නැඟිය හැකි ආයතන රටාවකට බද්ධ කොට ඒ ආයතනයන් ක්‍රියාත්මක කරවිය හැකි මූලධර්මයන් ව්‍යවස්ථාවක් තුළ ගොනු කිරීම ය. ඒ නිසා ව්‍යවස්ථාවක තිබිය යුතු කරුණු පිළිබඳ ව කරනු ලබන සියලු ම තක්සේරු කිරීම්වල දී ඉතා හොඳින් සලකා බැලිය යුතු වන්නේ සාධාරණය හා යුක්තිය පසුබිම් කොට ගත් ආයතන රටාවක් රට තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා ව්‍යවස්ථාවෙහි අඩංගු කරනු ලබන නෛතික රටාව කොපමණ ප්‍රමාණයකට හේතු වේ ද යන්න ය.

මේ අතින් ගත් කල 1972 ව්‍යවස්ථාව රටේ අධිකරණයේ ස්වාධීන පැවැත්මට බාධා ඇති කරන ලද ව්‍යවස්ථාවක් විය. එමඟින් රටේ අධිකරණ පද්ධතිය එක්තරා

බෙලහීන තත්ත්වයකට පත් විය. ඒ නිසා ව්‍යවස්ථාව තුළ අධිකරණයේ ස්වාධීනත්වය පිළිගන්නා බව සඳහන් කර තිබුණත්, ඒ ව්‍යවස්ථාවේ ප්‍රායෝගික ප්‍රතිඵලය වූයේ ස්වාධීනත්වය බොහෝ දුරට විතැන් කොට රටවැසියාගේ ආරක්ෂාව සඳහා ගත යුතු පියවර ගැනීමට බැරිතරමට අධිකරණය බෙලහීන කිරීම ය. 1978 ව්‍යවස්ථාවේ ප්‍රතිඵලය වූයේ රටේ ව්‍යවස්ථාදායකය මෙන් ම අධිකරණය ද විතැන් කිරීම ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් රටේ සියලු ම සංස්ථාවල් අකර්මණ්‍ය වන තත්ත්වයක් නිර්මාණය වූ අතර, ඒ අකර්මණ්‍යතාව තුළින් හිතාගැනීමටත් වත් නොහැකි පරිමාවේ දූෂණය සියලු ම සංස්ථාවල් පුරා පැතිර ගියේ ය. මෙහි ප්‍රතිඵලය වූයේ රටවැසියා අසරණ තත්ත්වයකට පත් කිරීම ය. ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමේ අරමුණ රටවැසියා වඩාත් බලගැන්වීම මිස වඩාත් අසරණ කිරීම නොවේ. මේ අනුව 1978 ව්‍යවස්ථාව ඉටු කරන ලද්දේ සැබෑ ව්‍යවස්ථාවකින් ඉටු විය යුතු සේවය නොව ඊට ඉඳුරා ම වෙනස් කර්තව්‍යයකි.

ඉහත සඳහන් ස්වයං විනාශකාරී අත්දැකීම් තුළින් පාඩමක් ඉගෙන ගෙන නව ව්‍යවස්ථාව සම්පාදනය කෙරෙන්නේ නම් කේන්ද්‍රීයව සලකා බැලිය යුතු කරුණ වන්නේ රටේ පවතින සංස්ථාවන් තුළ ප්‍රජාතන්ත්‍රවාදී නෛතික රටාවක් පවත්වා ගෙන යෑමට ව්‍යවස්ථාවෙන් කුමන පියවරක් ගෙන තිබේ ද යන්න සලකා බැලීම ය. ව්‍යවස්ථාවේ වගන්තියක් වගන්තියක් පාසා අසා ගත යුතු ප්‍රශ්නය නම් ඒ වගන්තිය රටේ සංස්ථාවන් වඩාත් ශක්තිමත් කරනවා ද, ඒ ශක්තිමත් භාවය තුළින් ජනතාවගේ ආරක්ෂාව වඩාත් තහවුරු වෙනවා ද නැද්ද යන කරුණ ය. ජනතාවගේ ආරක්ෂාව බෙලහීන කරන සෑම වගන්තියක් ම ඒ හේතුව මත ම ව්‍යවස්ථාවෙන් බැහැර කළ යුතු ව ඇත.

නීතියේ ආධිපත්‍යය

නීතියට ඉහළින් කිසියම් ම හෝ අණක් දීමට කුමන හෝ බලධාරියෙකුට හැකි වේ නම් ඒ තුළින් බිහිවන්නේ විනාශකාරී තත්ත්වයකි. මේ අනුව ඕනෑ ම ප්‍රශ්නයක් පිළිබඳ ව ඕනෑ ම නිලධාරියෙකු විසින් ගන්නා තීරණයක් රටේ පවතින නීතිය තුළ සාධාරණ කළ හැකි තීරණයක් විය යුතු ය. ඒ තීරණය එසේ සාධාරණ කළ නොහැකි නම් එය නීති විරෝධී ක්‍රියාවක් වේ. එවැනි තීරණයක් ගන්නා නිලධාරියා රටේ ඉහළ ම නිලය දරන්නා වුවත් කරනු ලබන්නේ නීති විරෝධී ක්‍රියාවකි. නීති විරෝධී ක්‍රියාවන් කිරීමේ ඉඩකඩ ව්‍යවස්ථාව තුළින් අහෝසි කර දැමිය යුතු ය. මෙය සාමාන්‍යයෙන් හඳුන්වන්නේ නීතියේ ආධිපත්‍යය යන වචනවලිනි. මෙහි තේරුම ඇමරිකාවේ ඉතා ප්‍රබල ලේඛකයෙකු වූ ටොම් පේන් (Tom Paine) විස්තර කළේ 'අපේ රටේ රජු නීතිය'ය. මෙහි ඔහු සංසන්දනය කළේ රාජාණ්ඩුව යටතේ එංගලන්තයේ පැවති සම්ප්‍රදාය වූයේ රජු විසින් කරන කියන ඕනෑ ම දෙයක් රටේ නීතිය බවට පත් වන බවයි. මේ සම්ප්‍රදාය මුළුමනින් ම අහෝසි කර දමන ලද්දේ 'රටේ අවසාන තීරකයා රටේ පවතින නීතිය' බවට පත් කරමිනි. මේ තත්ත්වය ඉතා බලවත් ව ලංකාවේ ව්‍යවස්ථාව තුළට නැවත ගෙන ආ යුතු ය. එයට හේතුව නීතියේ ආධිපත්‍යය 1978 ව්‍යවස්ථාව විසින් විතැන් කොට දමන ලද නිසා ය. විධායක ජනාධිපතිගේ අභිමතය නීතිය බවට පත් විය. ඔහුට කැමති සේ හදිසි නීති හෝ ත්‍රස්තවාදී නීති පනවා ගැනීම තුළින් ඔහු කැමති ඕනෑ ම දෙයක් රටේ නීතිය බවට පත් කරන ලදි.

මෙසේ රටේ නීතියේ ආධිපත්‍යය විතැන් කළ විට රටේ පවතින කිසි දු ආයතනයකට ක්‍රියාත්මක විය නොහැකි තත්ත්වයක් නිර්මාණය වේ. සියලු ම ආයතන රටේ පාලකයාගේ වහල් සේවකයන් බවට පත් වේ. ඒ ආයතනයෙන් කුමක් බලාපොරොත්තු විය හැකි ද

යන්න හිතා ගැනීමට බැරි තත්ත්වයක් රටවැසියා තුළ නිර්මාණය වේ. ඒ ව්‍යාකූලත්වය යටතේ මේ ආයතන හා ජනතාව අතර දූරස්ථ භාවය ඇති වේ. ඒ දූරස්ථ භාවය ඇති වන තරමට රටේ සාමූහික ජීවිතය අබලන් වී විනාශ වී යයි. අධෛර්යය රට පුරා පැතිර යන ප්‍රධාන මානසික තත්ත්වයක් බවට පත් වේ. රට තුළ සාධාරණ බලාපොරොත්තු ඉටු කර ගැනීමේ අවස්ථාවක් නැති බව පොදු ජන විඥානය බවට පත් වේ. මෙවැනි තත්ත්වයක් යටතේ නීතිය හුදෙක් ම මර්දනයේ හස්තයක් බවට පත් වීම හැර එයින් කෙරෙන වෙනත් දෙයක් නැත.

එසේ හෙයින් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ සියලු ම ආයතනයන්ගේ බලධාරීත්වය රැකෙන සේ නීතියේ ආධිපත්‍යය පිළිබඳ අදහස ප්‍රායෝගික ව ව්‍යවස්ථාව තුළින් ප්‍රකාශයට පත් කළ යුතු ව ඇත. මෙය සාර්ථක ව කර ගත හැකි නම් රටේ ස්ථාවරත්වය සඳහාත්, සාධනීය මානසික තත්ත්වයක් ජන විඥානය තුළ ඇති කිරීම සඳහාත් මෙය පදනම වනු ඇත.

පවතින අරාජික තත්ත්වය හඳුනා ගැනීමට අපොහොසත් වීම

ව්‍යවස්ථාවක් නිර්මාණය වීම සිදුවන්නේ අජටාකාශයේ නොවේ. පවතින ඓතිහාසික හා සමාජ රටාවක් තුළ මේ ක්‍රියාදාමය ද සිදු වේ. රට පවතින්නේ අරාජික තත්ත්වයකය යන්න පිළිබඳ ව ජනවිඥානය තුළ ඉතා තදින් ගැබ් වී ඇති අදහස ව්‍යවස්ථාවෙන් නිර්මාර්තෘවරුන් විසින් නොතකා හැරියහොත් ඒ අරාජක භාවයෙන් එළියට ඒම සඳහා නෛතික රටාවක් හා ආයතනික රටාවක් ගොඩනඟා ගැනීමට ඉවහල් වන ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීමට නොහැකි වේ. මේ නිසා අරාජක භාවය යන්න කුමක් දැයි හඳුනා ගැනීම සුදුසු වේ. ශබ්දකෝෂයන්හි ඇති නිර්වචනවලට අනුව අරාජක භාවය යන්න පැහැදිලි කොට ඇත්තේ මෙසේ ය:

'අරාජක භාවය යනු බලධාරීත්වයක් හෝ වෙනත් පාලන ව්‍යුහයක් නැතිකමින් හෝ නොපිළිගැනීම තුළින් ඇති වන අපිළිවෙළ ය.' ලංකාවේ සිදු වී තිබෙන්නේ නීතිය හා නීතිය මත ක්‍රියා කරන සංස්ථාවන්හි බලධාරීත්වය නැති වී යෑම හා ඒ බලධාරීත්වය නොතකා හැරීම නිසා ඇති වූ අපිළිවෙළකි. විධායක ජනාධිපති රටේ පවතින සියලු ම සංස්ථාවන්ගේ බලධාරීත්වය නොතකා හැර තමා එකම බලධාරියා සේ ක්‍රියා කළේ ය. රජයේ ඉහළ ම නිලධාරියා විසින් රටේ සංස්ථාවන්ගේ බලධාරීත්වය නොතකා හැරීමත් සමඟ ඒ එක එක සංස්ථාවන් තුළ ඉහළ ම තනතුරු දරන නිලධාරීන්ගේ බලධාරීත්වය ඒ සංස්ථාවේ ම අනෙක් නිලධාරීන් මඟින් හා රටේ පුරවැසියා මඟින් ද ප්‍රතික්ෂේප වීමට පටන් ගත්තේ ය. මේ තත්ත්වය කලක් පවතින විට මේ සංස්ථා තුළ ම ඇති වූ පරස්පර විරෝධතාවන් නිරාකරණය කොට ඒවා පවත්වා ගෙන යෑමේ හැකියාව ඒ සංස්ථාවන්හි ඉහළ නිලතල දරන්නන්ට බැරි වන තත්ත්වයක් උදා විය. රටේ සංස්ථාවන්හි ඉහළ තනතුරු දරන්නන් බෙලහීනයන් සේ පෙනෙන්නට පටන් ගත් විට ඔවුන්ගේ බලධාරීත්වය පිළිගැනීමට හේතුවක් නැති වන තත්ත්වයක් ඇති විය. මෙය රටේ නිලධාරී තන්ත්‍රයේ මෙන් ම රටේ මානසික තත්ත්වයේ ද විශාල වෙනසක් ඇති කළේ ය. අද ඇති වී ඇති අරාජක භාවය යනු රටේ සංස්ථාවන්හි බලධාරීත්වය නැති වී යෑම මෙන් ම ඒ බලධාරීත්වය පිළිගැනීමට තරම් හේතුවක් දැකීමට රටවැසියාට නොහැකි වන තත්ත්වය නිසා ද උදා වී ඇත.

ව්‍යවස්ථාවක හා පොදුවේ නීති පද්ධතියක අරමුණ වන්නේ රටට වැදගත් වන සියලු ම සංස්ථාවන්ගේ බලධාරීත්වය එක් අතකින් රැකීමත්, අනෙක් අතින් ඒ බලධාරීත්වය රටවැසියාගේ ආරක්ෂාවට තර්ජනයක් නොවන සේ පවත්වා ගෙන යෑමටත් අවශ්‍ය වන නීති ප්‍රතිපාදාන සකස් කිරීම ය. මේ කාර්යයට ව්‍යවස්ථාව නිර්මාණය කරන්නන් මුහුණ නොදෙන්නේ නම් දැන්

පවතින අරාජක භාවය එසේ ම පවතින අතර ම කාලයත් සමඟ වඩවඩාත් උග්‍ර වනු ඇත. එවැනි සමාජයකට ව්‍යවස්ථාවකින් ඇති වැඩක් නැත. අරාජක භාවය පිළිබඳ ගැටලුවට මුහුණ නොදී ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම වනාහි නිෂ්ඵල ක්‍රියාවකි.

ඉහත සඳහන් භයානක ප්‍රතිඵල ගෙන දිය හැකි ප්‍රවේශයන්ගෙන් බැහැර වූ මූලෝපායක් ඔස්සේ ව්‍යවස්ථා නිර්මාණය සිදු විය යුතු ව ඇත.

6 පරිච්ඡේදය

ව්‍යවස්ථාවක් මොකට ද?

ලංකාවේ දැනටමත් ව්‍යවස්ථා යැයි කියාගන්නා ලේඛන තුනක් විටින් විට නිර්මාණය කර ඇති නිසාත්, ඒ ව්‍යවස්ථා තුන එකිනෙකට බොහෝ සෙයින් නොගැළපෙන හා පරස්පර විරෝධී වන නිසාත්, රටවැසියා තුළ ව්‍යවස්ථාවක් කියන්නේ කුමක් ද? ඒක පවතින්නේ මොන හේතුවකට ද? ආදි ප්‍රශ්න පැන නැඟීම සාධාරණ ය.

පළමු වන ව්‍යවස්ථාව එනම් සෝල්බරි ව්‍යවස්ථාව නිර්මාණය වී තිබුණේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් තුළ පාලනයක් ඇති කිරීම අරමුණු කොට ගෙන ය. මේ ව්‍යවස්ථාව යටත්විජිත කාලයක අග දී නික්මුණු එකක් හෙයින්, එය ජනතාව විසින් ම තමන්ගේ පාලන ක්‍රමය තමන් විසින් ම නිර්මාණය කර ගැනීම සඳහා සකස් කොට ගත් එකක් යැයි කිව නොහැකි ය. ඒ ව්‍යවස්ථාව පදනම් වී තිබුණේ ජාත්‍යන්තරව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ව්‍යුහයක තිබිය යුතු යැයි සලකනු ලැබූ පොදු අංගයන් එකතු කිරීමෙනි. එහෙත් මේවා පිළිබඳ ව පොදුවේ සාකච්ඡා කිරීමට සුදුසු වූ වාතාවරණයක් එදා නොතිබුණි යැයි කීම නිවැරදි යැයි සිතමි.

1972 දී ඇති කරන ලද දෙවන ව්‍යවස්ථාවත්, ඉන් පසු 1978 දී ඇති කරන ලද තුන්වන ව්‍යවස්ථාවත්, මුල් ව්‍යවස්ථාවට හාත්පසින්ම වෙනස් ඒවා විය. ඒ ව්‍යවස්ථා නිර්මාණය කළේ මොකටදැයි ඇසුවහොත් එය බොහෝ දුරට පාලනයේ සිටි දේශපාලන පක්ෂවලට තමන්ගේ පාලනය වඩා ලෙහෙසියෙන් කර ගැනීම සඳහා නිර්මාණය කළ ඒවා යැයි කිව හැකි ය. ඒවායින් කියවෙන්නේ, රටේ මහජනතාව තමන්ගේ රටේ පාලනය මොනවිදියේ එකක් දැයි කියා පෑමක් නොව, පාලකයා විසින් පාලන ක්‍රමය තමන්ගේ කැමැත්තට අනුව හා පහසුවට අනුව නිර්මාණය කර ඇති බව ය.

මුල් ව්‍යවස්ථාවේ දී ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තුළ අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු යැයි සලකුණු ලබන දේශපාලන මූලධර්ම හා පාලන ක්‍රමයක අංගයන් අඩංගු වී තිබුණත්, දෙවන හා තුන්වන ව්‍යවස්ථාවන්හි දී ඒ අංගයන් හිතුවක්කාර ලෙස නොතකා හැර තිබුණි. 'රටට හරියන' ව්‍යවස්ථාවක් යනුවෙන් දෙවන හා තුන්වන ව්‍යවස්ථාවලින් අදහස් කර තිබුණේ රටේ පාලකයාට හරියන යන අරුත ය. මුල් ව්‍යවස්ථාවේ තිබූ මූලික ව්‍යුහය (basic structure) අතහැර දැමීම නිසා, දෙවන හා තුන්වන ව්‍යවස්ථාවන් තුළ, මූලික ව්‍යුහයක් නොතිබුණා යැයි කිව හැකි ය. මූලික ව්‍යුහයකින් තොර වූ පාලන තන්ත්‍රයක් වනාහි, එකම මූලික සංකල්පයක් මත පිහිටන්නා වූ පාලන ක්‍රමයක් නොවේ. ලේඛනයක් වශයෙන් ගත් කල, එකම මූලික ව්‍යුහයක් නැති වීම ම ඒ ලේඛනය තුළින් අනිවාර්යයෙන් ම ඇති කළ යුතු වූ අවුල් ජාලය මුලින් බිහි වන අවස්ථාවේ දී ම අතින් ගෙන පැමිණ ඇති බව කිව හැකි ය.

මේ දෙවන හා තුන්වන ව්‍යවස්ථාවලට එකතු වූ සංශෝධනයන් තුළින් ද ප්‍රකාශයට පත්වන්නේ ඒ මුල් අවුල ම ය.

අද 2015 ජනවාරි 08 හා අගෝස්තු 17 පැවති ජනාධිපති හා පාර්ලිමේන්තු මැතිවරණවලින් පසු නැවත නැවත ප්‍රකාශයට පත් වී ඇති අදහසක් වන්නේ, හතර වන වතාවටත් නව ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගත යුතු ව පවතින බව ය. මෙයින් කියවෙන්නේ තුන්වන ව්‍යවස්ථාවට තවත් සංශෝධන එකතු කිරීමක් නොවේ. අලුතෙන් ම ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීම ය.

මෙහි දී ව්‍යවස්ථාවක් මොකට ද? යන ප්‍රශ්නය පිළිබඳ ව පැහැදිලි ව වටහා ගැනීමක් ඇති කර ගැනීම අවශ්‍ය වේ. නැතහොත් හුදෙක් ම නව ලේඛනයක් ඇති කර ගැනීම තුළින් දෙවන හා තුන්වන ව්‍යවස්ථා නිසා, ඇති වූ ගැටලු නිරාකරණය කර ගත නොහැකි ය.

ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයකට ව්‍යවස්ථාවක් මොකට ද? යන ප්‍රශ්නයට ඉතා පැහැදිලි පිළිතුරක් ඇත. එනම් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ පවතින ජනරජයක් වශයෙන් රටේ ප්‍රධාන දේශපාලන ව්‍යුහය කුමන ආකාරයකින් ඇති කර ගත යුතු ද? යන්න පිළිබඳ ව ජනතාව විසින් ම නිර්මාණය කර ගන්නා පාලන තන්ත්‍රයක් ඇඟ වේ. එයින් අදහස් දෙකක් කියවේ. එකක් නම් ඒ පාලන

ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ව්‍යුහය තුළ ප්‍රකාශයට පත් විය යුතුය යන්න ය. දෙවන කරුණ නම් මේ දේශපාලන තන්ත්‍රය ජනතාව විසින් සාකච්ඡා කොට ජනතාවගේ ම කැමැත්තෙන් නිර්මාණය කර ගත් එකක් විය යුතු බව ය. මේ කරුණු දෙක තුළින් ම කියවෙන්නේ හතර වන ව්‍යවස්ථාව දෙවන හා තුන්වන ව්‍යවස්ථාවන්ට මුළුමනින් ම වෙනස් වූ එකක් විය යුතුය යන්න ය.

මේ අනුව ව්‍යවස්ථාවක් මොකටද යන ප්‍රශ්නයට ඉතා පැහැදිලි පිළිතුරක් ඇත. එනම් තමන්ගේ රටේ පාලනය ඉදිරි කාලයේ දී පැවතිය යුත්තේ කුමන මූලික ව්‍යුහයක් යටතේ ද? යන්න ජනතාව විසින් ම එකඟතාවකට පැමිණ, ප්‍රකාශයට පත් කර ගත යුතු බව ය.

මේ අනුව නව ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීමේ දී, පැහැදිලි කර ගත යුතු මූලික ම ප්‍රශ්නය වන්නේ රටේ පාලනය කුමන වර්ගයේ මූලික ව්‍යුහයක් තුළ පැවතිය යුතු ද? යන කරුණ ය. මේ ප්‍රශ්නයට පිළිතුරක් නොදී නව ව්‍යවස්ථාවක් පිළිබඳ ව කරන සාකච්ඡාවක අවසාන ප්‍රතිඵලය වනු ඇත්තේ දෙවන හා තුන්වන ව්‍යවස්ථාවලින් ඇති කළා වැනි ම මහා අවුල් ජාලයකුත් ඒ අවුලේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන සමාජ අස්ථාවර භාවයකුත් ඇති වීම පමණි.

ව්‍යවස්ථාවක හා ව්‍යවස්ථා සංශෝධනවල ඇති වෙනස

ව්‍යවස්ථාවක් හා ව්‍යවස්ථා සංශෝධන අතර ඇති වෙනස ඉතා පැහැදිලි ව වෙන් කර ගත යුතු ය.

ව්‍යවස්ථාවක් ඇති කර ගැනීම කළ හැක්කේ සමූහයක් වශයෙන් රටක සමස්ථ ජනතාවට පමණි. එය කිරීමේ බලයක් ව්‍යවස්ථාදායකයට පමණක් පවරා ගත හැකි නොවේ. ව්‍යවස්ථාදායකය සමස්ත ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීමේ කටයුත්තේ නියැලුණහොත් එයින් කෙරෙනුයේ ප්‍රජාතන්ත්‍රවාදය මුළුමනින් ම අතහැර දැමීම ය. ලංකාවේ දෙවන හා තුන්වන ව්‍යවස්ථා තුළින් ඇති වූයේ ඒ තත්ත්වයයි. දෙවන ව්‍යවස්ථාව ව්‍යවස්ථා සම්පාදක සභාවයක් මඟින් ඇති කළා යැයි කී නමුත් ඇත්තෙන් ම කෙරුණේ ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීම

සකල ජනතාවගේ සහභාගිත්වයෙන් තොර ව සිදු වීම ය. එයින් කෙරුණේ බලය පැවති පක්ෂවල හිතුවක්කාර නිර්මාණයක් ඇති කර ගන්නා අතර, යම් ආකාරයකින් ජනතාව සම්බන්ධ කර ගත්තා යැයි යන මවාපෑමක් ඇති කිරීම පමණ ය.

තුන් වන ව්‍යවස්ථාව හුදෙක් ම ව්‍යවස්ථාදායකය පමණක් ම නිර්මාණය කරන ලද්දක් විය. එකල බලයට පත් ව සිටි එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව අත්පත් කර ගෙන තිබූ තුනෙන් දෙකකට වැඩි පාර්ලිමේන්තු ඡන්ද බලය උපයෝගි කර ගනිමින් ව්‍යවස්ථාවක් යැයි සඳහන් කළ ලේඛනයක් නිර්මාණය කර ගන්නා ලදි. එය ව්‍යවස්ථා පිළිබඳ ජාත්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායනට අනුව ව්‍යවස්ථාවක් යැයි සැලකිය නොහැකි ලේඛනයකි.

ව්‍යවස්ථාදායකයට බලය ඇත්තේ, ව්‍යවස්ථාවෙහි අඩංගු වන මූලික ව්‍යුහයට අනුකූල වන පරිදි විවිධ කරුණු පිළිබඳ ව නීති සම්මත කර ගැනීම ය. මෙහි දී තුනෙන් දෙකක වැඩි ඡන්දය මාර්ගයෙන් හා/ හෝ ජනමත විචාරණ මාර්ගයෙන් ඒවායේ කරුණු සංශෝධනයට ලක් කළ හැකි ය. එහෙත් එසේ කළ හැක්කේ ඒ සංශෝධන ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහයට අනුකූල ව පවතින තාක් දුරට පමණ ය. යෝජිත යම් සංශෝධනයක් ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහයට පටහැණි නම් එය සංශෝධනය කිරීමේ බලයක් ව්‍යවස්ථාදායකයට ඇත්තේ නැත.

මේ පිළිබඳ ව විශාල ව්‍යාකූලත්වයක් ලංකාවේ තුන් වන ව්‍යවස්ථාව මඟින් ඇති කරන ලදි. ඒ ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාවේ ඕනෑ ම කොටසක් තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් හා/හෝ ජනමත විචාරණයකින් කර ගත හැකි වෙයි. මෙයින් අදහස් වූයේ ව්‍යවස්ථාවේ ඕනෑ ම අංශයක් කප්පාදු කර දැමීමට ව්‍යවස්ථාදායකයට බලය පවතින බව ය. එසේ කළ හැකි ආකාරය ගැන පමණක් සීමා පැනවෙයි. එක්කෝ තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් ඒ සංශෝධනය නීතිගත කළ යුතු අතර, නැත්නම් තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් පමණක් සෑහීමකට නොපත් වී ජනමත විචාරණයක් මඟින් සංශෝධනයක් ඇති කර ගත හැකි විය. කප්පාදුවක දී මෙන් සතා නපුංසකයෙකුගේ තත්ත්වයකට ද පත් කිරීමේ බලය ව්‍යවස්ථාදායකය මෙසේ තමන් අතට පත් කර ගන්නා ලදි.

මෙය ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ව ජාත්‍යන්තර සම්ප්‍රදායට අනුව මුළුමනින් ම නීති විරෝධී හා බල රහිත ව කරනු ලද්දා වූ ක්‍රියාවකි. යම් ව්‍යවස්ථාවක මූලික ව්‍යුහය වෙනස් කොට වෙනත් ව්‍යුහයක් මත ව්‍යවස්ථාවක් ගොඩනැඟීම සමස්ත ජනතාවක් විසින් ම කර ගත හැකි වූ ක්‍රියාවක් මිස වැඩි ඡන්දයෙන් හෝ ජනමත විචාරණයකින් ව්‍යවස්ථාදායකයට කර ගත හැකි ක්‍රියාවක් නොවේ.

මේ අනුව ව්‍යවස්ථා නිර්මාණය කිරීම හා ව්‍යවස්ථා සංශෝධනය යන දෙකරුණ වෙන් වෙන්ව වටහා ගත යුතු වෙයි.

මේ කරුණ ඉන්දියාවේ දී ස්ථාවර කරන ලද්දේ ඉතා සුප්‍රසිද්ධ කේසවානන්ද නඩුවෙහි දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීන්දුවක් මඟිනි. ඒ තීන්දුව දැනට අවුරුදු හතළිහකට පමණ පෙර දී ප්‍රකාශ වූ අතර, ඉන්පසුව තවත් නඩු තීන්දු ගණනාවක් මඟින් තහවුරු කොට ඇත. කේසවානන්ද නඩුව ඉන්දියාවේ ප්‍රජාතන්ත්‍රවාදය අනතුරින් බේරා ගෙන ආරක්ෂා කර දුන් නඩුව සේ සැලකේ. ඒ නඩුවේ දී එකල බලයේ සිටි ඉන්දිරා ගාන්ධි මැතිනිය විසින් ව්‍යවස්ථාවේ යම් කොටස් සංශෝධනය කිරීමට උත්සාහයක් කළ අතර, ඒ සංශෝධන ඉන්දීය ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහයට පටහැණි හෙයින් එසේ කිරීමට බලයක් ව්‍යවස්ථාදායකයට නොමැති බවට ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කොට ඒ සංශෝධන නිෂ්ප්‍රභා කරන ලදි. එහි දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීන්දුව වූයේ නව නීති ඇති කිරීම සම්බන්ධයෙන් බලය ව්‍යවස්ථාවට පවතින බවත්, ඒ බලය යොදා ගැනීමේ දී ඇති සීමාව වන්නේ සම්මත කර ගන්නා නීති රටේ ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහයට පටහැණි නොවිය යුතු බවත් ය. ව්‍යවස්ථා සංශෝධනය සඳහා ද බලපවත්වන්නේ ඒ සීමාව ම ය.

පසුගිය කාලයේ දී විශේෂයෙන් ම තුන්වන ව්‍යවස්ථාව පැවති කාලයේ දී කරන ලද සංශෝධනයන් ගණනාවක් ම ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක මූලික ව්‍යුහයට මුළුමනින් ම පටහැණි ය.

වරක් ජේ. ආර්. ජයවර්ධන මහතා කියා සිටියේ ව්‍යවස්ථාදායකයට ගැහැනියෙක් මිනිහෙක් බවට පත් කිරීමට හැර අන් සියලු දෙයක් ම කිරීමට බලය පවතින බව ය. ඒ ප්‍රකාශය මුළුමනින් ම ප්‍රජාතන්ත්‍රවාදී විරෝධී ප්‍රකාශයක් විය. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් තුළ ව්‍යවස්ථා නිර්මාණය කිරීම හා

ව්‍යවස්ථා සංශෝධනය කිරීම යන කරුණු දෙක සම්බන්ධයෙන් සුවිශේෂ අවබෝධයක් ජේ. ආර්. ජයවර්ධන මහතාට නොතිබි බව ඒ ප්‍රකාශයෙන් ම පැහැදිලි වේ.

7 පරිච්ඡේදය

අපරාධ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කර ගැනීමට බැරි නම් ව්‍යවස්ථා නීතියෙන් ඇත්තේ කුමන ඵලයක් ද?

රට පුරා ම නැඟෙන අඳෝනාව නම් අපරාධ වැඩි වීම මෙන් ම ඒ අපරාධ ගැන පොලීසියත් අධිකරණයත් ක්‍රියා කරන ආකාරය ගැම්මකට නැති බව ය.

පොලිස් සේවයකින් අපරාධ පිළිබඳ ව කළ යුතු වන සේවාවන් දෙක නම්, අපරාධ මර්දනය හා අපරාධ පරීක්ෂණය ය. මේ අංශ දෙකෙන් ම ශ්‍රී ලංකාවේ අරාජක තත්ත්වයකි පිළිබිඹු වන්නේ. මේ පිළිබඳ ව ඉහත පළ කර ඇති ලේඛනවල දී නැවත නැවත සඳහන් කොට ඇත.

අපරාධ නැති කිරීම සම්බන්ධයෙන් අධිකරණයෙන් කෙරෙන ක්‍රියාමාර්ගය වන්නේ, සාධාරණ ව නඩු විභාග කිරීම මඟින් අපරාධකරුවන්ට දඬුවම් දී, අපරාධ කළ හොත් ඇති වන ප්‍රතිඵල ආනිසංසයන් ගැන මතයක් සමාජගත කිරීම ය.

මේ කරුණ සම්බන්ධයෙන් ලංකාවේ අධිකරණය අසාර්ථක වීමට ප්‍රධාන හේතුව නම් නඩු අසා අවසන් කිරීමට විශාල කාලයක් ගත වීම ය. ඒ කාලය අවුරුදු දහයක් පහළොවක් අතර බව ගවේෂණවල දී පෙනී ගොස් ඇත.

මෙසේ නඩු පමා කිරීමෙහි ඇති අනිසි ප්‍රතිඵල මොනවා ද? මේ පිළිබඳ ව එක් සාකච්ඡාවක දී ප්‍රශ්නයක් මතුකරනු ලදුව ඊට සහභාගි වූ අයගෙන් ලැබූ පිළිතුරු අනුව නඩු පමාව නිසා ඇති වී ඇති විශාල අගතිගාමී ප්‍රතිඵල 14 ක් ඉහත තුන්වන පරිච්ඡේදයේ සඳහන් කොට ඇත. (34-35 පිටුව බලන්න).

එසේ සඳහන් කරුණු එක් නඩුවක් උදාහරණයට ගෙන සලකා බැලීම වටී. 2001 දී එක් වතුකරයේ පාසල් දැරියක් පුරුෂයන් දෙදෙනෙකු විසින් දූෂණයට පත් විය. එදින ම චූදිතයන් දෙදෙනා

අත්අඩංගුවට ගන්නා ලදි. එතැන් සිට නීතිපති දෙපාර්තමේන්තුව මඟින් නඩු පැවරීම දක්වා අවුරුදු පහකට වැඩි කාලයක් ගත විණි. ඉන් පසු මහාධිකරණ දෙකක දී ම මේ නඩුව අසන ලද අතර, එය අවසන් වූයේ 2015 අග භාගයේ දී ය. විත්තිකරුවන් දෙදෙනාට ම දූරිය පැහැර ගැනීම සම්බන්ධයෙන් අවුරුදු පහ බැගිනුත්, දූෂණය සම්බන්ධයෙන් අවුරුදු 18 බැගිනුත් දඬුවම් කරන ලදි. මෙයින් සනාථ වන්නේ පැමිණිල්ල සැබෑ එකක් වූ බවත්, නඩුව ඔප්පු කිරීමට තරම් සාක්ෂි පැවතුණු බවත් ය.

නඩුවේ සාක්ෂි දුන් සාක්ෂිකරුවන්ගේ ගණන හා ඔවුන්ගේ ඒ සාක්ෂි දීමට ඇත්තෙන් ම උසාවියේ දී ගත වූ කාලය බලන කල මේ නඩුව මුල සිට අගට එකවරක පැවැත්වූවා නම් සතියක් හෝ වැඩිම වශයෙන් සති දෙකක් ඇතුළත දී මේ නඩු විභාගය අවසන් කිරීමට හැකියාව තිබූ බව පෙනී යයි. එසේ ඉක්මනින් නඩු අසා සිද්ධියෙන් වැඩි කාලයක් ගතවීමට පෙර විත්තිකරුවන්ට දඬුවම් කළා නම් එය සමාජය තුළ ස්ත්‍රී දූෂණ කිරීම සම්බන්ධයෙන් දැඩි භයක් ඇති කිරීමට ඉඩ තිබිණි. අපරාධයට දඬුවම නිසැක ව ම හා ඉක්මනින් ලැබෙන බව දැන ගත් විට අපරාධකරුවෝ අපරාධ කිරීමට බිය වෙති. එමෙන් ම මෙසේ ඉක්මනින් දඬුවම් කිරීමේ පුරුද්දක් රටේ පවතින බව පිළිබඳ මතය සමාජගත වූ විට කවුරුත් අපරාධ කිරීමට බිය වෙති.

එහෙත් අපරාධකරුවෙකු දීර්ඝ කාලයක් නිදැල්ලේ සිටිනු දකින විට ඇති වන්නේ ඊට හාත්පසින් වෙනස් හැඟීමකි. අපරාධකරුවා තුළ ඇති වන හැඟීම නම් අපරාධයක් කිරීමෙන් පසුත් බොහෝ කාලයක් නිදැල්ලේ සිටිය හැකි බව ය. සමාජයේ වෙනත් අයගේ මතය ලෙස ඉස්මතු වන්නේ අපරාධයට දඬුවම් නොලබා සිටීම එතරම් අමාරු කාර්යයක් නොවන බව ය.

මේ අපරාධයේ විත්තිකරුවන් දෙදෙනා ම තමන් එසේ අපරාධයක් නොකළා යැයි අවුරුදු පහළොවක් තිස්සේ ම කිය කියා සිටියහ. මේ කාලය තුළ මේ සැකකරුවන් විවාහයන් ද කර ගන්නා ලදි. එසේ කර ගන්නා ලද්දේ ද තමන් අහිංසකයන් සේ පෙනී සිටීමෙන් ය. මේ නිසා ඔවුන් හා සම්බන්ධකම් ඇති කර ගත්තෝ එසේ කළේ ඔවුන්ගේ වංචනිකත්වයට රැවටුණු නිසා ය. ඉන් පසුව මේ සැකකරුවන් දරුවන් ද ලබා ඔවුන් ඉදිරියේද අහිංසකයන් සේ හැසිරුණහ. මේ සියල්ලන් මොවුන්

සැබෑ අපරාධකරුවන් බව දැන ගත් විට ඔවුන් තුළ ඇති වන්නේ කුමන හැඟීමක් ද? අපරාධයට වන්දි ගෙවන්නට සිද්ධ වන්නේ අපරාධකරුවන් දෙදෙනාට ම පමණක් නොව ඔවුන් සමඟ සම්බන්ධතා පවත්වා ගත් සියලු දෙනාට ය. අපරාධ නඩු ඇසීම කෙටි කාලයක් තුළ සිදු වූවා නම් මේ බාහිර පුද්ගලයන් ඔවුන් දැන් වැටී ඇති තත්ත්වයට පත්වන්නේ නැත.

අධිකරණයකට යම් පාර්ශ්වයක් කියන බොරු හෙළිදරව් කර ගැනීමට අවුරුදු පහළොවක් පමණ කාලයක් ගතවේ නම්, එයින් කියවෙන්නේ බොරුවක් හෙළිදරව් කර ගැනීම සඳහා තිබිය යුතු මානසික සූදානම මෙන් ම එය කර ගැනීමට තිබිය යුතු නිපුණතාව හා පහසුකම් අධිකරණයට නොතිබුණු බව ය.

නඩුව පවත්වා ගෙන ගිය අවුරුදු පහළොවක් පමණ වූ මේ දීර්ඝ කාලය පුරා ම සමහර නීතිඥයින් මේ බොරුව පවත්වා ගෙන යෑමට ඉඩ දුන්හ. මෙයින් වෘත්තිය සදාචාරය පිළිබඳ ව ඉතා වැදගත් ප්‍රශ්න මතු වේ. අපරාධකාරයෙකුට බොරුවක් මවාපාමින් නිදැල්ලේ සිටීමට හවුල් කරුවෙකු බවට නීතිඥයින් පත් වීම සදාචාරාත්මක ද? මෙවැනි තත්ත්වයක් පවතිද්දී අධිකරණ ක්‍රියාමාර්ගය පිළිබඳ ව ද මහජනතාව අතර යම් ව්‍යාකූලත්වයක් ඇති වීම ස්වභාවික ය. එය ද අධිකරණයට තිබිය යුතු ගෞරවය මහජනතාව තුළින් තුරන් වී යෑමට හේතු වී ඇතුවාට සැකයක් නැත.

දහසකුත් මෙවැනි අපරාධ පිළිබඳ ව අත්දැකීම් ඇති රටේ ජනතාව අපරාධ නීතිය ක්‍රියාත්මක කිරීමට රජයට ඇති හැකියාව මෙන් ම උවමනාව ගැන ද සැක ඇති කර ගෙන තිබීම ද පුදුමයක් නොවේ.

අපරාධයකට විසඳුමක් වත් දෙන්නට බැරි රාජ්‍යයක් විසින් ව්‍යවස්ථාමය නීති පිළිබඳ ව ගරු කිරීමක් පවත්වා ගෙන යාවි ද? කියා මිනිසුන් අතර සැකයක් ඇති වීම පුදුමයක් නොවේ.

මේ අනුව ව්‍යවස්ථා නීතිය ගැන ගරුත්වයක් ඇතිවීමට නම් අපරාධ නීතිය නිසි ලෙස ක්‍රියා කිරීමට රජයට හැකි බව, රජය ජනතාවට ඒත්තු ගැන්විය යුතු ය.

මෙහි දී විශේෂයෙන් සලකා බැලිය යුත්තේ නඩු පමාව නිසා බොරුව මත පදනම් වූ නඩු කීමේ සම්ප්‍රදායක් ඇති වී තිබීම ය. ජනතාව අතර පතළ ව ඇති මතයක් නම් නඩු කීම

වනාහි බොරු කීමේ දක්‍ෂයෙකුට පමණක් සාර්ථක ව කළ හැකි එකක් බව ය. දක්‍ෂ නීතිඥයා ඇත්ත බොරුව කිරීමටත් බොරුව ඇත්ත කිරීමටත් දක්‍ෂතාවක් ඇත්තෙකු ලෙස හැඳින්වීම ද ජනවිඥානයේ කොටසක් හැටියට පත් වී ඇත.

එහෙත් නඩු කීම යනු දෙපාර්ශ්වයක් තුළ ඇති වී ඇති ගැටලුවක් සාධාරණ ව විසඳා ගැනීම සඳහා වර්ධනය කොට ඇති සම්ප්‍රදායන් මත පදනම් වූ සදාචාරාත්මක ක්‍රියාවලියකි. විනිශ්චකාරවරයෙකුගේ මැදිහත් වීම මඟින් දෙපාර්ශ්වය අතර පවතින ගැටලුවට පදනම් වී ඇති කරුණු සාර්ථක ව තෝරා බේරා එහි දී අසාධාරණයට පත් වූ පාර්ශ්වය හඳුනා ගෙන ඒ අනුව සහන සැලසීම හුදෙක් ම බුද්ධිය හා තර්ක ඥානය මත පදනම් වූ ක්‍රියාවලියක් සේ සලකුණු ලබයි. ඒ නිසා එය සත්‍යය පිළිබඳ ගවේෂණයකි. එහි දී නීතිඥයාගේ කර්තව්‍යය වන්නේ අධිකරණයේ සහායකයෙකු සේ කටයුතු කිරීම ය. අධිකරණය නොමඟ යැවීමට උත්සාහ කරන නීතිඥයා ඔහුගේ වෘත්තීයේ සම්ප්‍රදායන් මුළුමනින් ම නොතකා හරින්නෙකි.

එහෙත් ලංකාවේ බොහෝ දුරට බොරුවක් මවා පා ඒ මඟින් අධිකරණය බොහෝ කලක් මුළා කිරීමේ හැකියාව ඇති වී තිබෙන්නේ නඩු පමාව නිසා ම ය. සුළු කාලයක් තුළ නඩුවකට අදාළ සියලු කරුණු සලකා බලා විසඳීමේ හැකියාව අධිකරණයකට පවතී නම්, බොරුවට ඇති ඉඩකඩ එමඟින් හැකිළී යයි.

නඩු පමාව නිසා සියල්ලන්ට ම මෙන් අධිකරණය පෙනෙන්නේ ඉමහත් කරදරයක් ලෙස ය. ඒ නිසා ඔහු අධිකරණය මඟහැර වෙනත් මාවත් මඟින් තම ප්‍රශ්න විසඳා ගැනීමට උත්සාහ කරයි. එමඟින් ඉතා විශාල ලෙස දූරාචාරයට මග පෑදේ.

මහජනයා පමණක් නොව රජය ද අධිකරණය මඟහැර ක්‍රියා කිරීමට උත්සාහ කරයි. 1972 ව්‍යවස්ථාව මඟින් අධිකරණයේ බලය බොහෝ සේ සීමා කිරීමට එක් හේතුවක් ලෙස නඩු පමාව ද හේතු වන්නට ඇතැයි සිතීමට හේතු ඇත. මේ ආකාරයෙන් රජය අධිකරණ මඟහැරීමට කරන උත්සාහය රට පුරා ම විශාල ව්‍යවසනයක් ඇති කිරීමට තරම් හේතු වී ඇත.

8 පරිච්ඡේදය

2015 දෙසැම්බර් මස 06 වන දින 'රාවය' පුවත් පතේ පළ වූ 'යහ පාලනය දේශපාලන දහංගැටයක් ද?' යන මාතෘකාව යටතේ මහාචාර්ය සරත් විජේසූරිය මහතා විසින් රචිත ලිපියකි.

යහ පාලනය දේශපාලන දහංගැටයක් ද?

මහාචාර්ය සරත් විජේසූරිය

මේ රටේ බිහි වූ විශිෂ්ට ගණයේ මානව හිතවාදී කවියෙකු, සැබෑ ම විද්වතෙකු මෙන් ම ජාත්‍යන්තර කීර්තියට පත් ව සිටින නීති විශාරදයෙකු වන බැසිල් ප්‍රනාන්දු මහත්මාගේ අගනා දේශනයකට සවන් දීමට හා එතුමා සමඟ ගොඩනැඟුණ විවෘත සංවාදයට සහභාගි වීමට අගනා අවස්ථාවක් මට ලැබිණි. ඒ අවස්ථාවට සහභාගි වීමෙන් ලත් ප්‍රහර්ෂයෙන් අනූන අවබෝධය පිළිබඳ අදහස් කීපයක් පළ කිරීම මේ ලිපියේ පරමාර්ථයයි.

අප ජීවත් වන රට ශීලාචාර රටක් බවට පත් කර ගැනීම, මෙකල මේ රටේ නීති ගරුක පුරවැසියන් දකින සිහිනයකි. ඒ වෙනුවෙන් කළ යුතු වැදගත් ම දේ කුමක් ද යන ප්‍රශ්නයට විවිධ පිළිතුරු නිරන්තරයෙන් බොහෝ දෙනා ඉදිරිපත් කරති. මාදුළුවාවේ සෝභිත හිමියන්ට මේ සඳහා තිබුණේ එකම පිළිතුරකි. එය නම් විධායක ජනාධිපති පදවිය අහෝසි කිරීම යන්නයි.

බැසිල් රාජපක්ෂ නමැති බලතණ්හාධික දූෂිත හා සාපරාධී ඇමැතිවරයාගේ සේවකයෙකු ව සිටි විශ්ව විද්‍යාලයක සේවය කරන කථිකාචාර්යවරයෙකු පසු ගිය දවසක පුවත් පතකට ලිපියක් ලියමින් ප්‍රශ්න කර සිටියේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමෙන් වඩා යහපත් රටක් ගොඩනැඟෙන්නේ ද යන්නයි. නැතහොත් යහ පාලනයක් රටට උරුම වන්නේ ද යන්නයි. මේ කථිකාචාර්යවරයාට වඩා සෝභිත හිමියන්ගේ ව්‍යවහාරික නුවණ ගව් ගාණක් ඉහළින් තිබෙන බවය බැසිල්

ප්‍රනාන්දු මහතාට ඇහුම් කන් දෙන විට මට පසක් වුණේ. බැසිල් ප්‍රනාන්දු මහත්මා මේ රට අශීලාචාර රටක් බවට පත් ව තිබෙන අන්දමත්, මේ රට ශීලාචාරත්වය කරා ගමන් කිරීමට කළ යුතු දේ පිළිබඳවත් තීක්ෂණ අන්දමින් සිදු කළ මනා විවරණයෙන් පැහැදිලි කර සිටියේ විධායක ජනාධිපති පදවිය අහෝසි කිරීම ඊට අවශ්‍ය වැදගත් කර්තව්‍යයක් බවයි.

යහ පාලනය

විධායක ජනාධිපති පදවිය අහෝසි කිරීමත් සමඟින් යහපත් ආණ්ඩුකරණයකට අවශ්‍ය කරුණු කිහිපයක් එතුමා පැහැදිලි කළේ ය. ඒ අතරින් ප්‍රධානතම කාරණාව වූයේ නීතියේ ආධිපත්‍යය ගොඩනැඟීමට අවශ්‍ය ව්‍යුහයන් නිසියාකාරව ශක්තිමත් කිරීම ය. මේ රටේ යහ පාලනයක් ඇති කිරීමට මෙවර මැතිවරණයේ දී දුන් ප්‍රතිඥාව හා එය ක්ෂණික ව ඉටු කිරීමට පියවර ගෙන තිබෙන බවට පවසන රසවත් කථා සියල්ල තවමත් දේශපාලනික බල ව්‍යුහයක තාවකාලික පැවැත්මට අලංකාර සැරසිල්ලක් බවය බැසිල් ප්‍රනාන්දු මහතාගේ දේශනයේ මූලික ප්‍රවාදය වූයේ.

යහ පාලනය ඇති කරන බවට වචනයෙන් පොරොන්දු වුව එය කළ නොහැකි බවත්, එය සිදු නොවන බවත් බැසිල් ප්‍රනාන්දු මහතා අවධාරණයෙන් පැවසී ය. ඊට හේතුව රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට අදාළ ව්‍යුහයන් සියල්ල බිඳ වැටී තිබීම ය. ඒ ව්‍යුහයන් ගොඩනැඟීමට අය වැයෙන් විශාල මුදලක් වෙන් කළ යුතු බව එතුමා පෙන්වා දුන්නේ ය. ඒ කුමකට ද? පළවෙනිව පොලීසිය උසස් තත්ත්වයකට පත් කිරීමට අවශ්‍ය පුහුණුව සඳහා ය. දෙවනුව නීතිපති දෙපාර්තමේන්තුවේ ශක්‍යතාව දෙගුණයකින් වැඩි කිරීම සඳහා ය.

ජනවාරි අට වන ද රටේ සිදු කළ වෙනස, සැබෑ වෙනසක් බවට පත් කිරීමේ පරම වගකීම තිබෙන්නේ ජනාධිපතිවරයාට හෝ අග්‍රාමාත්‍යවරයාට හෝ නොවන බවත්, ඒ වගකීම තිබෙන්නේ මුදල් ඇමැතිවරයාට බවත් පවසමින්, තමන් රවි කරුණානායකට දීර්ඝ ලිපියකින් ඒ ගැන කරුණු පැහැදිලි කළ බව ද බැසිල් ප්‍රනාන්දු මහතා පවසා සිටියේ ය. එතුමා රවි කරුණානායක මහතාට යවන ලද ලිපියේ අදහස් කීපයක් මෙසේ ය.

".....යහ පාලනය සඳහා ගනු ලබන පියවර ක්‍රියාත්මක වන බවට සහතික වනු පිණිස ඔබට ඉතා වැදගත් භූමිකාවක් ඉටු කිරීමට සිදු වනු ඇත්තේ, වචන ක්‍රියාවන් බවට හැරවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම අවශ්‍ය වන හෙයින් සහ, ඒ සඳහා අවැසි කාර්යභාරය ඉටු කළ යුතු ව තිබෙන්නේ ඔබේ අමාත්‍යාංශයෙන් වන හෙයිනි. අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම අවශ්‍ය වන ප්‍රධාන ක්ෂේත්‍රයන් දෙකක් වන්නේ,

01. රටේ පවතින ඉතා ප්‍රාථමික ගණයේ පොලිස් ක්‍රමය, බොහෝ රටවල තිබෙන නූතන හැකියාවන් හා ගුණාත්මයන්ගෙන් සමන්විත පොලිස් ක්‍රමයක් බවට නවීකරණය කිරීම සඳහා ගනු ලබන පියවර සහ,

02.අල්ලස් හා දූෂණ වැළැක්වීම සඳහා වූ වැඩ සටහනක් නියමාකාරයෙන් ක්‍රියාවට නැංවීම සඳහා, අද වන විට රටවල් ගණනාවක සාර්ථක ලෙස ක්‍රියාත්මක වන අන්දමේ අල්ලස් සහ දූෂණයට එරෙහි කොමිසමක් ස්ථාපිත කිරීම. මේ සඳහා එක් පිළිගත් ක්‍රමවේදයක් වන්නේ හොංකොංහි අල්ලසට එරෙහි ස්-වාධීන කොමිසමය...."

යහ පාලනය සඳහා ප්‍රථමව, අවශ්‍යයෙන් ම දියුණු කළ යුතු ආයතනය පොලීසිය බවත්, පොලීසිය දියුණු තත්ත්වයකට පත් නොකර යහ පාලනය ගැන කතා කිරීම නිෂ්ඵල බවත්, එය රැවටිල්ලක් බවත් බැසිල් ප්‍රනාන්දු මහතා පෙන්වා දෙන්නේ අප රට තුළ පවතින පොලීසිය ඉතා ප්‍රාථමික, නොදියුණු සහ බාල තත්ත්වයේ එකක් බවයි. පොලිස් ක්‍රමයට සිදු කරන මූලිකතම ප්‍රතිසංස්කරණවලින් තොර ව, නූතන දේශපාලන සන්දර්භය තුළ යහ පාලනය සාක්ෂාත් කර ගැනීමට නොහැකි බවත්, එය රාජ්‍ය පාලකයන් යම් අන්දමකට දන්නා කරුණක් නමුත් නිසි අන්දමට අවශ්‍ය පියවර ගැනීම සඳහා කටයුතු නොකරන බවත්, බැසිල් ප්‍රනාන්දු මහතා පෙන්වා දුන්නේ ය. තව දුරටත් එතුමා විග්‍රහ කළේ රටේ සංවර්ධනයට පොලීසිය දියුණු කිරීමේ වැදගත්කම ගැනයි. ආර්ථික සංවර්ධනයේ දැක්ම අනුව ද, නූතන සිවිල් පොලිස් ක්‍රමයක් සංස්ථාපනය කිරීම ඉතා මූලිකතම අවශ්‍යතාවක් වන්නේ, දේශීය ව්‍යවසායන් සඳහා ආචාර විධියක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් ද පොලීසිය විසින් සිදු කරන දයකත්වය කේන්ද්‍රීය වන නිසා බව පැහැදිලි කළේ ය. මෙහි දී මතු කෙරුණ

ප්‍රශ්නයකට පිළිතුරු දෙමින්, එෆ්. සී. අයි. ඩී. එක පිහිටුවීම හා ඊට අවශ්‍ය පුහුණුව ලබා දීමට අනුගමනය කළ පියවර තුළ සාධනීය අගයක් ඇතැයි ද එතුමා පැවසී ය. එහෙත් එය ප්‍රමාණාත්මකව සලකා බලන විට සෑහීමකට පත් විය නොහැකි බැවින්, එය සැලකිය යුතු අන්දමේ ප්‍රතිපාදන වෙන් කොට පුළුල් කිරීම යහ පාලනය යථාර්ථයක් බවට පත් වීමට නම් අවශ්‍යයෙන් ම ඉටු විය යුතු වගකීමක් බව ද පැවසී ය.

අල්ලස අද අප රට තුළ පවතින අන්දම අතිශයින් දරුණු ය. බැසිල් ප්‍රනාන්දු මහතාට අනුව නම්, නිදහසින් පසු යුගයේ දී ශ්‍රී ලංකාව අල්ලස හා දූෂණයට එරෙහි ව ඵලදායී කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා සැබෑ උත්සාහයක් කිසි විටෙක දරා තිබේ ද යන්න මතභේදයට තුඩු දෙන කාරණයකි. මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීමක් මුදල් ඇමතිවරයාට ලියන ලද උක්ත ලිපියේ සඳහන් ය. එහි වගන්ති කිහිපයක් මෙසේ ය.

"....බ්‍රිතාන්‍යයන් පවා ශ්‍රී ලංකාව හැර දමා යන විට එවැනි පාලන යාන්ත්‍රණයක් පිහිටුවාගෙන නොතිබිණි. කෙසේ නමුත් හොංකොංහි දී බ්‍රිතාන්‍යයන් කළේ වෙනත් දෙයකි. 1997 වසරේ බ්‍රිතාන්‍යයන් හොංකොංහි යටත් විජිත පාලනය අවසන් කරන විටත් ස්ථාවර, ස්ථාපනය කරන ලද ස්වාධීන කොමිෂන් සභාවක් තිබිණි. එය පිහිටුවීම සඳහා තීරණාත්මක පියවර 1974 වර්ෂයේ ගනු ලැබීමෙන් අනතුරුව වසර කිහිපයක් ඇතුළත එය සිය අරමුණ වෙත ළඟා විය. අද වන විට හොංකොං රාජ්‍යය වෙත ස්ථාවරත්වය ලබා දෙන විශිෂ්ටතම හා විශාලතම ශක්තිය වී තිබෙන්නේ මේ ඵලදායී දූෂණ පාලන ක්‍රමවේදයයි. දූෂණය සමාජයක් වඩාත් ම අස්ථාවර කරන සාධකය බවත්, එයට නැවත හිස එසවීමට ඉඩ නොදිය යුතු බවත්, අද වන විට හොංකොංහි දේශපාලන පරමාධිපත්‍යය චීනයට පවරා දුන්න ද, මේ ස්වාධීන කොමිසමේ ඵලදායීතාව තවමත් පවතින අතර නියත වශයෙන් ම එය තව තවත් වැඩි දියුණු වෙමින් තිබේ. නැවත වරක් දූෂණය අවසන් කිරීම සහ රාජපක්ෂ පවුලේ අතිමහත් දූෂණය හෙළා දැකීම අතර කතාව සහ සැබවින් ම ඵලදායී දූෂණ මර්දන ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා, ඵලදායී කොමිසමක් ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය අය වැය ප්‍රතිපාදන සැපයීම වැදගත් ය. ඵලදායී කොමිසමකට තමන්ගේ ම විමර්ශන පරාසයක් තිබිය

යුතු අතර එයින් අදහස් කරන්නේ පොලිස් නිලධාරීන් කොමිසමට අනියුක්ත කරමින් බඳවා ගැනීම නොකළ යුතු බවයි. මෙය හොංකොංහි සාර්ථකත්වයට ඉවහල් වී තිබෙන ඉතාමත් ම තීරණාත්මක සාධකයකි. දූෂණ මර්දන කොමිසමේ කාර්ය මණ්ඩලය ස්වාධීන නොවේ නම් සහ ඔවුන් පොලීසිය සමඟ සම්බන්ධ නම්, විමර්ශනයන් පිළිබඳ තොරතුරු පිටස්තරයන් අතට පත්වීම වැළැක්විය නොහැකි වේ."

අද දවසේ අල්ලස් හා දූෂණ විමර්ශන කටයුතු සම්බන්ධ විද්‍යමාන තත්ත්වය ගැන නීති ගරුක පුරවැසියන්ගේ සතුටක් නැත. ඒ මන්ද? දූෂණ විමර්ශන සිදු කරන ව්‍යුහය පිරිහී ඇතුවා පමණක් නොව එය ගඳ ගහන තරමට කුණු වී තිබෙන්නකි. ආණ්ඩුව යහ පාලනය වෙනුවෙන් අවංක ව ම පෙනී සිටින්නේ නම්, පවතින ව්‍යුහය තුළ එය සිහිනයක් විනා යථාර්ථයක් නොවේ. කාර්යක්ෂම දූෂණ මර්දනයක් සඳහා ඉහළ පුහුණුවක් ලද විමර්ශකයන් සහ තාක්ෂණික පහසුකම් අවශ්‍ය වේ. ආණ්ඩුව මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන් නොකරන්නේ, මුදල් නොමැතිකමට වඩා එවැනි සංදර්භයක සකල විධ දේශපාලනඥයන්ගේ ඉරණම තීරණාත්මක වන බැවිනි. ආණ්ඩුවට දූෂණය පිටු දැකීමට සැබෑවට ම අවංක උවමනාවක් තිබේ නම් ඒ සඳහා ගත යුතු තීරණ මේ වන විට ගත යුතු ව තිබේ. එහෙත් සිවිල් සමාජය කෑ ගසන විට සුළු දෙයක් කරන තත්ත්වයකි විද්‍යමාන වන්නේ. මේ වූකලි සැබවින් ම ව්‍යාජයකි.

දහම් ගැට

අල්ලස දූෂණය පිටු දැකීම උදෙසා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම විනා වෙනත් විකල්පයක් නොමැති ද? බැසිල් ප්‍රනාන්දු මහතා පවසන්නේ නොමැති බවයි. ඊට පිළිතුර ඉතා පැහැදිලි ය. අල්ලස හෝ දූෂණය පිටුදකින්නට උත්සාහ කරන්නේ දුර්වල නෛතික ව්‍යුහයක් ඉවහල් කර ගෙනය. ඵලදායී දූෂණ මර්දනයක් සඳහා අවශ්‍ය සියලු සම්පත් දැන් ලෝකයේ තිබෙන බැවින් අවශ්‍ය පරිණාමය සඳහා ඒ සම්පත් උරුම කර ගත යුතු ය. බැසිල් ප්‍රනාන්දු මහතා වැඩි දුරටත් පෙන්වා දෙන්නේ, ප්‍රායෝගික පියවර සාක්ෂාත් කර ගැනීමට නම්, පුරසාරම හා සත්‍යය අතර වෙනස වටහා දිය හැක්කේ මුදල් අමාත්‍යාංශයට

බවයි. රවි කරුණානායක මුදල් ඇමැතිවරයා ලෙසින් කටයුතු කරන තාක් කල් මේ ගැන බලාපොරොත්තුවක් හෝ නීති ගරුක පුරවැසියන්ට තබා ගත නොහැකි ය. එක අතකින් ඊට ඔහු වෙන් කර චෝදනා කිරීමට ද නොහැකි ය. මේ සම්බන්ධ වගකීම ජනාධිපතිවරයා මෙන් ම අග්‍රාමාත්‍යවරයා ද දැරිය යුතු ය. නීති ගරුක පුරවැසියන්, අල්ලස හා දූෂණය පිටු දැකීමේ පරම වගකීම ඉටු කිරීම මොන අන්දමකින්වත් රවි කරුණානායක මහතාගෙන් අපේක්ෂා කළේ නැත. අපේක්ෂා කළේ ජනාධිපතිවරයාගෙන් හා අගමැතිවරයාගෙන් ය.

අල්ලස හා දූෂණය පිටු දැකීමට අවශ්‍ය නෛතික රාමුව ගොඩනගා ගැනීමට මුදල් වෙන් කිරීම යන කාරණාව බැලූ බැල්මට ඉතා සරල කාරණාවක් නොවේ දැයි පෙනී යා හැකි ය. සැබවින් ම සරල නැත. එය සරල නැති බව වටහා ගැනීමට පොලීසියට අදත් නිලධාරීන් බඳවා ගන්නා අන්දම විභාග කිරීම ප්‍රමාණවත් ය. අවම අධ්‍යාපන සුදුසුකම්වලින් බඳවා ගන්නා ලද නිලධාරීන් බහුතරයකි පොලීසියේ සිටින්නේ. ඔවුන්ට ලැබෙන්නේ හිඟන වැටුපකි. ඔවුන්ට දේශපාලනඥයන්ගේ අතකොලු නොවී සිටීමට අපහසු ය. එසේ නම් පොලීසියට බඳවා ගත යුත්තේ ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලත් පුද්ගලයන් ය. ඒ අතර විද්‍යා අංශයෙන් හා ගණිත අංශයෙන් උපාධි ලැබූවන් සැලකිය යුතු පිරිසක් අවශ්‍ය වන්නේ ය. එවැනි පිරිසක් අවම වශයෙන් අල්ලස් කොමිසමටවත් බඳවා ගැනීම අවශ්‍ය වේ. ඒ සඳහා ආකර්ෂණීය වැටුප් තලයක පිහිටුවා පිරිසක් බඳවා ගත යුතු ය. එමෙන් ම ඔවුන්ට විධිමත් විදේශීය පුහුණුවක් ලබා දිය යුතු ය. මේ කාර්යභාරය සඳහා සෑහෙන මුදලක් වෙන් කළ යුතු ම වේ.

ලංකාවේ පොලීසිය, දූෂණ මැඩලීම සඳහා විශේෂ පුහුණුවක් ක්‍රමානුකූල ව ලබා දෙමින් ගොඩනඟන ලද ආයතනයක් නොවන බව පැහැදිලි ය. පොලීසියට බඳවා ගන්නේ තවමත් උස මහත ශරීර ටිකකි. උසස් අධ්‍යාපනයක් ලත් පිරිසක් බඳවා නොගෙන උසස් පොලීසියක් ගොඩනඟන්නේ කෙසේ ද?

අනෙක් තියුණු ම කාරණාව වන්නේ පොලිස් නිලධාරීන් යොදවා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ කටයුතු සිදු කිරීමට පියවර ගැනීම ය. එය සාර්ථක පියවරක් නොවන බවය බැසිල් ප්‍රනාන්දු මහතා අවධාරණය කරන්නේ. අල්ලස හා

දූෂණය ඉහ වහා ගිය රටක ස්වාධීන කොමිෂන් සභාවක් පිහි-ටුවා ඊට නිලධාරීන් බඳවා ගෙන පුහුණු කිරීම විධිමත් හා උසස් ක්‍රමවේදයක් යටතේ සිදු කළ යුතු ය. බැසිල් ප්‍රනාන්දු මහතා කතා කරන විට පැහැදිලි වූයේ එය, වෛද්‍යවරුන් බිහි කරන ක්‍රමවේදයට සාම්‍යයක් උසුළන ක්‍රමවේදයකට පරිණාමය විය යුතු බව ය.

ජනවාරි අට වන ද ජයග්‍රහණයට නීති ගරුක පුරවැසියන් දයක වූයේ ද, මහින්ද රාජපක්ෂ පරාද කිරීමට හේතු වූයේ ද දූෂණයයි. දූෂණය ජනාධිපති ආර්යාවගේ සහ දරුවන්ගේ සිට පැහැදිලි ව ම දක්නට තිබුණේ ය. ඒ උදවියට අදාළ ඉතා සරල නිදසුනක් වන්නේ 'සිරිලිය' ගිණුමයි. සිරිලිය ගිණුම සම්බන්ධයෙන් ශිරන්ති රාජපක්ෂගෙන් කට උත්තරයක් අවශ්‍ය වූ විට ඒ කට උත්තරය දෙන්නේ කථානායක නිල නිවසට නිලධාරීන් කැඳවමිනි. ඒ නිලධාරීන් කට උත්තරය ගන්නා විට නිල ඇඳුමෙන් සැරසුණ යෝෂිත රාජපක්ෂ එක පසෙකින් ද, අනෙක් පැත්තෙන් නීතිඥයෙකුගේ ස්වරූපයෙන් නාමල් රාජපක්ෂ ද පෙනී සිටින්නේ ය. මෙහි සංයුතිය කොතරම් අශීලාචාර ද? හිටපු ජනාධිපතිගේ බිරිඳය, නිලධාරියෙකු අබිමුව සිටින්නේ. නිලධාරියා සිටින්නේ රාජකාරිය නිදහසේ සිදු කිරීමට හැකි ස්ථානයක නොවේ. කට උත්තර ගන්නේ කොහේ සිට ද? කථානායක වූ මස්සිනාගේ නිල නිවසේ සිට ය. කට උත්තර ගන්නා නිලධාරියා කවුරුන් ද? ආරක්ෂක ලේකම් ව සිටි මස්සිනාගේ අණසකට යටත්ව සේවය කළ නිලධාරියෙකි. මේ නිලධාරියා විද්‍යාත්මක පුහුණුවක් ලද, අභීත පෞරුෂයකින් හෙබි, ස්වාධීන ව රාජකාරිය සිදු කිරීමට අවශ්‍ය නිසි ආරක්ෂාවක් හිමි පුද්ගලයෙක් ද? කිසි සේත් ම නැත. ඔහු ද බඩ වියත වෙනුවෙන්, දරු පවුලක් නඩත්තු කිරීම වෙනුවෙන් රැකියාවක් කරන්නෙකි. සැබවින් ම මෙබඳු යථාර්ථයක දූෂණ විමර්ශන එක් අතකින් හාස්‍යජනක ය.

ශිරන්ති රාජපක්ෂගේ කට උත්තර ගැනීමට නිලධාරියෙකු කථානායක නිල නිවසට යන්නේ කාගේ අණක් හෝ කාගේ උපදෙසක් මත ද? නීතිය ක්‍රියාත්මක කිරීමේ දී, ජනාධිපතිගේ බිරිඳ වූ පමණින් ඇයට විශේෂ වරප්‍රසාදයක් හිමි කර දෙන්නේ මන්ද? එය හිමි කර දෙන්නේ කවුරුන් ද? මේ අවිනීත මැදිහත් වීම ප්‍රතික්ෂේප කිරීමට නිලධාරියෙකුට හැකි ද? මෙයින් ගම්‍ය

වන්නේ කුමක් ද? සිරිලිය ගිණුම පිළිබඳ විමර්ශනය නීති ගරුක පුරවැසියන්ගේ අභියෝගය වෙනුවෙන් දහම් ගැටයක් බව නොවේ ද? යහ පාලනයක් උදෙසා ලස්සණ වචන පැවසීම සැබවින් ම පුරසාරමක් නම්, එය අතිශයින් ජුගුප්සාජනක ය.

අල්ලස් හෝ දූෂණ විමර්ශන සඳහා තිබෙන ක්‍රමවේදය මෙන් ම, ඊට යොදා ගන්නා නිලධාරීන්ගේ තත්ත්වය ද අමුතුවෙන් තව තවත් විස්තර කළ යුතු නැත. යහ පාලනය ආණ්ඩුවේ සැබෑ උවමනාවක් නම්, ඒ වෙනුවෙන් බැසිල් ප්‍රනාන්දු මහතා යෝජනා කරන කාර්යභාරය ඉටු විය යුතු ම ය.

හොර ගල් ඇහිලීම

නීති ගරුක පුරවැසියන් සියලු දෙනාට ම අද රටේ පාලකයන්ගෙන් අසන්නට පොදු ප්‍රශ්නයක් ඇත. ඒ කුමක් ද? නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමට ආණ්ඩුව අවංක ව කැපවීමට සූදනම් ද? සූදනම් නම්, නීතිපති දෙපාර්තමේන්තුව වඩාත් පොහොසත් තැනක් බවට පත් කිරීම අවශ්‍ය වන්නේ ය. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුට ලිපිගොනු සිය ගණනක නොව දහස් ගණනක වැඩ කිරීමට සිදුව තිබෙන යථාර්ථයක යහ පාලනයට අවශ්‍ය අන්දමින් නීතිය ක්‍රියාත්මක වන්නේ නැත. නීතිය ක්‍රියාත්මක වීම පමා වන සංදර්භයක දූෂණය වැඩී වර්ධනය වන්නේ ය. නීතිපති දෙපාර්තමේන්තුවේ පිරිස දෙගුණයක් බවට පත් කිරීම සඳහා විශාල මුදලක් වෙන් කිරීම අවශ්‍ය වන්නේ ය. බැසිල් ප්‍රනාන්දු මහතා කරුණු සහිත ව පෙන්වා දෙන්නේ එය කළ යුතු බවයි.

ජනවාරි අට වන දයින් පසුව අදහස් පළ කිරීමට යම් නිදහසක් සියලු පුරවැසියන් භුක්ති විඳින තත්ත්වයක් තවමත් තිබේ. ඒ නිදහස ආරක්ෂා කිරීම රජයේ වගකීම වේ. ආණ්ඩුවේ පරම වගකීම යහ පාලනය නම්, ආණ්ඩුවේ සංවර්ධන න්‍යාය පත්‍රය නිර්මාණය විය යුත්තේ යහ පාලනයට අදළ මූලධර්ම කෙරේ නිසි අවධානයකිනි. ආණ්ඩුවෙන් නීති ගරුක පුරවැසියන් අපේක්ෂා කරන්නේ, වඩා යහපත් සමාජ සංස්කෘතික ජීවිතයක් භුක්ති විඳීමට අවශ්‍ය සංවර්ධනයකි. එහෙත් ආණ්ඩුව සැලසුම් කරන්නේ ජනතාව පිට බර පටවමින්, දේශපාලනඥයන්ට අභිමත අන්දමට දූෂණයේ දොරටු විවර ව තබා ගැනීමට නම් ආණ්ඩුවේ

ගමන තීරණාත්මක ය. ඉතිහාසය පුරා ම සිදු වන්නේ එය බව ය, බැසිල් ප්‍රනාන්දු මහතා පෙන්වා දෙන්නේ. ඕනෑ ම ආණ්ඩුවක් ඉතා ම ඉක්මනින් සිය බලය පවත්වා ගැනීම සඳහා මර්දනකාරී පිළිවෙත්වලට ආපසු ගමන් කරන බව මානව හිමිකම් සංවිධානයක් වශයෙන් ආසියානු මානව හිමිකම් කොමිසම හොඳින් ම තේරුම් ගෙන තිබෙන බව ද එතුමා අවධාරණයෙන් පවසා සිටියේ ය. මේ අනුව නව ආණ්ඩුව පොරොන්දු වී තිබෙන, 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සියලු අනර්ථකාරී අංගයන් වෙනස් කිරීම වැදගත් ය. මර්දනය, ප්‍රචණ්ඩත්වය නිමා කිරීමේ දී සහ නීතියේ ආධිපත්‍යය හා සුළු ජන අයිතිවාසිකම් ද ඇතුළත්ව මානව හිමිකම්වල රාමුව තුළ හිඳ ආරාවුල් සමථකරණයේ ආචාර විධි නිර්මාණය කිරීම අවශ්‍ය වන්නේ ය. මීට අදළ ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා විශාල වගකීමක් මුදල් අමාත්‍යාංශය සතු බව සුළු කොට සැලකිය නොහැකි ය. සැබවින් ම මුදල් අමාත්‍යාංශයේ මූලික භූමිකාව සරල කාරණාවක් නොවන්නේ ය. ගැටලුව වන්නේ මේ සම්බන්ධ මුදල් අමාත්‍යවරයා කොතරම් අවබෝධයකින් සිටින්නේ ද යන්නයි. අගමැතිවරයා ඒ සඳහා දෙන උපදෙස් කවරාකාර ද යන්නයි. ජනාධිපතිවරයා ඒ සඳහා දක්වන ආකල්පය කවරාකාර ද යන්නයි.

දූෂණ මර්දනය සහ දූෂණයට වැට බැඳීම එක වරම සිදු විය යුතු වන්නේ ය. දූෂණ මර්දනය තුළ ම දූෂණයට වැට බැඳීමේ කාර්යභාරය ද පවතින්නේ නම්, දේශපාලනඥයන් ඒ සඳහා අවංක ව කැප වේවි ද යන්න තවත් බරපතළ කාරණාවකි.

දූෂණ වංචා පිළිබඳ මැතිවරණවල දී කතා කිරීම පිළිබඳ පුරවැසියන්ට තිබෙන අත්දැකීම් අපමණ ය. එමෙන් ම ආණ්ඩු බලයක් ලැබුණ විට ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම සම්බන්ධ තත්ත්වය ගැන තිබෙන අවබෝධය ද පැහැදිලි ය. ආණ්ඩු බලය ලැබුණ පසු දේශපාලනඥයන් සිදු කරන්නේ දූෂණයයි. එනිසා දූෂණ මර්දනය හෝ ඊට වැට බැඳීම සම්බන්ධයෙන් ජනතාව මුළා කරමින් හොර ගල් අහුළන තත්ත්වය තේරුම් ගැනීම අපහසු නොවේ. තතු කෙසේ වුව මේ අවස්ථාවේ දී නම් නීති ගරුක පුරවැසියන් කම්පා වී නිහඬ ව නොසිට කැපවීමෙන් ආණ්ඩුව නිවැරදි මාවතට තල්ලු කර ගැනීමට කළ හැකි සැම දෙයක් ම කළ යුතු ය.

බැසිල් ප්‍රනාන්දු මහතා සිය දේශනය අවසන් කරමින් අවධාරණය කළේ මේ ආණ්ඩුව නිවැරදි මාවතට තල්ලු කර ගැනීමට තිබෙන අවකාශය තවමත් හොඳ මට්ටමක තිබෙන බවයි. එහි දී විශාල වගකීමක් තිබෙන්නේ සිවිල් සංවිධානවලට බව ද එතුමා පෙන්වා දුන්නේ ය. කල් නොමරා ආණ්ඩුව නිවැරදි පීල්ලට දමා ගැනීමට නම් සියලු සිවිල් බලවේග ඒකරාශී විය යුතු ය. ඒ ඒකරාශී වීම වැළැක්වීමට ආණ්ඩුව දෙයාකාරයකින් කටයුතු කිරීමට උත්සුක වන බව ද බැහැර කළ නොහැකි සාධකයකි. එක් ආකාරයක් වන්නේ වරදන ලබා දෙමින් සිවිල් සංවිධාන දිනා ගැනීම හා හීලෑ කර ගැනීමයි. අනෙක් ආකාරය වන්නේ සිවිල් සංවිධාන මර්දනය කිරීමයි. මේ උභය කාර්යය ම මහින්ද රාජපක්ෂ විසින් සිදු කරන ලදි. සම්මුතිවාදී ආණ්ඩුව ඒ පිළිවෙත් බැහැර කරන තැනක සිටින බවට කිසිදු සහතිකයක් නැත. ඒ සහතිකය නීති ගරුක පුරවැසියන් තමන් විසින් තමන්ට ම උරුම කර ගත යුතු වන්නකි..

9 පරිච්ඡේදය

ආසියානු මානව හිමිකම් කොමිසමෙන් ප්‍රකාශයක්

රවී කරුණානායක මහතා,
ගරු මුදල් අමාත්‍ය
ශ්‍රී ලංකා ආණ්ඩුව
කොළඹ.

ගරු අමාත්‍ය රවී කරුණානායක මහතාණෙනි,

අභිනවයෙන් තේරී පත් වූ ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආණ්ඩුවේ මුදල් අමාත්‍යවරයා වශයෙන් පත් වීම සම්බන්ධයෙන් මුලින් ම මම ඔබ වෙත සුබ පතමි. දශක ගණනක් මුළුල්ලේ අප රටේ නැති වී ගිය දෙයක් ව පැවති යහ පාලනය ස්ථාපිත කරන බවට නව ආණ්ඩුව ප්‍රතිඥා දී ඇති හෙයින් ඒ අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා කරනු ලබන සියලු ක්‍රියාකාරකම් හා වැඩසටහන්වලට අපගේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන බවට ආසියානු මානව හිමිකම් කොමිසම වෙනුවෙන් මම ඔබ වෙත සහතික වෙමි.

මා මේ ලිපිය ඔබ වෙත ලියන්නේ යහ පාලනය ස්ථාපිත කිරීමට සහ එය සාක්ෂාත් කර ගැනීමට නම් අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමට අත්‍යවශ්‍යයෙන් ම අවශ්‍ය කරන ඉතා වැදගත් සංරචක දෙකක් සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරනු පිණිස ය.

මුදල් අමාත්‍යවරයා වශයෙන් යහ පාලනය සඳහා ගනු ලබන පියවර ක්‍රියාත්මක වන බවට සහතික වනු පිණිස ඔබට ඉතා වැදගත් භූමිකාවක් ඉටු කිරීමට සිදු වනු ඇත්තේ, වචන ක්‍රියාවන් බවට හැරවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම අවශ්‍ය වන හෙයින් සහ, ඒ සඳහා ඇවැසි කාර්යභාරය ඉටු කළ යුතු ව තිබෙන්නේ ඔබේ අමාත්‍යාංශයෙන් වන හෙයිනි.

එවැනි අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම අවශ්‍ය වන ප්‍රධාන ක්ෂේත්‍රයන් දෙකක් වන්නේ,

1) රටේ පවතින් ඉතා ප්‍රාථමික ගණයේ පොලිස් ක්‍රමය, බොහෝ රටවල තිබෙන නූතන හැකියාවන් හා ගුණාත්මයන්ගෙන් සමන්විත පොලිස් ක්‍රමයක් බවට නවීකරණය කිරීම සඳහා ගනු ලබන පියවර

සහ

2) අල්ලස් හා දූෂණ වැළැක්වීම සඳහා වූ වැඩසටහනක් නියමාකාරයෙන් ක්‍රියාවට නැංවීම සඳහා, අද වන විට රටවල් ගණනාවක සාර්ථක ලෙස ක්‍රියාත්මක වන අන්දමේ අල්ලස් සහ දූෂණයට එරෙහි කොමිසමක් ස්ථාපිත කිරීම. මේ සඳහා එක් පිළිගත් ක්‍රමවේදයක් වන්නේ හොංකොංහි අල්ලසට එරෙහි ස්වාධීන කොමිසම (Independent Commission against Corruption (ICAC)) ය.

මේ කරුණු ද්විත්වය මඳක් සවිස්තරාත්මක ව පැහැදිලි කිරීමට මට ඉඩ දෙන්න.

1) පොලිසිය නවීකරණයට පියවර

බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ ස්ථාපිත කළ පොලිස් පද්ධතියේ මොඩලය පදනම් වී තිබෙන්නේ අයිරිෂ් පොලිස් හට ක්‍රමය මත බව ඔබ දන්නවා ඇත. මෙය, බ්‍රිතාන්‍යයේ හඳුන්වා දුන්, සම්මුතිය මත පාලනය වීමේ සංකල්පය මත පදනම් වූ ලන්ඩන් මෙට්‍රොපොලිටන් පොලිසියේ සිවිල් පොලිස් ක්‍රමයට වඩා මූලික වශයෙන් හමුදා ස්වභාවයේ පොලිස් ක්‍රමයක් විය. සිවිල් පොලිස් ක්‍රමයට අනුරූප ප්‍රතිසංස්කරණ දිගු කලකට පෙර ප්‍රංශයේ ද සිදු විය. සියලු සංවර්ධිත රටවල මේ මොඩලයන් නැවත නැවතත් භාවිත වෙමින් තිබේ. ඒ පරිණාමයන්ගේ අර්ථයෙන් ගත් විට ශ්‍රී ලංකාවේ පවතින පොලිසි ක්‍රමය ඉතා ප්‍රාථමික, නොදියුණු සහ බාල තත්ත්වයේ එකකි. පොලිස් ක්‍රමයට සිදු කරන මූලිකතම ප්‍රතිසංස්කරණවලින් තොර ව, නූතන දේශපාලන සන්දර්භය තුළ යහපාලනය සාක්ෂාත් කර ගැනීමට හැකි වන්නේ නැත.

ශ්‍රී ලංකා පොලිසියේ තත්ත්වය වැඩිදියුණු කිරීමට බලපාන තවත් එක් සාධකයක් වූයේ 1971 වර්ෂයේ පටන් ශ්‍රී ලංකාවේ

ඇති වූ කැරලිකාර තත්ත්වයන් ය. ඒ කැරලිකාර තත්ත්වයන් මැඩපැවැත්වීම සඳහා මේ කාලපරිච්ඡේදවල දී පොලිසිය හමුදා ක්‍රියාවන් සඳහා යොදා ගත් අතර, ශ්‍රී ලංකා සන්දර්භය තුළ අවාසනාවන්ත ලෙස එය බලහත්කාරයෙන් සිදු කරන අතුරුදන්වීම්, අධිකරණමය නොවන ලෙස සිදු කරන ඝාතන, වධහිංසාව සහ අවමන් සහගත සැලකිලි භාවිතය සහ සෙසු නීති විරෝධී ක්‍රම යොදා ගැනීම බවට පත් විය. සියලු මහජන ආයතන විධායක ජනාධිපතිවරයාගේ පාලනය යටතට ගෙන ආ සහ එමඟින් පොලිස් ආයතනයේ අභ්‍යන්තර පාලනය ද, පොලිස්පතිවරයා හා ඔහුගේ නියෝජ්‍යයන් විසින් පවත්වා ගෙන යා යුතු විධාන ව්‍යුහය ද විනාශ කර දැමූ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දේශපාලනමය ස්වභාවය හේතුවෙන් මේ තත්ත්වය තවත් නරක අතට හැරුණේ ය. මේ හානිය යථා තත්ත්වයට පත් කිරීම ශ්‍රී ලංකා පොලිසිය නූතන සිවිල් පොලිස් ක්‍රමයක කාර්යයන් සඳහා සුදුසු තත්ත්වයට පත් කිරීමේ දී අත්හළ නොහැකි කොටසකි.

1946 සූට්ස් විනිසුරු කොමිසම මඟින්, ශ්‍රී ලංකාවේ පොලිස් ක්‍රමය නිර්මාණය වූයේ සහ පවත්වා ගෙන යන්නේ හමුදා ක්‍රමයට බව පිළිගත්තේ ය. කෙසේ නමුත් අවාසනාවට මෙන්, යෝජනා කළ ප්‍රතිසංස්කරණ කිසි දා ක්‍රියාත්මක වූයේ නැත. අනතුරුව 1970 බස්නායක විනිසුරු කොමිසම සහ 1995 ජයලත් විනිසුරු කොමිසම මඟින් ද ප්‍රතිසංස්කරණ යෝජනා කෙරිණි. ගතවූ සියවසේ අවසන් දශකයන්හි දී නිර්මාණය වූ දේශපාලන තත්ත්වයන් හේතුවෙන් විය යුතුය, කොමිෂන් සභාවන්ගෙන් සිදු කළ ඒ නිර්දේශ කිසිවක් ක්‍රියාවට නැංවුණේ නැත.

සිවිල් පොලිස් ක්‍රමයක් වෙත ළඟාවීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීම පිණිස නියම ව්‍යාපෘති හා වැඩසටහන් සිදු කිරීම ශ්‍රී ලංකාවේ සිවිල් සමාජයේ දායකත්වය සමඟ පොලිස් දෙපාර්තමේන්තුව සහ ආණ්ඩුවේ සෙසු අදාළ නියෝජිතායතන කළ යුතු කාර්යයන් වේ. ඒවා, ශ්‍රී ලංකා පුරවැසියන් සිය ජීවිත ආරක්ෂිත හා ස්ථාවර පරිසරයක ජීවත් වීමට හැකි කරවන, ඔවුන් සොයන වෙනසේ වඩාත් වැදගත් අංගයන් ය.

ආර්ථික සංවර්ධනයේ දැක්ම අනුව ද, නූතන සිවිල් පොලිස් ක්‍රමයක් සංස්ථාපනය කිරීම ඉතා මූලිකතම අවශ්‍යතාවන්ගෙන් එකක් ව පවතියි. දේශීය ව්‍යවසායකයන්ගේ ආරක්ෂාව සඳහා,

විදේශ ආයෝජන දිරිමත් කිරීම සඳහා මෙන් ම රජයේ ව්‍යවසායන් සඳහා ආචාර විධියක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් ද පොලිසිය විසින් සිදු කරන දායකත්වය කේන්ද්‍රීය වේ.

මේ සියල්ල සාක්ෂාත් කර ගැනීමට නම් මුදල් අමාත්‍යාංශයට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීමට සිදු වනු ඇති අතර, ඒ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමට අවශ්‍ය වනු ඇත. අතීතයේ සිදු වූ අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම්වල දී පොලිසිය නවීකරණය කිරීම සහ ශක්තිමත් කිරීම කිසිම ආකාරයකින් දිරිමත් කෙරුණේ නැත. ඉදිරි වසරවල දී මේ දැක්ම ළඟා කර ගැනීම සඳහා අවබෝධාත්මක දැක්මක් හා සම්පත් සැපයීම ඔබේ උර මත රැඳී පවතියි. යහපාලනය හා නීතියේ ආධිපත්‍යය සඳහා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ දැක්ම ක්‍රියාවට නැංවීමේ දී එවැනි වෙනස්කම් ඇති කරවීමේ වගකීම ඔබේ උර මත රැඳී පවතියි. මේ සඳහා අත්‍යවශ්‍ය අය වැය ප්‍රතිපාදන වෙන් කරනු ඇතැයි ද, ඉදිරි වසරවල දී මේවා සාක්ෂාත් කර ගැනීම සඳහා අවබෝධාත්මක දැක්මක් සපයනු ඇතැයි ද අපි ඒකාන්තයෙන් ම බලාපොරොත්තු වෙමු.

2. අල්ලස හා දූෂණයට එරෙහි සැබෑ කොමිසමක් පිහිටුවීම

නිදහසින් පසු යුගයේ දී ශ්‍රී ලංකාව අල්ලස හා දූෂණයට එරෙහි ව ඵලදායී කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා සැබෑ උත්සාහයක් කිසි විටෙක දරා තිබේ ද යන්න මතභේදයට තුඩුදෙන කාරණයකි. බ්‍රිතාන්‍යයන් පවා ශ්‍රී ලංකාව හැර දමා යන විට එවැනි පාලන යාන්ත්‍රණයක් පිහිටුවා ගෙන නොතිබිණි. කෙසේ නමුත් හොංකොංහි දී බ්‍රිතාන්‍යයන් කළේ වෙනත් දෙයකි. 1997 වසරේ බ්‍රිතාන්‍යයන් හොංකොංහි යටත් විජිත පාලනය අවසන් කරන විටත් ස්ථාවර, ස්ථාපනය කරන ලද ස්වාධීන කොමිෂන් සභාවක් (ICAC) තිබිණි. එය පිහිටුවීම සඳහා තීරණාත්මක පියවර 1974 වර්ෂයේ ගනු ලැබීමෙන් අනතුරුව වසර කිහිපයක් ඇතුළත එය සිය අරමුණ වෙත ළඟා විය. අද වන විට හොංකොං, අල්ලසෙන් තොර සමාජයක් බවට පත් ව තිබෙන අතර, හොංකොං රාජ්‍යය වෙත ස්ථාවරත්වය ලබා දෙන විශිෂ්ටතම හා විශාලතම ශක්තිය වී තිබෙන්නේ මේ ඵලදායී දූෂණ පාලන ක්‍රමවේදයයි. දූෂණය, සමාජයක් වඩාත් ම අස්ථාවර

කරන සාධකය බවත්, එයට නැවත හිස එසවීමට ඉඩ නොදිය යුතු බවත් අද වන විට හොංකොං වැසියන්ගේ ජන විඥානයට කිඳා බැස තිබේ. 1997 වසරේ හොංකොංහි දේශපාලන පරමාධිපත්‍යය චීනයට පවරා දුන්න ද, මේ ස්වාධීන කොමිසමේ ඵලදායීතාව තවමත් පවතින අතර, නියත වශයෙන් ම එය තව තවත් වැඩි දියුණු වෙමින් තිබේ. ICAC, ඉහළ ම නිලයන් දරන නිලධාරීන්ට සහ ධනවත් ම සමාගම් හිමිකරුවන්ට පවා නඩු පැවරීමට සමත් ය.

නැවත වරක්, දූෂණය අවසන් කිරීම සහ රාජපක්ෂ පවුලේ අතිමහත් දූෂණය හෙළා දැකීම අතර කතාව සහ සැබවින් ම ඵලදායී දූෂණ මර්දන ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා, ඵලදායී කොමිසමක් ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය අයවැය ප්‍රතිපාදන සැපයීම වැදගත් ය. ඵලදායී කොමිසමකට තමන්ගේ ම විමර්ශන පරාසයක් තිබිය යුතු අතර, එයින් අදහස් කරන්නේ පොලිස් නිලධාරීන් කොමිසමට අනියුක්ත කරමින් බඳවා ගැනීම නොකළ යුතු බවයි. මෙය හොංකොං ICAC හි සාර්ථකත්වයට ඉවහල් වී තිබෙන ඉතාමත් ම තීරණාත්මක සාධකයකි. දූෂණ මර්දන කොමිසමේ කාර්ය මණ්ඩලය ස්වාධීන නොවේ නම් සහ ඔවුන් පොලිසිය සමඟ සම්බන්ධ නම්, විමර්ශනයන් පිළිබඳ තොරතුරු පිටස්තරයන් අතට පත් වීම වැළැක්විය නොහැකි වේ. පොලිස් ක්‍රමය තුළ අල්ලස හා දූෂණය පාලනය කිරීම නීතියේ ආධිපත්‍යය සංස්ථාපනය කිරීමේ ප්‍රථම පියවර වන අතර, දූෂණ මර්දනය පෞද්ගලික අංශය ඇතුළත්ව සෙසු ක්ෂේත්‍රයන් වෙතට දීර්ඝ කිරීමේ දී ද එය ප්‍රථම පියවර වේ. කාර්යක්ෂම දූෂණ මර්දනයක් සඳහා තිබෙන තවත් අවශ්‍යතාවක් වන්නේ ඉහළ පුහුණුවක් ලද විමර්ශකයන් සහ වෝහාරික හා සෙසු තාක්ෂණික පහසුකම් ය. එයින් අදහස් වන්නේ ආණ්ඩුව විසින් අයවැය ප්‍රතිපාදන හරහා සැලකිය යුතු ආයෝජනයක් නොකරන්නේ නම් මෙවැනි කොමිසමක් පිහිටුවිය නොහැකි බව ය.

ඵලදායී දූෂණ මර්දනයක් සඳහා අවශ්‍ය සියලු සම්පත් දැන් ලෝකයේ තිබේ. අවශ්‍ය වන්නේ මේ පරිණාමනය ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික පියවර ගනිමින් එය ශ්‍රී ලංකාව සඳහා යොදා ගැනීමයි. එවැනි ප්‍රයෝගික පියවර සාක්ෂාත් කර ගැනීමට නම්, පුරසාරම හා සත්‍යය අතර වෙනස වටහා දිය හැක්කේ මුදල්

අමාත්‍යාංශයට පමණි. එය එසේ නොවුවහොත්, පූර්ව රෙජීමයේ ඔඩුදිවූ දූෂණ සම්ප්‍රදාය ඉදිරි වසරවල දී ද එසේ පැවතුණහොත් ඒ සඳහා දෝෂාරෝපණයෙන් කොටසක් මුදල් අමාත්‍යාංශයට ද ගැනීමට සිදු වනු ඇත. අනෙක් අතට මේ මහා කාර්යය ඉෂ්ට කළහොත්, එය මුදල් අමාත්‍යාංශයේ දේශපාලන කැමැත්ත හා ඉදිරි දැක්ම සම්බන්ධව ලැබෙන උසස් ම සම්මානය වනු ඇත.

ආසියානු මානව හිමිකම් කොමිසම වෙනුවෙන් මා මේ වැදගත් කරුණු ද්විත්වය සහ ඒවා සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය වන අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම, නව මුදල් අමාත්‍යාංශයේ මුල් අවධියේ දී ම මෙසේ අවධානයට ගෙන එන්නේ, දූෂණ මර්දනය කේන්ද්‍රීය අභිලාෂයක් බව ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ නව සන්ධානය විසින් නැවත නැවතත් තරයේ කියා ඇති හෙයිනි. මේ පොරොන්දුව නියම යථාර්ථයක් බවට පත් කර ගන්නේ කෙසේ ද යන්න ඉදිරි වසරවල දී දැක ගැනීමට හැකි වනු ඇත. ආසියානු මානව හිමිකම් කොමිසම තරයේ විශ්වාස කරන්නේ, ඔබගේ නායකත්වය යටතේ මුදල් අමාත්‍යාංශය සිය ශක්තිමත් දායකත්වය මේ සඳහා ලබා දෙනු ඇති බවයි. එවිට නිදහස ලද දා පටන් රටට අවශ්‍ය වී තිබෙන නූතන ආර්ථිකය සහ සමාජ හා සංස්කෘතික වෙනස ළඟා වේ.

පොලිසිය නවීකරණය කිරීමේ හා දූෂණය මර්දනය කිරීමේ ගැටලුව ආමන්ත්‍රණය නොකර සිටීම තෝරා ගන්නා ඕනෑ ම ආණ්ඩුවක් ඉතා ම ඉක්මනින් සිය බලය පවත්වා ගැනීම සඳහා මර්දනාකාරී පිළිවෙත්වලට ආපසු ගමන් කරන බව මානව හිමිකම් සංවිධානයක් වශයෙන් ආසියානු මානව හිමිකම් කොමිසම හොඳින් ම දනියි. මේ අනුව නව ආණ්ඩුව පොරොන්දු වී තිබෙන, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සියලු අනර්ථකාරී අංගයන් වෙනස් කිරීම ම, මෙකී වැදගත් අංගයන් ආමන්ත්‍රණය නොකරන්නේ නම් සාර්ථක කර ගත නොහැකි වේ. ආණ්ඩුව තෝරා පත් කර ගැනීමේ දී ඡන්දය ප්‍රකාශ කළ ඡන්ද දායක කොට්ඨාසයන්ට, බලහත්කාරයෙන් සිදු කරන අතුරුදන්වීම් ඇතුළත්ව අධිකරණයෙන් පිටත සිදු කරන ඝාතන අවසන් කිරීමටත්, පුළුල් ලෙස පැතිර පවත්නා වධහිංසාව හා අවමන් සහගත සැලකිලි නිමා කිරීමටත්, එසේ ම රටේ යුක්තික ක්‍රමයේ පවතින සියලු විකෘතීන් අවසන් කිරීමටත් අවශ්‍ය වේ. මේ අනුව, නැවත මර්දනය හා ප්‍රචණ්ඩකාරී සිදුවීම් සිදුවන්නට පටන් ගන්නා විට හුදු වශයෙන් විරෝධය දැක්වීම නොව, මර්දනයේ හා ප්‍රචණ්ඩත්වයේ මූල මට්ටමේ මූලාශ්‍රයන් ඉවත් කර දැමීම තිර කිරීමේ පියවර සඳහා ගනු ලබන මානව හිමිකම් පියවරවල ද එය අඛණ්ඩ සංරචකයකි. මෙහි දී, ඉහත කී අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී අපි ඔබගේ සම්පූර්ණ සහාය බලාපොරොත්තු වන්නෙමු. එවැනි පියවර සඳහා මහජන සහයෝගය සාක්ෂාත් කිරීමට අපි අපගේ උපරිමය ඉටු කරන්නෙමු.

මර්දනය හා ප්‍රචණ්ඩත්වය නිමා කිරීමේ දී සහ නීතියේ ආධිපත්‍යය හා සුළු ජන අයිතිවාසිකම් ද ඇතුළත්ව මානව හිමිකම්වල රාමුව තුළ හිඳ ආරාවුල් සමථකරණයේ ආචාර විධි නිර්මාණය කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ මූලික භූමිකාව සම්බන්ධයෙන් ඉදිරියේ දී අපි ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීමට උත්සාහ කරන්නෙමු.

සුළු ජාතීන් මුහුණ පාන ගැටලු අසාර්ථක දේශපාලන ක්‍රමෝපායයන්ගේ ප්‍රතිඵලයක් මිස, සුළුතරය හා බහුතරය අතර පවතින ආවේණික අරගලයන් නොවේ. විශේෂයෙන් ම 1978 ආණ්ඩුක්‍රමය මේ ගැටලුව ප්‍රජාතන්ත්‍රවාදී, රාමුවෙන් එපිටට තල්ලු කළ අතර, පරම අස්ථාවර භාවයක් නිර්මාණය කළේ ය. දැන්, නව ආණ්ඩුව විසින් 1978 ආණ්ඩුක්‍රමයේ නොමඟ යැම් අතීතයට අයත් දෙයක් වූ නව යුගයක් සඳහා ප්‍රතිඥා දෙමින් සිටින විට, ශ්‍රී ලංකාව තුළ ස්ථාවරත්වය, සාමය සහ සෞභාග්‍යය රාමුවක් නිර්මාණය කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අයවැය ආයෝජන ඇතුළත් ව, හුදු වචනවලින් නොව ප්‍රායෝගික ක්‍රමෝපායයන් වශයෙන් ඒ සඳහා දායකත්වය ලබා දෙන අන්දම දකින්නට අපි බලාපොරොත්තු වන්නෙමු.

මේ ගැටලු සම්බන්ධයෙන් සහයෝගය සහ සක්‍රිය ආධාරය ලබා දෙන බවට අපි සහතික වන්නෙමු.

ස්තුතියි.

මෙයට

විශ්වාසී,

බැසිල් ප්‍රනාන්දු

විකල්ප නොබෙල් ත්‍යාග ලාභී

ආසියානු මානව හිමිකම් කොමිසමේ ප්‍රතිපත්ති හා වැඩසටහන් අධ්‍යක්ෂ